# වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

# කාර්ය සාධන වාර්තාව - 2013

පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය

# මෙහෙවර

## "ශ්‍රී ලාංකික ප්‍රජාවගේ අභිවෘද්ධිය තහවුරු කරනු වස් වන සම්පත් සංරක්ෂණය සහ සංවර්ධනය කිරීම"

# පටුන


| | | පිටුව |
|---|---|---|
| 01 | හැඳින්වීම | 01 |
| 02 | සමාජ වන විද්‍යා සහ වන ව්‍යාප්ති අංශය | 02 |
| 03 | වන සංගණන හා කළමනාකරණ අංශය | 15 |
| 04 | පරිසර කළමනාකරණ අංශය | 37 |
| 05 | පර්යේෂණ සහ අධ්‍යාපන අංශය | 43 |
| 06 | වන ආරක්ෂණ සහ නීති ක්‍රියාත්මක කිරීමේ අංශය | 56 |
| 07 | සැලසුම් සහ ප්‍රගති පාලන අංශය | 61 |
| 08 | මානව සම්පත් කළමනාකරණ, පරිපාලන සහ ආයතනික සංවර්ධන | 65 |
| 09 | මුදල් අංශය | 68 |

**වගු ලැයිස්තුව**


| | | | පිටුව |
|---|---|---|---|
| 1. | වගුව 1.1 | බීජ පැල නිෂ්පාදනය | 03 |
| 2. | වගුව1.2 | දැනුවත් කිරීමේ සහ ප්‍රචාරණ වැඩ සටහන් | 04 |
| 3. | වගුව1.3 | රුක් රෝපණ ක්‍රියාකාරකම් | 04 |
| 4. | වගුව1.4 | නව ගොවි වන වගා ස්ථාපනය කිරීම | 05 |
| 5. | වගුව1.5 | 2012/2011/2010 වසර වල ස්ථාපනය කරන ලද ගොවි වන වගා කළමනාකරණය | 06 |
| 6. | වගුව 1.6 | ගෙවතු සංවර්ධනය සහ ශාක කළමනාකරණය කිරීම | 05 |
| 7. | වගුව 1.7 | තෝරාගත් වැඩසටහන් ප්‍රදේශ සංඛ්‍යාව | 08 |
| 8. | වගුව 1.8 | ප්‍රජා වන කළමනාකරණ වැඩසටහන් ප්‍රදේශ - දිසා අනුව | 08 |
| 9. | වගුව 1.9 | ප්‍රජා මූල සංවිධාන පිහිටුවීම සහ ලියාපදිංචිය | 09 |
| 10. | වගුව 1.10 | වනාන්තර සංවර්ධන කටයුතු | 09 |
| 11. | වගුව1.11 | ජීවනෝපාය වැඩි දියුණු කිරීම සඳහා වූ පුහුණු වීම් | 10 |
| 12. | වගුව1.12 | ධාරිතා වර්ධන පුහුණු වැඩසටහන් | 11 |
| 13. | වගුව1.13 | ගෙවතු සංඛ්‍යාව සහ ශාක කළමනාකරණ වැඩසටහන් සංඛ්‍යාව ( ශ්‍රී ලංකා ප්‍රජා වන කළමනාකරණ වැඩසටහන) | 11 |
| 14. | වගුව1.14 | දේශීය පුහුණුවීම් | 12 |
| 15. | වගුව1.15 | විදේශීය පුහුණුවීම් | 12 |
| 16. | වගුව1.16 | සුළු පරිමාණ පුද්ගලික ඉඩම් හිමියන් සඳහා පුද්ගලික වන වගා වැඩසටහන | 14 |
| 17. | වගුව 2.1 | නැවත වන වගා කිරීමේ වැඩසටහන -2013 | 18 |
| 18. | වගුව 2.2 | බීජ පැල නිෂ්පාදනය - 2013 | 19 |
| 19. | වගුව 2.3 | නොමේරූ වන වගා නඩත්තු කිරීම - 2013 | 20 |
| 20. | වගුව 2.4 | පූර්ව වාණිජමය තුනී කිරීම් – 2013 | 21 |
| 21. | වගුව 2.5 | වාණිජමය තුනී කිරීම් - 2013 | 22 |
| 22. | වගුව2.6 | පශ්චාත් හෙළීම් සංගණනය– 2013 | 23 |
| 23. | වගුව 2.7 | රිකිලි නඩත්තු කිරීම – 2013 | 23 |
| 24. | වගුව 2.8 | රිකිලි කළමනාකරණය – 2013 | 23 |
| 25. | වගුව 2.9 | ශුද්ධ කිරීම - 2013 | 24 |
| 26. | වගුව 2.10 | ආරෝහක කැපීම- 2013 | 24 |
| 27. | වගුව 2.11 | කප්පාදු කිරීම – 2013 | 24 |
| 28. | වගුව 2.12 | මැහෝගනී වන වගා කළමනාකරණය කිරීම - 2013 | 25 |
| 29. | වගුව 2.13 | GPS සහ ප්‍රිස්මේන්තු කොම්පාසු උපයෝගී කර ගනිමින් සිදු කරන ලද වන වගා වල මිණුම් 2013 | 25 |
| 30. | වගුව 2.14 | ස්වාරක්ෂක කලාපීය වන වගා ස්ථාපනය කිරීම- 2013 | 26 |
| 31. | වගුව 2.15 | ස්වාරක්ෂක කලාපීය වන වගා නඩත්තු කිරීම- 2013 | 26 |
| 32. | වගුව 2.16 | පරිහානියට පත් වන වගා පුනරුත්ථාපනය කිරීම– 2013 | 26 |
| 33. | වගුව 2.17 | පරිහානියට පත් වන වගා නඩත්තු කිරීම – 2013 | 27 |
| 34. | වගුව 2.18 | සුපෝෂණ වන වගා ස්ථාපනය කිරීම– 2013 | 27 |
| 35. | වගුව 2.19 | සුපෝෂණ වන වගා නඩත්තු කිරීම- 2013 | 27 |
| 36. | වගුව 2.20 | මිණුම් කිරීම සහ මායිම් සලකුණු කිරීම- 2013 | 27 |
| 37. | වගුව 2.21 | ස්වභාවික වනාන්තර මිණුම් කිරීම - 2013 | 28 |
| 38. | වගුව 2.22 | මධ්‍යම කඳුකරයේ කඳු මුදුන් සංරක්ෂණය කිරීම - 2013 | 29 |
| 39. | වගුව 2.23 | මධ්‍යම කඳුකරයේ කඳු මුදුන්හි 2012 වසරේදී ස්ථාපනය කරන ලද වන වගා නඩත්තු කිරීම. | 29 |
| 40. | වගුව 2.24 | මධ්‍යම කඳුකරයේ කඳු මුදුන්හි 2011 වසරේදී ස්ථාපනය කරන ලද වන වගා නඩත්තු කිරීම. | 29 |
| 41. | වගුව 2.25 | මධ්‍යම කඳුකරයේ කඳු මුදුන්හි 2010 වසරේදී ස්ථාපනය කරන ලද වන වගා නඩත්තු කිරීම. | 30 |

| | | | |
|---|---|---|---|
| 42. | වගුව 2.26 | වන වගාවල මාර්ග නඩත්තු කිරීම - 2013 | 30 |
| 43. | වගුව 2.27 | 2013 වසරේදී බදු දුන් ඉඩම් ප්‍රමාණය සහ බදු ආදායම | 31 |
| 44. | වගුව 2.28 | 2013 වසරේ පුද්ගලික අංශයේ නැවත වන වගා කිරීමේ වැඩසටහනේ තත්වය | 31 |
| 45. | වගුව 2.29 | සංචාරක බංගලා වලින් ලද ආදායම 2013 | 33 |
| 46. | වගුව 2.30 | වන සංගණන හා කළමනාකරණ අංශයේ මූල්‍යමය ප්‍රගතිය - 2013 | 35 |
| 47. | වගුව 2.31 | වන සම්පත් වලින් ලද ආදායම – 2013 | 36 |
| 48. | වගුව3.1(අ) | උඩවත්ත කැලය නැරඹීමට පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාව සහ ලද ආදායම | 38 |
| 49. | වගුව3.1(ආ) | නකල්ස් (ඩීන්ස්ටන්) වෙත පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාව සහ ලද ආදායම | 39 |
| 50. | වගුව3.1(ඇ) | නකල්ස් (පිටවලපතන) වෙත පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාව සහ ලද ආදායම | 39 |
| 51. | වගුව3.1(ඈ) | සිංහරාජය (පිටදෙනිය) වෙත පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාව සහ ලද ආදායම | 39 |
| 52. | වගුව3.1(ඉ) | සිංහරාජය (කුඩව) වෙත පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාව සහ ලද ආදායම | 39 |
| 53. | වගුව3.1(ඊ) | හුරුළු පාරිසරික උද්‍යානය වෙත පැමිණි සංචාරකයින් සංඛ්‍යාව සහ ලද ආදායම | 40 |
| 54. | වගුව3.1(උ) | කොට්ටව සංරක්ෂණ මධ්‍යස්ථානය වෙත පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාව සහ ලද ආදායම | 40 |
| 55. | වගුව3.1(ඌ) | කන්නෙලිය සංරක්ෂණ මධ්‍යස්ථානය වෙත පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යා සහ ලද ආදායම | 40 |
| 56. | වගුව 3.2 | අනුමත කල ව්‍යාපෘති ලැයිස්තුව | 41 |
| 57. | වගුව 3.3 | නකල්ස් සංරක්ෂණ වනාන්තරය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම | 42 |
| 58. | වගුව 4.1 | සේවයේ නිරත නිලධාරින් හට ලබාදුන් පුහුණු වැඩසටහන් – 2013 | 52 |
| 59. | වගුව 4.2 | කෙටි කාලීන පුහුණු වැඩසටහන් – 2013 | 53 |
| 60. | වගුව 5.1 | හදිසි වැටලීම් අංශයේ ප්‍රගතිය | 58 |
| 61. | වගුව 5.2 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තු අරමුදලේ මූල්‍යමය ප්‍රගතිය | 59 |
| 62. | වගුව 6.1 | ඒකාබද්ධ අරමුදල උපයෝගි කර ගනිමින් ඉදිකල ගොඩනැගිලි පිළිබද තොරතුරු - 2013 | 62 |
| 63. | වගුව 6.2 | 2013 වසර තුල ගොඩනැගිලි ඉදිකිරීම හා සම්බන්ධ මූල්‍යමය කාර්ය සාධනය | 62 |
| 64. | වගුව 6.3 | වර්ෂ 2013 තුල නඩත්තු කරන ලද ගොඩනැගිලිවල තොරතුරු | 63 |
| 65. | වගුව 6.4 | ගොඩනැගිලි නඩත්තුව - මූල්‍යමය ප්‍රගතිය - 2013 | 64 |
| 66. | වගුව7.1 | දෙපාර්තමේන්තු සේවක විස්තර | 65 |
| 67. | වගුව 8.1 | දෙපාර්තමේන්තු අය වැය ප්‍රගතිය | 68 |
| 68. | වගුව 8.2 | රාජ්‍ය සේවකයින්ගේ අත්තිකාරම් ගිණුම් පිළිබඳ තොරතුරු- 28301 | 69 |
| 69. | වගුව 8.3 | 2013 වසර තුල රැස් කල ආදායම | 70 |
| 70. | වගුව 8.4 | කැළෑ දෙපාර්තමේන්තුවේ අරමුදල් ගිණුම හා සම්බන්ධ ගණුදෙනුවල සාරාංශය | 70 |

**ඇමුණුම් ලැයිස්තුව**


| | | | පිටුව |
|---|---|---|---|
| 1. | ඇමුණුම: I | වන අපරාධ වල සාරාංශය ( උසාවිනඩු )- 2013 | 71 |
| 2. | ඇමුණුම: II | වන ආඥා පනතේ 30 වන වගන්තිය යටතේ සිදු කල වන අපරාධ - 2013 | 73 |
| 3. | ඇමුණුම: III | 2013 වසර තුලදී රාජසන්තක කල වාහන | 74 |
| 4. | ඇමුණුම: IV | 2013 වසර තුල ලියා පදිංචි වූ දැව පදනම් කරගත් නව ව්‍යාපාර | 77 |
| 5. | ඇමුණුම: V | ක්‍රියාකාරීත්වයේ පවතින ලියාපදිංචි මුළු දැව ව්‍යාපාර සංඛ්‍යාව - 2013 | 78 |
| 6. | ඇමුණුම: VI | පුහුණු වැඩ සටහන් - 2013 | 79 |
| 7. | ඇමුණුම: VII | ත්‍යාග ගෙවීම් - 2013 | 80 |
| 8. | ඇමුණුම: VIII | බීජ පැල, බීජ, ශාක සහ ශාක කොටස් අපනයනය මගින් ලද ආදායම - එක්දින සේවය – 2013 | 81 |
| 9. | ඇමුණුම: IX | බීජ පැල, බීජ, ශාක සහ ශාක කොටස් අපනයනය මගින් ලද ආදායම - සාමාන්‍ය සේවය - 2013 | 81 |
| 10. | ඇමුණුම: X | ඉරූ දැව, ගෘහ භාණ්ඩ, අත්කම්, සෙල්ලම් බඩු සහ අගය එකතු කල දැව අපනයනය මගින් ලද ආදායම - එක්දින සේවය -2013 | 83 |
| 11. | ඇමුණුම: XI | ඉරූ දැව, ගෘහ භාණ්ඩ, අත්කම්, සෙල්ලම් බඩු සහ අගය එකතු කල දැව අපනයනය මගින් ලද ආදායම - සාමාන්‍ය සේවය-2013 | 84 |

# හැඳින්වීම

ජාතියේ සෞභාග්‍ය සහතික කිරීම සඳහා ශ්‍රී ලංකාවේ වන සම්පත් සංරක්ෂණය කොට සංවර්ධනය කිරීම, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මෙහෙවර වේ. මෙම මෙහෙවර සහතික කිරීම උදෙසා විවිධ ක්‍රියාකාරකම් 2013 වර්ෂය තුලදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. එම වර්ෂය තුල ක්‍රියාත්මක කරන ලද වැඩ කටයුතු පහත දක්වා ඇති අරමුණු කරා ළඟාවීමට විශාල වශයෙන් දායක විය.

- සමාජ සහ පාරිසරික ප්‍රතිලාභ තිරසාරව ලබා ගැනීම සහතික කිරීම සඳහා උපරිමවන ආවරණයක් සංරක්ෂණය කිරීම.
- රටේ දැව අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා හා දැව සැපයුම ඉහළ නැංවීම උදෙසා කාර්මික වනවගා ස්ථාපනය කිරීම සහ ඒවා කළමනාකරණය කිරීම.
- ජාතික වන ක්ෂේත්‍ර ප්‍රතිපත්තිය හා වන සංරක්ෂණ ආඥා පනතේ විධි විධාන වලට අනුකූලව වනාන්තරවල ආරක්ෂාව ශක්තිමත් කිරීම.
- රජයේත්, ප්‍රජාවගේත් පුද්ගලික අංශයේත් සහභාගිත්වයෙන් දේශයේ තුරු වැස්ම ඉහළ නැංවීම.
- පර්යේෂණ, අධ්‍යාපන සහ ව්‍යාප්ති යන අංශ ඔස්සේ ජාතික වන සම්පත් සංවර්ධනය සඳහා තාක්ෂණික සහයෝගය ලබාදීම.
- ප්‍රජා වන කළමනාකරණ වැඩ කටයුතු සංවර්ධනය කිරීම.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යාල මට්ටමේදී තාක්ෂණික අංශ 06 ක් යටතේ ක්‍රියාත්මක වේ. එනම්, සමාජ වන විද්‍යා සහ වන ව්‍යාප්ති ,වන සංගණන සහ කළමනාකරණ, පරිසර කළමනාකරණ, පර්යේෂණ සහ අධ්‍යාපන, වන ආරක්ෂණ සහ නීති ක්‍රියාත්මක කිරීම සහ සැලසුම් සහ ප්‍රගති පාලන යන අංශ වේ. මෙයට අමතරව දෙපාර්තමේන්තුවේ එදිනෙදා මූල්‍ය කළමනාකරණ සහ පරිපාලන කටයුතු පිළිවෙලින් මුදල් අංශය සහ පිරිස් සහ පාලන අංශය යන අංශ මගින් සිදු කරයි.

මෙම අංශ මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩ කටයුතු පිළිබඳව දීර්ඝ තොරතුරු විස්තරයක් ඉදිරියේ දක්වා ඇති පරිච්ඡේද මගින් විග්‍රහ කෙරේ. මෙම ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් අම්පාර, අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, ගාල්ල, ගම්පහ, හම්බන්තොට, කළුතර, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතලේ, මාතර, මොණරාගල, නුවරඑළිය, පොළොන්නරුව, පුත්තලම, රත්නපුරය, ත්‍රිකුණාමලය, වවුනියාව, මුලතිව්, මන්නාරම සහ කිලිනොච්චි යන ස්ථාන වල පිහිටි දිසාවන කාර්යාල මගින් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම දිසාවන්ගේ කටයුතු කොළඹ, රත්නපුරය, නුවරඑළිය සහ අනුරාධපුරය යන ස්ථාන වල ස්ථාපනය කර තිබෙන කළාප නියෝජ්‍ය වන සංරක්ෂක කාර්යාල මගින් අධීක්ෂණය කරනු ලැබේ.

මෙම දෙපාර්තමේන්තුවේ පුහුණු වැඩ සටහන් නුවරඑළියේ පිහිටි ශ්‍රී ලංකා වන විද්‍යාතනයේදී එහි අධ්‍යක්ෂ / නියෝජ්‍ය වන සංරක්ෂකගේ මූලිකත්වය යටතේ සිදු කරයි.

ප්‍රධාන පර්යේෂණ නිලධාරි විසින් පර්යේෂණ කටයුතු, අධීක්ෂණය කර සම්බන්ධීකරණය කරනු ලැබේ. මෙම කටයුතු කුඹල්පොල සහ බදුල්ල යන ස්ථාන වල පිහිටි පර්යේෂණ මධ්‍යස්ථාන ඔස්සේ ක්‍රියාත්මක වේ.

# 01 වන පරිච්ඡේදය
# සමාජ වන විද්‍යා සහ වන ව්‍යාප්ති අංශය

## 1.1 හැඳින්වීම

ජාතික මට්ටමේ ව්‍යාප්ති සහ දැනුවත් කිරීමේ වැඩ සටහන් මෙන්ම සියළුම සහභාගිත්ව සහ සමාජ වන විද්‍යා වැඩ සටහන් සංවර්ධනය සහ අධීක්ෂණය, ව්‍යාප්ති වැඩ සටහන් සැලසුම් කිරීම සහ ඒ සඳහා බීජ පැල නිෂ්පාදනය, පුහුණු හා ව්‍යාප්ති වැඩ සටහන් සඳහා අවශ්‍ය කරන මුද්‍රිත ද්‍රව්‍ය සැකසීම සහ අවට ප්‍රජාව සඳහා ප්‍රධාන මට්ටමේ ආදායම් උපදවන ව්‍යාපෘති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම යනාදී කටයුතුවල නිරතවීම සමාජ වන විද්‍යා සහ වන ව්‍යාප්ති අංශයේ වගකීම් වේ. මෙම අංශයට සහභාගිත්ව වන වගා සහ සහභාගිත්ව වන කළමනාකරණය සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සැකසීමද පැවරී තිබේ. ස්වභාවික වනාන්තර වල සිදු කරන ප්‍රජා වන කළමනාකරණ කටයුතු වල වගකීමද පැවරී තිබෙන්නේ සමාජ වන විද්‍යා සහ වන ව්‍යාප්ති අංශය වෙතය.

## 1.2 අංශයේ ප්‍රධාන කාර්ය භාරයන්

- මහජනයා සඳහා පොදු දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

- වන විද්‍යා සංවර්ධන වැඩසටහන් පිළිබඳව විවිධ පාර්ශ්ව කණ්ඩායම් වෙත ව්‍යාප්ති සේවාවන් සැපයීම.

- මහජනයා සම්බන්ධ කර ගන්නා විවිධ රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. ඒ යටතේ
  - ✓ ගෙවතු සංවර්ධනය.
  - ✓ සහභාගිත්ව සංරක්ෂණ රුක් රෝපණ වැඩසටහන්.
  - ✓ මාර්ග දෙපස රුක් රෝපණය කිරීමේ වැඩසටහන්.
  - ✓ වන වගා / කෘෂි වන වගා
  - ✓ බීජ පැල නිෂ්පාදනය යනාදී කාර්යයන් ඉටුකරේ.

- ස්වභාවික වන සම්පත් ආරක්ෂා කිරීමට සහ කළමනාකරණය කිරීමට සහභාගිත්ව වන කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## 1.3 ආයතනික සැකැස්ම

මෙම අංශය ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය වන සංරක්ෂකවරයෙකුගේ ප්‍රධානත්වය යටතේ ක්‍රියාත්මක වේ. අංශයේ ප්‍රධාන කාර්ය භාරයන් ඉටු කිරීම සඳහා සහකාර වන සංරක්ෂකවරයෙකු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය වන සංරක්ෂකට සහාය වේ. ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් සියල්ලම පාහේ කලාප නියෝජ්‍ය වන සංරක්ෂකවරුන්ගේ අධීක්ෂණය යටතේ දිසා වන කාර්යාල මගින් මෙහෙයවනු ලබයි.

## 1.4. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රාග්ධන වියදම් අයවැය යටතේ සිදු කරනු ලබන ක්‍රියාකාරකම්

### 1.4.1 බීජ පැළ සකස් කිරීම

වන ව්‍යාප්ති කටයුතු සඳහා අවශ්‍ය කරන බීජ පැල වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පැල තවාන්වල නිපද වන ලදී. 2013 වසරේ නිපදවන ලද සම්පූර්ණ බීජ පැල සංඛ්‍යාව 1,024,900 කි.

නිපදවන ලද සම්පූර්ණ බීජ පැල සංඛ්‍යාවෙන් බීජ පැල 80,891 ක් අලෙවි කරන ලද අතර 620,809 ක් රුක් රෝපන වැඩ සටහන් සඳහා අනෙකුත් රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනවලට නොමිලයේ ලබාදෙන ලදී. ඉතිරිය "දැයට සෙවණ" ජාතික රුක් රෝපණ වැඩ සටහන සහ ගෙවතු සංවර්ධන වැඩ සටහන් සඳහා යොදා ගන්නා ලදී. බීජ පැල නිෂ්පාදනය පිළිබඳ වැඩිදුර තොරතුරු වගුව 1.1 මගින් දැක්වේ.

වගුව 1.1 බීජ පැල නිෂ්පාදනය

| දිසාව | බීජ පැල නිෂ්පාදනය | අලෙවි කල සංඛ්‍යාව | නොමිලේ නිකුත් කල පැල සංඛ්‍යාව |
|---|---|---|---|
| කළුතර | 62,000 | 10,535 | 30,848 |
| ගම්පහ | 64,500 | 1,594 | 35,664 |
| කුරුණෑගල | 56,500 | 2,047 | 26,035 |
| පුත්තලම | 106,000 | 5,857 | 40,782 |
| රත්නපුරය | 96,150 | 14,512 | 73,196 |
| කෑගල්ල | 54,500 | 2,861 | 16,771 |
| ගාල්ල | 25,750 | 3,092 | 14,032 |
| මාතර | 22,000 | 1,749 | 27,330 |
| හම්බන්තොට | 33,500 | 1,055 | 10,509 |
| බදුල්ල | 29,000 | 687 | 14,228 |
| නුවරඑළිය | 46,000 | 1,324 | 34,415 |
| මහනුවර | 31,000 | 3,124 | 27,876 |
| මාතලේ | 20,500 | 1,337 | 18,345 |
| මොණරාගල | 32,000 | 1,509 | 31,222 |
| අම්පාර | 46,000 | 3,886 | 32,703 |
| අනුරාධපුරය | 42,000 | 6,028 | 34,872 |
| පොලොන්නරුව | 42,000 | 4,067 | 37,933 |
| ත්‍රිකුණාමලය | 47,000 | 535 | 34,426 |
| මඩකලපුව | 36,000 | 6,670 | 12,852 |
| වවුනියාව | 32,000 | - | 29,190 |
| මන්නාරම | 11,500 | 276 | 6,565 |
| මුලතිව් | 67,500 | 8,146 | 11,840 |
| කිලිනොච්චිය | 11,500 | - | 10,675 |
| යාපනය | 10,000 | - | 8,500 |
| **එකතුව** | **1,024,900** | **80,891** | **620,809** |

### 1.4.2 දැනුවත් කිරීමේ සහ ප්‍රචාරණ වැඩ සටහන්

අංක 1.2 වගුවේ දැක්වෙන දැනුවත් කිරීමේ සහ ප්‍රචාරණ වැඩ සටහන් අදාල කාල පරිච්ඡේදය තුල සිදු කරන ලදි.

**වගුව 1.2 දැනුවත් කිරීමේ සහ ප්‍රචාරණ වැඩ සටහන්**

| **වර්ගය** | **සංඛ්‍යාව** |
|---|---|
| දැනුවත් කිරීමේ වැඩ සටහන් | 615 |
| සම්මන්ත්‍රණ සහ වැඩමුළු | 703 |
| ප්‍රදර්ශන | 12 |
| වීඩියෝ දර්ශන | 165 |
| තරඟ සහ වෙනත් වැඩසටහන් | 600 |
| **එකතුව** | 2,095 |

### 1.4.3 සහභාගිත්ව රුක් රෝපණ වැඩ සටහන්

"දැයට සෙවණ" ජාතික රුක් රෝපණ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී තිබෙන ප්‍රධාන ආයතන අතුරින් එක් ආයතනයක් වන්නේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවයි. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ගොවීන් සහ අනෙකුත් ප්‍රජා කණ්ඩායම් සහභාගි කර ගනිමින් බීජ පැළ 249,900 ක් සිටුවා මේ සදහා දායකත්වය සපයන ලදී. මෙයට අමතරව, බීජ පැළ 400,000 ක් "දැයට සෙවන" වැඩසටහන යටතේ සිදුකරන පැල සිටුවීමේ කටයුතු වලට යොදා ගැනීම සදහා සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ලබාදෙන ලදී.

එයට අමතරව, වන ව්‍යාප්ති වැඩ සටහනේ වාර්ෂික වැඩ සැලැස්ම යටතේ පහත සඳහන් රුක් රෝපණ කටයුතු සිදු කරන ලදී. මෙම වැඩ සටහන් ප්‍රධාන වශයෙන් ඔක්තෝබර් 15 වන දින සිට නොවැම්බර් 30 දක්වා කාල පරිච්ඡේදය තුල සිදු කරන ලදී. වැඩිදුර තොරතුරු වගුව 1.3 යටතේ දක්වා ඇත.

**වගුව 1.3 රුක් රෝපණ ක්‍රියාකාරකම්**

| **ක්‍රියාකාරකම්** | **වැඩ සටහන් සංඛ්‍යාව** |
|---|---|
| මාර්ග දෙපස රුක් රෝපණය කිරීම | 17 |
| ජලාධාරවල සහ ගං ඉවුරුවල රුක් රෝපණය කිරීම | 07 |
| පාසැල්වල රුක් රෝපණය කිරීම | 181 |
| අනෙකුත් රජයේ ආයතන භූමිවල රුක් රෝපණය කිරීම | 193 |
| **එකතුව** | 398 |

### 1.4.4 නව ගොවි වන වගා ස්ථාපනය කිරීම

මෙම වර්ෂය තුල ගොවි වන වගා හෙක්ටයාර් 225 ක් ස්ථාපනය කරන ලදී. වැඩිදුර තොරතුරු වගුව 1.4 හි දැක්වේ.

**වගුව 1.4. නව ගොවි වන වගා ස්ථාපනය කිරීම**

| දිසාව | වන වගා (හෙක්) | සහභාගි වූ ගොවීන් සංඛ්‍යාව |
|---|---|---|
| අනුරාධපුරය | 10 | 34 |
| මාතලේ | 20 | 10 |
| අම්පාර | 37 | 62 |
| රත්නපුරය | 14 | 25 |
| බදුල්ල | 20 | 62 |
| පුත්තලම | 17 | 61 |
| මඩකලපුව | 05 | 10 |
| ත්‍රිකුණාමලය | 05 | 12 |
| වව්නියාව | 20 | 30 |
| හම්බන්තොට | 10 | 13 |
| මහනුවර | 01 | 05 |
| මන්නාරම | 16 | 32 |
| කිලිනොච්චි | 10 | 20 |
| මුලතිව් | 40 | 95 |
| **එකතුව** | **225** | **471** |

### 1.4.5. 2012/2011/2010 වසර වල ස්ථාපනය කරන ලද ගොවි වන වගා කළමනාකරණය කිරීම

මෙම වර්ෂය තුලදී ප්‍රජා වන වගා ව්‍යාපෘතිය සහ සහභාගිත්ව වන වගා ව්‍යාපෘතිය යටතේ ස්ථාපනය කරන ලද ගොවි වන වගා හෙක්ටයාර් 477.9 ක් විද්‍යාත්මකව කළමනාකරණය කරන ලදී. වැඩිදුර තොරතුරු වගුව 1.5 හි දැක්වේ.

**වගුව 1.5 2012/2011/2010 වසර වල ස්ථාපනය කරන ලද ගොවි වන වගා කළමනාකරණය**

| දිසාව | වන වගාවේ ප්‍රමාණය (හෙක්.) |
|---|---|
| රත්නපුරය | 30.0 |
| බදුල්ල | 55.0 |
| මහනුවර | 08.0 |
| නුවරඑළිය | 26.00 |
| අනුරාධපුරය | 143.4 |
| පොලොන්නරුව | 35.0 |
| අම්පාර | 160.0 |
| කුරුණෑගල | 20.5 |
| **එකතුව** | **477.9** |

**1.4.6 ගෙවතු සංවර්ධනය කිරීම**

ගෙවතු 7006 ක් සඳහා බීජ පැල සපයාදීමෙන් සහ තාක්ෂණික සහය ලබාදීමෙන් සංවර්ධනය කරන ලදි. ශාක කළමනාකරණය කිරීමේ වැඩසටහන් 262 ක් ක්‍රියාත්මක කරන ලදි. .වැඩිදුර තොරතුරු වගුව 1.6 මගින් දැක්වේ.

**වගුව 1.6 ගෙවතු සංවර්ධනය සහ ශාක කළමනාකරණය කිරීම**

| දිසාව | සංවර්ධනය කරන ලද ගෙවතු සංඛ්‍යාව | ශාක කළමනාකරණ වැඩසටහන් ගණන |
|---|---|---|
| අනුරාධපුරය | 150 | 10 |
| පොලොන්නරුව | 100 | 5 |
| අම්පාර | 250 | 10 |
| කුරුණෑගල | 290 | 10 |
| මාතලේ | 440 | 20 |
| නුවරඑළිය | 471 | 15 |
| බදුල්ල | 400 | 12 |
| මහනුවර | 325 | 10 |
| ගම්පහ | 600 | 20 |
| පුත්තලම | 230 | 10 |
| රත්නපුරය | 400 | 10 |
| ගාල්ල | 350 | 10 |
| කෑගල්ල | 240 | 10 |
| මොණරාගල | 200 | 10 |
| මඩකලපුව | 75 | 5 |

| දිසාව | සංවර්ධනය කරන ලද ගෙවතු සංඛ්‍යාව | ශාක කළමනාකරණ වැඩසටහන් ගණන |
|---|---|---|
| වව්නියාව | 25 | 3 |
| ත්‍රිකුණාමලය | 400 | 5 |
| හම්බන්තොට | 1140 | 15 |
| මාතර | 195 | 08 |
| කළුතර | 435 | 51 |
| මන්නාරම | 80 | 05 |
| කිලිනොච්චි | 60 | 05 |
| මුලතිව් | 100 | 02 |
| යාපනය | 50 | 01 |
| **එකතුව** | **7006** | 262 |

### 1.4.7 වන ව්‍යාප්ති කටයුතු සඳහා අවශ්‍ය කරන මුද්‍රිත ද්‍රව්‍ය සැකසීම.

අදාළ වර්ෂය තුලදී "KDN" වනාන්තර සන්තතිය නමින් නව ග්‍රන්ථයක් මුද්‍රණය කරන ලදි. මෙයට අමතරව, එක් රුක් සගරාවක් සහ "අපේ විත්ති" කලාප දෙකක් ප්‍රකාශයට පත් කරන ලදි.

## 1.5 ප්‍රජා වන කළමනාකරණ වැඩසටහන

ශ්‍රී ලංකාවේ වියලි සහ අතර මැදි කලාපවල දිස්ත්‍රික්ක 15 ක 2012 වසරේ ඔක්තෝබර් මාසයේදී ශ්‍රී ලංකා ප්‍රජා වන කළමනාකරණ වැඩ සටහන ආරම්භ කරන ලදි. මෙම වැඩ සටහන ඕස්ට්‍රේලියානු රජයේ විදේශ කටයුතු සහ වෙළඳාම පිළිබද දෙපාර්තමේන්තුවේ මූල්‍යාධාර යටතේ ක්‍රියාත්මක වන අතර එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන මගින් අවශ්‍ය කරන තාක්ෂණික සහාය ලබාදීම සහ ආධාර සම්ප්‍රේෂණය සිදු කරයි . මෙම වැඩ සටහනේ ප්‍රධාන අරමුණ වන්නේ වනාන්තර අවට ප්‍රජාවගේ දිවි පෙවෙතට උපකාරීවීම සඳහා ස්වාභාවික සම්පත් කළමනාකරණය වැඩි දියුණු කිරීම සහ ශ්‍රී ලංකාවේ වියළි සහ අතරමැදි කලාප වල දිළිදු බව තුරන් කිරීම සඳහා දායකත්වය සැපයීමයි.

මෙම වැඩසටහනේ ප්‍රධාන සංරචක දෙකක් තිබේ. ඉන් එක් සංරචකයක් ලෙස වන කළමනාකරණය සඳහා ප්‍රජා සහභාගීත්වය ලබාගෙන එමගින් වන හරණය සහ වනාන්තර පරිහානිය අවම කිරීම දැක්විය හැකිය. අනෙක් සංරචකය වන්නේ, වන සංරක්ෂණ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ ප්‍රජා වන කළමනාකරණ ප්‍රවේශය පිලිබඳ දැනුම වැඩි දියුණු කර එමගින් මෙම වැඩ සටහනේ අරමුණුවලට දායකවීමයි.

### 1.5.1 ක්ෂේත්‍ර ක්‍රියාකාරකම්

#### 1.5.1.1 වැඩ සටහන් ප්‍රදේශ තෝරා ගැනිම

2013 වසරේදී දිස්ත්‍රික්ක 17 ක් ආවරණය කරමින් වැඩසටහන් ප්‍රදේශ 107 ක මෙම වැඩ සටහන ක්‍රියාත්මක කරන ලදි. එම වැඩසටහන් ප්‍රදේශ අතුරින් ප්‍රදේශ 64 ක් 2013 වසරේදී තෝරා ගන්නා ලද අතර අනෙකුත් වැඩසටහන් ප්‍රදේශ 2010, 2011 සහ 2012 වසර වලදි තෝරා ගන්නා ලදී. එක් එක් වර්ෂයේදී තෝරාගත් වැඩසටහන් ප්රදේශ සංඛ්‍යාව වගුව 1.7 හා 1.8 මගින් දක්වා තිබේ.

වගුව 1.7 තෝරාගත් වැඩ සටහන් ප්‍රදේශ සංඛ්‍යාව

| වර්ෂය | තෝරාගත් ස්ථාන සංඛ්‍යාව |
|---|---|
| 2010 | 14 |
| 2011 | 03 |
| 2012 | 26 |
| 2013 | 64 |
| **එකතුව** | **107** |

වගුව 1.8 ප්‍රජා වන කළමනාකරණ වැඩ සටහන් ප්‍රදේශ - දිසා අනුව

| කලාපය | දිසාව | 2013 | 2012 | 2011 | 2010 | එකතුව |
|---|---|---|---|---|---|---|
| රත්නපුරය | රත්නපුරය | 6 | 2 | - | - | **8** |
| | හම්බන්තොට | 2 | 1 | - | - | **3** |
| | | | | | | **11** |
| අනුරාධපුරය | අනුරාධපුරය | 4 | 3 | - | 4 | **11** |
| | පොළොන්නරුව | 6 | 2 | - | - | **8** |
| | ත්‍රිකුණාමලය | 1 | 1 | - | - | **2** |
| | වවුනියාව | 1 | 1 | - | - | **2** |
| | මුලතිව් | 2 | - | - | - | **2** |
| | මන්නාරම | 2 | - | - | - | **2** |
| | අම්පාර | 7 | 2 | 2 | 1 | **12** |
| | මඩකලපුව | 2 | 1 | - | - | **3** |
| | | | | | | **42** |
| කොළඹ | පුත්තලම | 7 | 1 | 1 | 2 | **11** |
| | කුරුණෑගල | 5 | 1 | - | 3 | **9** |
| | | | | | | **20** |
| නුවරඑළිය | බදුල්ල | 6 | 4 | - | - | **10** |
| | මාතලේ | 3 | 3 | - | 4 | **10** |
| | මොණරාගල | 5 | 3 | - | - | **8** |
| | මහනුවර | 2 | 1 | - | - | **3** |
| | නුවරඑළිය | 3 | - | - | - | **3** |
| | | | | | | **34** |
| **එකතුව** | | **64** | **26** | **3** | **14** | **107** |

#### 1.5.1.2 කළමනාකරණ සැළසුම් සකස් කිරීම

ප්‍රජා වන කළමනාකරණ සැළසුම්, වනාන්තර සංවර්ධනය , වනාන්තර අවට ප්‍රජාවගේ ආදායම් උත්පාදනය, යටිතල පහසුකම් සංවර්ධනය සහ සමාජ සේවා සහ ප්‍රජා මූල සංවිධානවල සාමාජිකයින්ගේ ධාරිතා වර්ධනය කිරීම යන ක්‍රියාකාරකම් යටතේ ක්‍රියාත්මක වේ. මෙම වර්ෂය තුලදී කළමනාකරණ සැළසුම් 90 ක් සම්පූරණ කරන ලදි.

#### 1.5.1.3 ප්‍රජා මූල සංවිධාන ලියාපදිංචිය

මෙම වර්ෂය තුලදී ප්‍රජාමූල සංවිධාන 90 ක් පිහිටුවන ලද අතර ඒවායේ ලියාපදිංචියද සිදු කරන ලදි. ප්‍රජා මූල සංවිධානවල ස්ථාපනය සහ ලියාපදිංචිය පිළිබද වැඩිදුර තොරතුරු වගුව 1.9 මගින් දැක්වේ.

**වගුව 1.9 ප්‍රජා මූල සංවිධාන පිහිටුවීම සහ ලියාපදිංචිය**

| වසර | ස්ථාපනය කරන ලද ප්‍රජා මූල සංවිධාන සංඛ්‍යාව | ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ලියාපදිංචි කරන ලද ප්‍රජා මූල සංවිධාන සංඛ්‍යාව |
|---|---|---|
| 2012 | 26 | 26 |
| 2013 | 64 | 64 |
| **එකතුව** | **90** | **90** |

#### 1.5.1.3 වන විද්‍යා සංවර්ධන කටයුතු

මෙම වර්ෂය තුලදී කෘෂි වන වගා හෙක්ටයාර 322.1ක් ස්ථාපනය කරන ලදී. තවද පෝෂණීය වන වගා හෙක්ටයාර 345.2 ක් සහ ස්වාරක්ෂක කලාප හෙක්ටයාර 159.5 ක්ද ස්ථාපනය කරන ලදි. මෙම වන වගා ප්‍රජා සහභාගිත්වයෙන් සිදු කර ඇත. සහභාගීත්ව වන වගා කිරීම පිලිබද තොරතුරු වගුව 1.10 මගින් දැක්වේ.

**වගුව 1.10 වනාන්තර සංවර්ධන කටයුතු**

| අංකය | දිසාව | කෘෂි වන වගා ස්ථාපනය (හෙක්) | පෝෂණීය වන වගා ස්ථාපනය (හෙක්) | ස්වාරක්ෂක කලාපීය වන වගා ස්ථාපනය (හෙක්) |
|---|---|---|---|---|
| 1 | කුරුණෑගල | 3.0 | 24.7 | 2.0 |
| 2 | මාතලේ | 8.0 | 33.3 | 17.5 |
| 3 | පුත්තලම | 59.0 | - | - |
| 4 | අනුරාධපුර | 44.9 | 69.7 | 26.5 |
| 5 | මොණරාගල | 20.0 | 34.0 | 29.0 |
| 6 | බදුල්ල | 25.5 | 32.5 | 5.0 |
| 7 | අම්පාර | 15.0 | 59.5 | 16.5 |
| 8 | පොළොන්නරුව | 15.0 | 23.0 | 22.0 |
| 9 | රත්නපුර | 86.2 | 11.0 | 5.0 |
| 10 | ත්‍රිකුණාමලය | 7.0 | 4.0 | 3.0 |
| 11 | මඩකලපුව | 10.00 | 4.0 | 6.0 |
| 12 | වවුනියාව | - | 10.0 | 10.0 |
| 13 | හම්බන්තොට | 20.00 | 10.0 | 5.0 |
| 14 | නුවරඑළිය | 2.5 | 4.0 | 4.0 |
| 15 | මහනුවර | - | 10.0 | - |

| අංකය | දිසාව | කෘෂි වන වගා ස්ථාපනය (හෙක්) | පෝෂණිය වන වගා ස්ථාපනය (හෙක්) | ස්වාරක්ෂක කලාපීය වන වගා ස්ථාපනය (හෙක්) |
|---|---|---|---|---|
| 16 | මන්නාරම | 2.0 | 11.5 | - |
| 17 | මුලතිව් | 4.0 | 4.0 | 8.0 |
| | **එකතුව** | **322.1** | **345.2** | **159.5** |

### 1.5.1.4 ආදායම් උපදවන ක්‍රියාකාරකම්

ප්‍රජා වන කළමනාකරණ වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ප්‍රධාන ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් ලෙස ප්‍රජාවගේ ජීවනෝපාය වැඩි දියුණු කිරිම සදහා ප්‍රජාවට විවිධ පුහුණුවීම්, ද්‍රව්‍යාධාර සහ තාක්ෂණික දැනුම ලබා දීම සිදු කරයි. ප්‍රජාවට සපයන ප්‍රධාන පුහුණුවීම් අතර සත්ව පාලනය, මීමැසි පාලනය, ගම්මිරිස් වගාවට අවශ්‍ය කරන තාක්ෂණික ක්‍රමවේදයන්, බිම්මල් වගාව සහ තවාන් කළමනාකරණය යන ඒවාට අමතරව මැහුම්, තල්කොල යොදාගෙන කුඩා සැකසීම, යෝගට් නිෂ්පාදනය, රස කැවිලි නිෂ්පාදනය යනාදී අනෙකුත් අංශවල පුහුණුවීම්ද ලක්ෂා පුහුණුවීම් හා ස්ටිකර් නිෂ්පාදනය පිළිබද පුහුණුවීම් ද පැවැත්විණි. ජීවනෝපාය වැඩිදියුණු කිරිම සදහාවු පුහුණුවීම් පිළිබද වැඩිදුර තොරතුරු වගුව 1.11 මගින් දැක්වේ.

**වගුව 1.11 ජීවනෝපාය වැඩිදියුණු කිරිම සදහා වු පුහුණු වීම්**

| **පුහුණුවේ නම** | **පුහුණුවීම් සංඛ්‍යාව** |
|---|---|
| සත්වපාලනය | 45 |
| මීමැසි පාලනය | 29 |
| ගම්මිරිස් වගාවේ තාක්ෂණික ක්‍රම | 10 |
| බිම්මල් වගාව | 9 |
| තවාන් කළමනාකරණය | 15 |
| අනෙකුත් පුහුණුවීම් | 12 |

### 1.5.1.5 යටිතල පහසුකම් සංවර්ධනය හා සමාජ සේවාවන්

දිස්ත්‍රික්ක 15 ක ප්‍රජා ශාලා ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු අවසන් කර ඇත. දිස්ත්‍රික්ක 5 ක ප්‍රවේශ මාර්ග කි.මී.14 ක් පිළිසකර කර ඇත. දිස්ත්‍රික්ක 4 ක වාරි ජල ටැංකි 7 ක ප්‍රතිසංස්කරණ කටයුතු සහ එක් අමුණක ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කරන ලදි.

### 1.5.1.6 ප්‍රජා මුල සංවිධානවල සාමාජිකයින්ගේ ධාරිතා වර්ධනය කිරිම

වන සරක්ෂණ දෙපාර්තමේන්තුවේ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩ සටහන් හරහා පුහුණුවීම් සපයාදෙමින් ප්‍රජා මුල සංවිධානවල හැකියාව වර්ධනය කරන ලද අතර. මේ සදහා උපාධිධාරීන් සහ රාජ්‍ය අංශයට අනුයුක්ත සම්පත් දායකයින් යොදා ගන්නා ලදි. නායකත්ව පුහුණුව, රැස්වීම් පැවැත්වීම, මූල්‍ය කළමනාකරණය සහ පොත් තැබීම යන අංශවල පුහුණුවීම් ප්‍රජා මුල සංවිධානවල සාමාජිකයින් හට ලබාදෙන ලදී. ධාරිතා වර්ධන පුහුණු වැඩසටහන් පිළිබද වැඩිදුර තොරතුරු වගුව 1.12 මගින් දැක්වේ.

වගුව 1.12 ධාරිතා වර්ධන පුහුණු වැඩසටහන්

| පුහුණුවේ නම | පුහුණුවීම් සංඛ්‍යාව | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|
| නායකත්ව පුහුණුව | 53 | 1088 |
| රැස්වීම් පැවැත්වීම | 24 | 373 |
| මූල්‍ය කළමනාකරණය | 14 | 260 |
| පොත් තැබීම | 15 | 253 |

### 1.5.1.7 ගෙවතු වගා සංවර්ධන වැඩ සටහන

දිස්ත්‍රික්ක 17 ක සියලුම ප්‍රජා වන කළමනාකරණ ප්‍රදේශවල ගෙවතු සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී. මේ යටතේ ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් දෙආකාරයක් ගනියි. එනම්, පැල ලබා දීම සහ ශාක කළමනාකරණය සඳහා පුහුණු වැඩ සටහන් පැවැත්වීමයි. පැල ලබා දීම යටතේ පොල්, අඹ, දෙහි, ගම්මිරිස් සහ තේක්ක යන පැල ලබාදුන් අතර ශාක කළමනාකරණය පිලිබඳ පුහුණු වැඩසටහන්ද පවත්වන ලදී. 2013 වසර සඳහා ගෙවතු 2684 ක් සංවර්ධනය කරන ලදී. ගෙවතු සහ ශාක කළමනාකරණ වැඩ සටහන් පිළිබඳ වැඩිදුර තොරතුරු වගුව 1.13 මගින් දැක්වේ.

වගුව 1.13 ගෙවතු සංඛ්‍යාව සහ ශාක කළමනාකරණ වැඩසටහන් සංඛ්‍යාව (ශ්‍රී ලංකා ප්‍රජා වන කළමනාකරණ වැඩ සටහන )

| අංකය | දිසාව | ගෙවතු සංඛ්‍යාව 2013 | ශාක කළමනාකරණ වැඩ සටහන් සංඛ්‍යාව 2013 |
|---|---|---|---|
| | | ප්‍රගතිය | ප්‍රගතිය |
| 1. | කුරුණෑගල | 78 | 2 |
| 2. | මාතලේ | 420 | 10 |
| 3. | පුත්තලම | 90 | 6 |
| 4. | අනුරාධපුර | 10 | 12 |
| 5. | මොණරාගල | 131 | 9 |
| 6. | බදුල්ල | 253 | 4 |
| 7. | අම්පාර | 155 | 3 |
| 8. | පොළොන්නරුව | 150 | 9 |
| 9. | රත්නපුර | 290 | 20 |
| 10. | ත්‍රිකුණාමලය | 100 | - |
| 11. | මඩකලපුව | 100 | 2 |
| 12. | වවුනියාව | 200 | 1 |
| 13. | හම්බන්තොට | 500 | 3 |
| 14. | නුවරඑළිය | 77 | 6 |
| 15. | මහනුවර | 130 | 7 |
| 16. | මන්නාරම | - | - |
| 17. | මුලතිව් | - | - |
| | එකතුව | **2684** | **94** |

## 1.6. පුහුණුවීම්

### 1.6.1. දේශීය පුහුණු වීම් සහ විදේශීය අධ්‍යයන චාරිකා

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා විවිධ, දේශීය පුහුණු වැඩ සටහන් 10 ක් පවත් වන ලදී. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා ප්‍රජා වන කළමනාකරණය පිළිබඳ තායිලන්තයේ අධ්‍යයන චාරිකාවක් පවත්වන ලද අතර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරීන් සඳහා ප්‍රජා වන කළමනාකරණය පිළිබඳ ඉන්දියාවේ අධ්‍යයන චාරිකා තුනක් පවත්වන ලදී. දේශිය සහ විදේශීය පුහුණුවීම් වල වැඩිදුර තොරතුරු වගුව 1.14 සහ වගුව 1.15 මගින් දැක්වේ.

**වගුව 1.14 දේශීය පුහුණු වීම්**

| පුහුණුවීම් | සහභාගි වූ නිලධාරීන්ගේ තනතුරු නාමය | සහභාගි වූ සංඛ්‍යාව | පැවැත්වූ පුහුණු වීම් සංඛ්‍යාව |
|---|---|---|---|
| ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩමුළු | කලාප නියෝජ්‍ය වන සංරක්ෂක, දිසා වන නිලධාරී, අඩවි වන නිලධාරී, බිට්ටු වන නිලධාරී, වන ව්‍යාප්ති නිලධාරී, වන ක්ෂේත්‍ර සහකාර | 146 | 5 |
| ප්‍රජා වන කළමනාකරණ සැලසුම් | අඩවි වන නිලධාරී, වන ව්‍යාප්ති නිලධාරී | 20 | 1 |
| සහභාගිත්ව වන කළමණාකරණ මුලධර්ම | අඩවි වන නිලධාරී, වන ව්‍යාප්ති නිලධාරී | 30 | 1 |
| ප්‍රජා වන කළමනාකරණය පිළිබඳ මූලික දැනුවත් කිරීම. | වන ව්‍යාප්ති නිලධාරී | 75 | 1 |
| සන්නිවේදනය සහ ඉදිරිපත් කිරීමේ හැකියාව | වන ව්‍යාප්ති නිලධාරී, | 30 | 1 |
| ව්‍යාප්ති ක්‍රමවේදය සහ හැකියාව | වන ව්‍යාප්ති නිලධාරී, | 30 | 1 |

**වගුව 1.15 විදේශීය පුහුණුව**

| පුහුණුවීම් | සහභාගි වූ නිලධාරීන් | සහභාගි වූ සංඛ්‍යාව | පුහුණුවීම් පැවති ස්ථානය |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ අධ්‍යන චාරිකාව | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය වන සංරක්ෂක, දිසා වන නිලධාරී | 6 | තායිලන්තය |
| කණිෂ්ඨ අධ්‍යන චාරිකාව | දිසා වන නිලධාරී, පර්යේෂණ නිලධාරී, කථිකාචාර්ය, අඩවි වන නිලධාරී, බිට්ටු වන නිලධාරී සහ වන ව්‍යාප්ති නිලධාරී | 39 | ඉන්දියාව |

## 1.7. ස්ථිර නියැදි බිම් කට්ටි ස්ථාපනය කිරීම

ප්‍රජා වන කළමනාකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම හේතුවෙන් වැඩසටහන් ප්‍රදේශ ආශ්‍රිත වනාන්තරයේ සිදුවන ජෛව විවිධත්ව වෙනස අධ්‍යයනය කිරීමට ස්ථිර නියැදි බිම් කට්ටි ස්ථාපනය දිස්ත්‍රික්ක17 තුල සිදු කර ඇත.

## 1.8 සහභාගිත්ව වෙරළබඩ කලාපීය පුනරුත්ථාපන සහ තිරසාර කළමනාකරණ ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා පශ්චාත් සුනාමි ව්‍යාපෘතියේ සහභාගීත්ව වෙරළබඩ කලාපීය පුනරුත්ථාපන සහ තිරසාර කළමනාකරණය 2012 වසරේ සිට නැගෙනහිර පළාතේ මඩකලපුව, ත්‍රිකුණාමලය සහ අම්පාර යන දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කරන ලදී. වසර හයක කාල පරිච්ඡේදයක් සදහා මෙම වැඩ සටහනට GEF සහ IFAD යන ආයතන මගින් මූල්‍ය ආධාර සපයන ලදි. මෙම වැඩ සටහනේ අරමුණ වන්නේ සුනාමි විපතින් බලපෑම් එල්ලවූ පරිසර පද්ධති පුනරුත්ථාපනය කර එමගින් දේශගුණික විපර්යාසවල අහිතකර තත්වයන්ට එරෙහිව අනුවර්තනය වීම සදහා පූර්ණ පරිසර පද්ධති සේවාවක් සැපයීමයි. ඒ අනුව හෙක්ටයාර 50 ක සහ 2 ක වෙරළබඩ වන වගා පිළිවෙලින් අම්පාර සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල ස්ථාපනය කිරීමට කටයුතු ආරම්භ කර තිබෙන අතර මඩකලපුව දිස්ත්‍රික්කයේ වන උද්‍යානයක්ද ස්ථාපනය කර තිබේ.

## 1.9. සුළු පරිමාණ පුද්ගලික ඉඩම් හිමියන් සදහා පුද්ගලික වන වගා වැඩසටහන

දැව වන වගා ස්ථාපනය කිරීම කෙරෙහි සුළු පරිමාණ පුද්ගලික ඉඩම් හිමියන් දිරිමත් කිරීම සදහා විශේෂ වැඩ සටහනක් හදුන්වා දී තිබේ. මෙම වැඩ සටහන අක්කර 05 ක් ( හෙක්ටයාර 2ක්) දක්වාවූ ඉඩම් හිමි පුද්ගලයින් සදහා විවෘත වේ. මෙහිදී ඉඩම් හිමියන්ට සිය ඉඩම්වල දැව වන වගාවක් ලෙස වන පැළ සිටුවීමට හෝ කෘෂි වන වගා ආකෘතියට අනුව කාෂිකාර්මික භෝග සමග මිශ්‍රවන පරිදි දැවමය ශාක සිටුවීමට අවස්ථාව උදාවේ. මෙහිදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව පළමු අක්කරය සදහා අවශ්‍ය කරන බීජ පැළ 250 ක් නොමිළේ සපයන අතර ඉතිරිය විකුණුම් මිලෙන් 50% ක් පමණක් ගෙවා මිළදී ගත හැකිය. මෙයට අමතරව රුක්රෝපණය සහ සියළුම පශ්චාත් නඩත්තු කටයුතු සදහා අවශ්‍ය කරන තාක්ෂණික උපදෙස් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිය ව්‍යාප්ති කාර්යය මණ්ඩලය හරහා සපයනු ලැබේ.

පුද්ගලික වන වගා වැඩ සටහන පිළිබද වැඩිදුර තොරතුරු වගුව 1.16 මගින් දැක්වේ.

වගුව 1.16 සුළු පරිමාණ පුද්ගලික ඉඩම් හිමියන් සඳහා පුද්ගලික වන වගා වැඩසටහන

| දිසාව | වන වගා ප්‍රමාණය ( හෙක්.) | පැල ප්‍රමාණය හා වගා කරන ලද ශාක විශේෂ | ප්‍රතිලාභින් සංඛ්‍යාව |
|---|---|---|---|
| මොණරාගල | 3.3 | 1,000 (තේක්ක, කායා) | 4 |
| අම්පාර | 10.0 | (තේක්ක, කායා, හල්මිල්ල) | 10 |
| මඩකලපුව | 8.8 | 3,600(තේක්ක, කායා,කොස්, කජු) | 13 |
| මාතර | 2.65 | 2,175(මැහෝගනි, නැදුන්, බුරුත ) | 3 |
| ගාල්ල | 3.8 | 1,250(මැහෝගනි, ලුණුමිදෙල්ල, ගිනිසපු) | 5 |
| හම්බන්තොට | 5.0 | 1,150 ( තේක්ක) | 4 |
| රත්නපුර | 0.4 | 250 ( මැහෝගනි) | 2 |
| කෑගල්ල | 4.8 | 1,060 ( තේක්ක, මැහෝගනි) | 5 |
| ගම්පහ | 1.0 | 500 ( තේක්ක) | 2 |
| කුරුණෑගල | 10.8 | 7,800 ( තේක්ක, කායා) | 37 |
| කළුතර | 4.25 | 2,350 ( මැහෝගනි) | 5 |
| පුත්තලම | 2.0 | 750 ( කායා) | 1 |
| බදුල්ල | 4.8 | 2,250 (ඉයුකැලිප්ටස් ග්‍රාන්ඩිස්, තේක්ක, සපු) | 7 |
| මහනුවර | 9.67 | 10,150 ( ඉයුකැලිප්ටස් ග්‍රාන්ඩිස්,මැහෝගනී, ගිනිසපු) | 6 |
| මාතලේ | 13.8 | 1,000 ( තේක්ක, ගිනිසපු, මැහෝගනි) | 4 |
| නුවරඑළිය | 15.1 | 8,750 ( ඉයුකැලිප්ටස් ග්‍රාන්ඩිස්) | 37 |
| කිලිනොච්චිය | 5.0 | 1,000 ( තේක්ක, කායා) | 5 |
| **එකතුව** | **105.17** | | **150** |

# 02 වන පරිච්ඡේදය
# වන සංගණන හා කළමනාකරණ අංශය

## 2.1 හැඳින්වීම

වන නිෂ්පාදන හා සේවා සැපයීම සඳහා වනාන්තර තිරසාර ලෙස කලමනාකරණය කිරීමත් ඒ සඳහා අවශ්‍ය වන දත්ත එක්රැස් කිරීමත්, එම දත්ත විශ්ලේෂණය කිරීමත් වන සංගණන හා කලමනාකරණය අංශය වෙත පැවරී ඇති මූලික වගකීමයි. තවද වානිජ වන වගා නිසි ලෙස කලමනාකරණය කිරීමෙන් නිෂ්පාදනය කරන දැව වල ගුණාත්මය ඉහල දැමීමට මෙම අංශය කටයුතු කරන අතර, දැව අස්වනු නෙලීමෙන් පසු ලැබෙන ආදායම නිසි පරිදි රජයට ලබා දීමට අවශ්‍ය කටයුතු කිරීමේ වගකීමද මෙම අංශයට පැවරේ.

## 2.2 මෙම අංශයේ මූලික අරමුණු

I වන කළමනාකරණ උපාය මාර්ග සැකසීම සඳහා රටේ තිබෙන වන සම්පත් හඳුනා ගැනීමට සහ ඒවායේ පිහිටීම අවබෝධ කර ගැනීම පිණිස, ශ්‍රී ලංකාවේ ස්වභාවික වනාන්තර සහ වන වගා සිතියම් ගත කිරීම.

II දැව වල ගුණාත්මය ඉහල නැංවීම සඳහා සිදු කල යුතු වන විද්‍යාත්මක ක්‍රියාකාරකම් සිදු කිරීමට මෙන්ම, අස්වැන්න අනුමාන කිරීමට අවශ්‍ය වන, වන වගාවල සංගණන දත්ත රැස් කිරීම සහ සම්පාදනය කිරීම.

III 1995 වන ක්ෂේත්‍ර මහා සැලැස්ම මගින් යෝජනා කල පරිදි ස්වභාවික වනාන්තර සහ වන වගා සඳහා කළමනාකරණ සැලසුම් සකස් කිරීම.

IV විවිධ වන වගා ශාක විශේෂ සඳහා වූ කළමනාකරණ සැලසුම් මගින් දක්වා ඇති පරිදි, වන විද්‍යාත්මක ප්‍රතිකර්ම සහ දැව හෙලීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය.

V හායනයට පත් වූ රජයේ ඉඩම් වල නව වන වගාවන් ස්ථාපනය කිරීම.

VI දැව සඳහා වගාකර ඇති වානිජ වන වගාවන් පුනර්ජනනීය හෙලීම් සිදු කර, නැවත වන වගාකර එම වන වගා කළමනාකරණය සිදු කිරීම.

VII දෙපාර්තමේන්තුවේ භූගෝලීය තොරතුරු පද්ධතිය කළමනාකරණය සහ වැඩි දියුණු කිරීම.

VIII වන සම්පත් දත්ත පද්ධතිය ක්‍රමානුකූලව කළමනාකරණය කිරීම සහ යාවත්කාලීන කිරීම.

IX පුද්ගලික අංශයේ සංවිධාන සමග බදු ගිවිසුම් යටතේ, පයිනස් ඔලියෝ රෙසින් නිස්සාරණ කටයුතු සිදුකිරීම අධීක්ෂණය කිරීම.

X තෝරාගත් රජයේ ඉඩම් වල සිදුකරන පෞද්ගලික අංශයේ නැවත වන වගා කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම.

XI වන සම්පත් දත්ත පද්ධතිය ප්‍රතිශෝධනය කිරීම සඳහා G.P.S. උපකරණය උපයෝගීකර ගනිමින් මිණුම් කටයුතු සිදු කිරීම

XII මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සහභාගිත්වය ඇතිව වනාන්තර මැනීම සහ මායිම් භෞතිකව නිරූපනය.

XIII වැව්ලි සමාගම් සිය වතු වලින් දැව ලබා ගැනීම සඳහා පිළියෙල කරන ලද වන කළමනාකරණ සැලසුම් සමාලෝචනය කිරීම.

**XIV** වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් පාලනය වන සංරක්ෂණ මධ්‍යස්ථාන, කඳවුරු භූමි, සංචාරක බංගලා සහ නැරඹුම් භූමි මහජනයාට පරිහරණය සඳහා අවස්ථාව ලබා දීම සහ එම ස්ථාන නඩත්තු කිරීම.

**XV** වන කළමනාකරණය, වන සංගණනය, වන සම්පත් දත්ත පද්ධතිය කළමනාකරණය, වනාන්තර සිතියම්ගත කිරීම, භූගෝලීය තොරතුරු පද්ධතිය මෙහෙයවීම, GPS උපකරණ භාවිතය හා ස්කන්ධභාග ගණනය කිරීම පිළිබඳව නිලධාරීන් හට පුහුණුවීම් ලබාදීම.

### 2.3 ආයතනික සැකැස්ම

මෙම අංශය ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය වන සංරක්ෂකවරයෙකු යටතේ මෙහෙයවනු ලබයි. මෙම කාර්යයන් ඉටු කිරීම සඳහා එම අංශයේ ප්‍රධාන කාර්යාලයේ කාර්ය මන්ඩලයට අමතරව කලාප නියෝජ්‍ය වන සංරක්ෂකවරුන්, දිසා වන නිලධාරීන් සහ දිසාවන කාර්යාල වල සහ ක්ෂේත්‍ර කාර්ය මන්ඩලය කාර්ය භාරයක් ඉටු කරනු ලබයි. තවද ප්‍රධාන කාර්යාලයේ සහකාර වන සංරක්ෂකවරුන් දෙදෙනෙක් තාක්ෂණික කාර්ය මන්ඩලයේ කාර්යයන් අධීක්ෂණය කරනු ලබයි.

### 2.4 ප්‍රධාන කාර්යයන්

#### 2.4.1 වන සම්පත් සිතියම් ගත කිරීම සඳහා දුරස්ථ සන්නිවේදනය

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පවතින වන සම්පත් (ස්වභාවික වනාන්තර සහ වන වගාවන්) වලට අදාල සිතියම් යාවත්කාලීන කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. මෙම කටයුතු දිසා වන නිලධාරීන් විසින් එවනු ලබන සිතියම් සහ මිනුම් දත්ත උපයෝගි කර ගනිමින් සිදු කරන ලදී. වන කළමනාකරණ මෙහෙයුම් පහසු කරලීම සඳහා විශාල පරිමාණයේ වන කළමනාකරණ සිතියම් ( 1 : 10,000 සහ 1 : 20,000 ) යාවත්කාලීන කිරීම සඳහා විශේෂ අවධානයක් යොදවන ලදී.

#### 2.4.2 වන සංගණන ක්‍රියාකාරකම්

ඉහල අස්වැන්නක් ලබා ගැනීම සඳහා කළමනාකරණ කටයුතු සැලසුම් කිරීමට තෝරාගත් වානිජ වන වගා වල වන සංගණන කටයුතු සිදු කරන ලදි.

#### 2.4.3 වනාන්තර මිනුම් කිරීම සහ මායිම් සලකුණු කිරීම.

වනාන්තර ආරක්ෂා කර ගැනීම පහසු වනු පිණිස මෙන්ම ඒවා රක්ෂිත හෝ සංරක්ෂිත වනාන්තර ලෙස ප්‍රකාශයට පත් කිරීමට පහසු වන පරිදි ස්වභාවික වනාන්තර සහ වන වගා මිනුම් කිරීම සහ භෞතිකව මායිම් සලකුණු කිරීම සිදු කරන ලදි.

#### 2.4.4 වන සම්පත් දත්ත මූලාශ්‍රය කළමනාකරණය කිරීම.

වන වගාවන් සඳහා වූ පරිගණක ආශ්‍රිත මූලික දත්ත (FORDATA) මෙමගින් සපයනු ලැබේ. මෙම දත්ත ගබඩාව නඩත්තු කිරීම සහ යාවත්කාලීන කරමින් පවතී.

#### 2.4.5 නැවත වන වගා කිරීම.

නැවත වන වගා කිරීම යටතේ පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

- දැව නිෂ්පාදනය සඳහා වානිජ වන වගා ස්ථාපනය කිරීම.
- සංරක්ෂණය සඳහා වන වගා ස්ථාපනය කිරීම.
- පුනර්ජනනීය හෙලීම් වලට ලක්වූ වන වගාවල නැවත වන වගා ස්ථාපනය කිරීම.
- පයිනස් වන වගා පුළුල් පත්‍ර මිශ්‍ර ශාක විශේෂ සහිත වගා බවට පරිවර්තනය කිරීම.
- ගිනි පාලනය.
- වන වගාකළමනාකරණය.
- පුද්ගලික අංශයේ නැවත වන වගා කිරීමේ වැඩ සටහන ක්‍රියාත්මක කිරීම.
- මධ්‍යම කඳුකරයේ පිහිටි කඳු මුදුන් සංරක්ෂණය කිරීම.

### 2.4.6 භූගෝලීය තොරතුරු පද්ධතියේ දත්ත මූලාශ්‍රය කළමනාකරණය

මෙම දත්ත මූලාශ්‍රයේ 1992 සහ 1996 LANDSAT TM චන්ද්‍රිකා ඡායාරූප සහ අනෙකුත් අදාල දත්ත උපයෝගී කර ගනිමින් සකස් කල වන ආවරණය පිළිබඳ සියළුම තොරතුරු අඩංගු වේ. (ස්වභාවික වනාන්තර වල සහ වන වගා වල). 2010 වසරේදී පැවති ශ්‍රී ලංකාවේ වන ආවරණය IRS චන්ද්‍රිකා භාවිතා කර සකස් කර අවසන් කරන ලදි. මෙය වන සම්පත් කළමනාකරණයට තීරණ ගැනීමේදී අවශ්‍ය තොරතුරු සපයාදීම සඳහා භාවිතා කරන ලදී.

### 2.4.7 වනාන්තර තුල පිහිටි මාර්ග නඩත්තු කිරීම

වන වගා වල දැව අස්වනු නෙලීමේ ක්‍රියාකාරකම් සහ නැවත වන වගා කටයුතු පාරිසරික ගැටළු අවම වන අයුරින් ක්‍රියාත්මක කිරීම සඳහා, ප්‍රවේශය පහසු කිරීමට වනාන්තර මාර්ග ඇති කිරීම, නඩත්තු කිරීම අත්‍යාවශ්‍ය කරුණකි. එබැවින් එම පුනර්ජනන හෙලීම් සිදු කරන ප්‍රදේශ වල නව මාර්ග නිර්මාණයේදී සහ ඉදි කිරීමේදී පරිසර ආරක්ෂණ පියවර පිළිබඳව ඉතාමත් දැඩිව සලකා බලමින් මාර්ග ඉදි කරනු ලබයි.

### 2.4.8 රාජ්‍ය දැව සංස්ථාව සමඟ සම්බන්ධීකරණ කටයුතු වල නිරත වීම

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු වන වගා වලින් දැව ලබා ගැනීමට බලය ලබාදී තිබෙන්නේ රාජ්‍ය දැව සංස්ථාව වෙත බැවින්, එම ආයතනය සමග සම්බන්ධතාවයක් පවත්වා ගෙන, රාජ්‍ය දැව සංස්ථාව විසින් ගෙවිය යුතු ස්කන්ධභාගය ක්‍රමානුකූලව ගණනය කිරීම සහ අය කිරීම සිදු කරන ලදි.

### 2.4.9 පයිනස් ඔලියො - රෙසින් නිස්සාරණ කටයුතු ක්‍රියාත්මක කිරීම

පයිනස් ඔලියො රෙසින් නිස්සාරණය සඳහා තෝරාගත් පෞද්ගලික අංශයේ සමාගම් වලට, පරිණත පයිනස් කැරිබියා වන වගා බදු දීම හා එම කටයුතු අධීක්ෂණය සිදු කරනු ලබයි.

## 2.5 2013 වසර තුල සිදු කල ක්‍රියාකාරකම් වල ප්‍රගතිය

### 2.5.1 නැවත වන වගා කිරීමේ වැඩ සටහන - 2013

මෙම කාල පරිච්ඡේදය තුල, මෙම ක්‍රියාකාරකම යටතේ වන වගා හෙක්ටයාර් 909.4 ක් පූර්ණ හෙලීම් සිදු කල ප්‍රදේශ තුල ස්ථාපනය කරන ලදී. මෙම වැඩ සටහන පිළිබඳ වැඩිදුර තොරතුරු වගුව 2.1 මගින් දැක්වේ.

**වගුව : 2.1 නැවත වන වගා කිරීමේ වැඩ සටහන - 2013**

| **දිස්ත්‍රික්කය** | **පැරණි විශේෂය** | **අළුතින් ස්ථාපනය කරන ලද විශේෂය** | **ඉලක්කය (හෙක්ටයාර්)** | **ප්‍රගතිය (හෙක්ටයාර්)** |
|---|---|---|---|---|
| අම්පාර | තේක්ක | කායා | 80.50 | 80.5 |
| අනුරාධපුර | තේක්ක | කායා / තේක්ක | 122.00 | 143.00 |
| පොළොන්නරුව | තේක්ක | කායා | 50.00 | 50.00 |
| මඩකලපුව | තේක්ක | කායා/හල්මිල්ල/හුලංහික් | 50.00 | 50.00 |
| ත්‍රිකුණාමලය | තේක්ක/ හල්මිල්ල | තේක්ක/ හල්මිල්ල/මිශ්‍ර | 50.00 | 50.00 |
| මුලතිව් | තේක්ක | තේක්ක | 25.00 | 25.00 |
| | | කායා | - | 10.00 |
| වවුනියාව | තේක්ක | කායා | 25.00 | 15.00 |
| රත්නපුරය | පයිනස් | හොර | 45.00 | 45.00 |
| මාතලේ | තේක්ක | කායා | 66.70 | 67.00 |
| මොණරාගල | තේක්ක | තේක්ක<br>කායා | 100.00<br>- | 101.7<br>7.00 |
| බදුල්ල | ඉයුකැලිප්ටස්<br>ටෙට්‍රාකෝනිස්<br>පයිනස් | තේක්ක<br><br>දේශීය විශේෂ | 26.00<br><br>- | 26.00<br><br>1.80 |
| මහනුවර | පයිනස්<br>ඇකේෂියා | දේශීය මිශ්‍ර | 42.60 | 42.60 |
| කළුතර | පයිනස්<br>ඇකේෂියා | හොර | 64.00 | 61.10 |
| කුරුණෑගල | තේක්ක | කායා<br>තේක්ක | 116.20 | 67.5<br>56.2 |
| ගම්පහ | - | වේවැල් | - | 10.00 |
| **එකතුව** | | | **863.00** | **909.40** |

### 2.5.2 බීජ පැල නිෂ්පාදනය

ඉහත නැවත වන වගා කිරීමේ වැඩ සටහන සඳහා බීජ පැල 1,534,902 ක් නිෂ්පාදනය කරන ලදී. වැඩිදුර තොරතුරු වගුව 2.2 මගින් දැක්වේ. නැවත වන වගා කිරීම සඳහා තේක්ක, කායා, ඉයුකැලිප්ටස් සහ දේශීය විශේෂ ප්‍රධාන වශයෙන් යොදා ගන්නා ලදී.

**වගුව 2.2 බීජ පැල නිෂ්පාදනය - 2013**

| දිස්ත්‍රික්කය | විශේෂය | බීජ පැල සංඛ්‍යාව |
|---|---|---|
| අම්පාර | *කායා* | 134,400 |
| අනුරාධපුරය | *කායා / තේක්ක* | 195,724 |
| පොළොන්නරුව | *කායා* | 88,000 |
| මඩකලපුව | *කායා* | 68,500 |
| | *හල්මිල්ල* | 12,000 |
| | *හුලංහික්* | 2,500 |
| ත්‍රිකුණාමලය | *තේක්ක/ හල්මිල්ල/ කුඹුක්/ මිශ්‍රවිශේෂ වර්ග* | 128,800 |
| මුලතිව් | *තේක්ක* | 33,000 |
| වව්නියාව | *කායා* | 44,000 |
| රත්නපුරය | *හොර* | 104,000 |
| මාතලේ | *කායා* | 133,400 |
| මොණරාගල | *තේක්ක*<br>*කායා* | 142,484<br>7,680 |
| බදුල්ල | *තේක්ක*<br>*ඉයුකැලිප්ටස් මයික්‍රොකෝරිස්* | 52,800<br>21,120 |
| මහනුවර | *දේශීය මිශ්‍ර* | 48,990 |
| කළුතර | *හොර* | 75,000 |
| කුරුණෑගල | *තේක්ක*<br>*කායා* | 129,600<br>107,904 |
| ගම්පහ | *කැලමස් සෙලනිකස්*<br>*කැලමස් ත්වේට්සයි* | 5,000 |
| **එකතුව** | | 1,534,902 |

**2.5.3 නොමේරූ වන වගා නඩත්තු කිරීම - 2013**

වන වගා නඩත්තු කිරීමේ වැඩ සටහන යටතේ වල් නෙලීම, පොහොර යෙදීම, ලැව් ගිනි වැලැක්වීම හා පාළු පැල සිටුවීම සිදු කරන ලදි. අදාල වර්ෂය තුල හෙක්ටයාර් 2,795.92ක් නඩත්තු කරන ලදී. මේ පිළිබද වැඩි විස්තර වගුව 2.3 මගින් දැක්වේ.

වගුව 2.3. නොමේරූ වන වගා නඩත්තු කිරීම - 2013

| දිස්ත්‍රික්කය | 2010 වසරේ ස්ථාපිත වසර 03ක් වයසැති වන වගා ප්‍රමාණය (හෙක්ටයාර) | | | 2011 වසරේ ස්ථාපිත වසර දෙකක් වයසැති වන වගා (හෙක්ටයාර) | | | 2012 වසරේ ස්ථාපිත වසරක් වයසැති වන වගා (හෙක්ටයාර) | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | විශේෂය | ඉලක්කය (හෙක්) | ප්‍රගතිය (හෙක්) | විශේෂය | ඉලක්කය (හෙක්) | ප්‍රගතිය (හෙක්) | විශේෂය | ඉලක්කය ( හෙක්) | ප්‍රගතිය (හෙක්) |
| කුරුණෑගල | *තේක්ක* | 92.30 | 92.30 | *තේක්ක/ කායා* | 99.49 | 99.49 | *තේක්ක/කායා* | 111 | 111 |
| ගම්පහ | - | - | - | - | - | - | *තේක්ක* | 15.2 | 15.00 |
| පුත්තලම | කායා | 69.00 | 69.00 | *කායා* | 6.50 | 6.50 | - | - | - |
| කළුතර | *හොර* | 40.50 | 40.50 | *හොර* | 44.00 | 44.00 | *හොර* | 58.50 | 58.50 |
| අනුරාධපුරය | *තේක්ක* | 119.43 | 119.43 | *තේක්ක/ කායා* | 207.40 | 207.40 | *තේක්ක/කායා* | 116.80 | 116.80 |
| අම්පාර | *තේක්ක /කායා* | 109.00 | 109.00 | *කායා* | 100.00 | 100.00 | *කායා* | 60.00 | 60.00 |
| පොළොන්නරුව | *කායා* | 50.00 | 50.00 | *කායා* | 50.00 | 50.00 | *කායා* | 52.00 | 52.00 |
| ත්‍රිකුණාමලය | - | - | - | *කායා/කුඹුක්/මිශ්‍ර* | 50.00 | 50.00 | *කායා/ හල්මිල්ල/මිශ්‍ර* | 50.00 | 50.00 |
| වවුනියාව | - | - | - | - | - | - | *දේශීය මිශ්‍ර සහ කායා* | 18.00 | 18.00 |
| මඩකලපුව | - | - | - | *කායා* | 50.00 | 50.00 | *කායා* | 50.00 | 50.00 |
| මහනුවර | *දේශීය මිශ්‍ර සහ ඉයුකැලිප්ටස්* | 15.00 | 15.00 | *දේශීය මිශ්‍ර සහ ඉයුකැලිප්ටස්* | 30.50 | 30.50 | *දේශීය මිශ්‍ර සහ ඉයුකැලිප්ටස්* | 35.50 | 35.50 |
| නුවරඑළිය | *ඉයුකැලිප්ටස්* | 81.70 | 81.70 | *ඉයුකැලිප්ටස්* | 112.20 | 112.20 | *ඉයුකැලිප්ටස්* | 84.40 | 84.80 |
| මොණරාගල | *තේක්ක / කායා* | 55.80 | 56.00 | *තේක්ක / කායා* | 105.5 | 105.5 | *තේක්ක / කායා* | 38.40 | 38.40 |
| මාතලේ | *තේක්ක / කායා* | 45.00 | 45.00 | *කායා* | 34.00 | 34.00 | *කායා* | 37.00 | 37.00 |
| බදුල්ල | *තේක්ක/ ඉයුකැලිප්ටස්/ කායා* | 197.50 | 197.50 | *තේක්ක/ඉයුකැලිප්ටස්* | 75.20 | 75.20 | *ඉයුකැලිප්ටස්* | 79.10 | 79.10 |
| රත්නපුර | *ඉයුකැලිප්ටස්* | 41.30 | 41.30 | *තේක්ක / ඉයුකැලිප්ටස්* | 42.00 | 42.00 | *ඉයුකැලිප්ටස්* | 45.00 | 45.00 |
| මාතර | - | - | - | - | - | - | *හොර* | 21.30 | 21.30 |
| **එකතුව** | | **916.53** | **916.73** | | **1,006.79** | **1,006.79** | | **877.20** | **872.40** |

### 2.5.4. වන වගා වල වන විද්‍යාත්මක ප්‍රතිකර්ම සිදු කිරීම.

අදාල කාල පරිච්ඡේදය තුලදී තෝරාගත් වන වගා තුල පහත සදහන් වන විද්‍යාත්මක ප්‍රතිකර්ම සිදු කරන ලදී.

- පූර්ව වාණිජමය තුනී කිරීම්
- වානිජමය තුනී කිරීම්
- පශ්චාත් දැව හෙළීම් සංගණනය
- රිකිලි නඩත්තු කිරීම
- රිකිලි කළමනාකරණය
- ශුද්ධ කිරීම
- ආරෝහක කැපීම
- මැහෝගනි වන වගා කළමනාකරණය

#### 2.5.4.1 පූර්ව වාණිජමය තුනීකිරීම්

දිස්ත්‍රික්ක 12 ක තේක්ක, ඉයුකැලිප්ටස්, කායා සහ කොහොඹ වන වගා වල පූර්ව වානිජමය තුනී කිරීම් සිදු කරන ලදී. වැඩිදුර තොරතුරු වගුව 2.4 මගින් දැක්වේ.

**වගුව 2.4 පූර්ව වාණිජමය තුනීකිරීම් - 2013**

| **දිස්ත්‍රික්කය** | **විශේෂය** | **ඉලක්කය (හෙක්ටයාර්)** | **ප්‍රගතිය (හෙක්ටයාර)** |
|---|---|---|---|
| රත්නපුරය | තේක්ක | 10.00 | 33.00 |
| හම්බන්තොට | කායා / තේක්ක | 52.70 | 52.70 |
| බදුල්ල | *ඉයුකැලිප්ටස්* | 51.00 | 55.50 |
| නුවරඑළිය | *ඉයුකැලිප්ටස්* | 67.30 | 82.20 |
| මොණරාගල | *කායා /තේක්ක* | 267.30 | 254.30 |
| අම්පාර | *තේක්ක* | 27.60 | 27.60 |
| අනුරාධපුර | *කායා / තේක්ක / කොහොඹ* | 102.00 | 98.00 |
| පොළොන්නරුව | *කායා* | 60.00 | 60.00 |
| මුලතිව් | *තේක්ක* | 45.00 | 45.00 |
| කිලිනොච්චි | *තේක්ක* | 70.00 | 30.00 |
| කුරුණෑගල | *තේක්ක* | 16.80 | 16.80 |
| පුත්තලම | *කායා/ තේක්ක* | 134.50 | 134.50 |
| **එකතුව** | | **904.20** | **889.60** |

**2.5.4.2 වාණිජමය තුනී කිරීම් - 2013**

ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 08ක තේක්ක, කායා සහ ඉයුකැලිප්ටස් වන වගා වල වානිජමය තුනී කිරීම් සිදු කරන ලදී. වැඩි දුර තොරතුරු වගුව 2.5 මගින් දැක්වේ.

**වගුව 2.5 වාණිජමය තුනී කිරීම් - 2013**

| දිස්ත්‍රික්කය | විශේෂය | ඉලක්කය (හෙක්ටයාර්) | ප්‍රගතිය (හෙක්ටයාර) |
|---|---|---|---|
| අම්පාර | *තේක්ක* | 25.6 | 25.6 |
| මුලතිව් | *තේක්ක* | 10.00 | 10.00 |
| අනුරාධපුරය | *තේක්ක* | 18.00 | 14.00 |
| බදුල්ල | *ඉයුකැලිප්ටස්* | 91.50 | 91.50 |
| නුවරඑළිය | *ඉයුකැලිප්ටස්* | 404.60 | 398.00 |
| රත්නපුරය | කායා/ තේක්ක | 44.00 | 44.00 |
| හම්බන්තොට | තේක්ක | 105.00 | 105.00 |
| පුත්තලම | කායා/ තේක්ක | 61.29 | 61.29 |
| **එකතුව** | - | **759.99** | **749.39** |

**2.5.4.3 පරිණත වගාවල පුනර්ජනන හෙලීම්**

මෙම ක්‍රියාකාරකමට වන වගාවල සිදු කරන පුනර්ජනන හෙලීම් (වගුව 2.1) අයත්වේ. බදුල්ල දිස්ත්‍රික්කයේ පමණක් ඉයුකැලිප්ටස් වන වගා වල පූර්ණ හෙලීම් සිදු කල අතර එම බිම් කොටස් වල තේක්ක වගා කරන ලදි. සමහර දිස්ත්‍රික්කයන්හි තෝරාගත් පරිණත පයිනස් වන වගා ද පූර්ණ හෙලීම් වලට ලක් කර එම ඉඩම්වල හොර සහ වෙනත් දේශීය ශාක විශේෂ වගා කර ඇත. වියළි කලාපයේ තේක්ක වන වගා හෙලීමෙන් පසුව නැවත තේක්ක සිටු වන ලද අතර නිරතුරුවම අලින්ගෙන් තර්ජනයට භාජනය වන ප්‍රදේශ වල තේක්ක වෙනුවට කායා, හල්මිල්ල සහ හුලංහික් යන ශාක වර්ග වගා කරන ලදි.

**2.5.4.4. පශ්චාත් හෙලීම් සංගණන**

වන වගා වල වානිජමය තුනී කිරීම සහ පූර්ව වාණිජමය තුනී කිරීම් සිදු කිරීමෙන් පසු පශ්චාත් හෙලීම් සංගණන සිදු කරන ලදී. (වගුව 2.6)

**වගුව 2.6 පශ්චාත් හෙළීම් සංගණනය -2013**

| දිස්ත්‍රික්කය | විශේෂය | ඉලක්කය (හෙක්.) | ප්‍රගතිය (හෙක්.) |
|---|---|---|---|
| බදුල්ල | *ඉයුකැලිප්ටස්* | 219.25 | 121.80 |
| නුවරඑළිය | *ඉයුකැලිප්ටස්* | 234.3 | 220.5 |
| මුලතිව් | *තේක්ක* | 55.00 | 55.00 |
| හම්බන්තොට | *තේක්ක* | 105.00 | 42.00 |
| රත්නපුර | *තේක්ක* | - | 33.00 |
| **එකතුව** | | **613.55** | **472.30** |

**2.5.4.5 රිකිලි නඩත්තු කිරීම**

මෙම නඩත්තු කටයුතු පහත පරිදි සිදු කරන ලදී. ( වගුව 2.7)

**වගුව 2.7 රිකිලි නඩත්තු කිරීම - 2013**

| දිස්ත්‍රික්කය | විශේෂය | ඉලක්කය (හෙක්.) | ප්‍රගතිය (හෙක්.) |
|---|---|---|---|
| පුත්තලම | *ඉයුකැලිප්ටස්* | 30.00 | 30.00 |
| පොලොන්නරුව | *ඉයුකැලිප්ටස්* | 60.72 | 60.72 |
| **එකතුව** | | **90.72** | **90.72** |

**2.5.4.6 රිකිලි කළමනාකරණය කිරීම**

රිකිලි කළමනාකරණ කටයුතු පහත පරිදි සිදු කරන ලදී. (වගුව 2.8)

**වගුව 2.8 රිකිලි කළමනාකරණය - 2013**

| දිස්ත්‍රික්කය | විශේෂය | ඉලක්කය (හෙක්.) | ප්‍රගතිය (හෙක්.) |
|---|---|---|---|
| පුත්තලම | *ඉයුකැලිප්ටස්* | 20.00 | 20.00 |
| **එකතුව** | | **20.00** | **20.00** |

### 2.5.4.7 වන වගා ශුද්ධ කිරීම

වන වගා හෙක්ටයාර් 312.8 ක ශුද්ධ කිරීමේ කටයුතු පහත පරිදි සිදු කරන ලදී. (වගුව 2.9)

**වගුව 2.9 ශුද්ධ කිරීම - 2013**

| **දිස්ත්‍රික්කය** | **ශුද්ධ කිරීම** | |
|---|---|---|
| | **ඉලක්කය (හෙක්.)** | **ප්‍රගතිය (හෙක්.)** |
| පුත්තලම | 66.50 | 66.50 |
| කුරුණෑගල | - | 29.00 |
| මන්නාරම | - | 10.00 |
| කිලිනොච්චිය | - | 20.00 |
| හම්බන්තොට | 138.5 | 138.50 |
| රත්නපුර | - | 23.00 |
| නුවරඑළිය | - | 25.80 |
| **එකතුව** | **205.00** | **312.80** |

### 2.5.4.8 ආරෝහක කැපීම.

**වගුව 2.10 ආරෝහක කැපීම - 2013**

| **දිස්ත්‍රික්කය** | **ආරෝහක කැපීම** | |
|---|---|---|
| | **ඉලක්කය (හෙක්.)** | **ප්‍රගතිය (හෙක්.)** |
| හම්බන්තොට | - | 130.00 |
| බදුල්ල | - | 14.50 |
| **එකතුව** | - | 144.50 |

### 2.5.4.9. කප්පාදු කිරීම

**වගුව 2.11 කප්පාදු කිරීම - 2013**

| **දිස්ත්‍රික්කය** | **කප්පාදු කිරීම** | |
|---|---|---|
| | **ඉලක්කය (හෙක්.)** | **ප්‍රගතිය (හෙක්.)** |
| හම්බන්තොට | - | 130.00 |
| බදුල්ල | - | 19.00 |
| කිලිනොච්චිය | - | 20.00 |
| **එකතුව** | - | 169.00 |

**2.5.4.10 මැහෝගනී වන වගා කළමනාකරණය කිරීම.**

මැහෝගනි කළමනාකරණ සැලැස්මට අනුව අදාල වර්ෂය තුලදී හෙක්ටයාර් 356.5 ක වන විද්‍යාත්මක ප්‍රතිකර්ම, යටි වගාව මගින් සුපෝෂණ කටයුතු සිදුකිරීම සහ ආරෝහක කැපීම යන ක්‍රියාකාරකම් සිදු කරන ලදී. වැඩි දුර තොරතුරු වගුව 2.12 මගින් දැක්වේ.

**වගුව : 2.12 මැහෝගනී වන වගා කළමනාකරණය කිරීම –2013**

| දිස්ත්‍රික්කය | සිදු කරන ලද ක්‍රියාකාරකම් | ඉලක්කය (හෙක්.) | ප්‍රගතිය (හෙක්.) |
|---|---|---|---|
| කුරුණෑගල | මැහෝගනී ආරෝහක කැපීම | 57.90 | 62.80 |
| ගම්පහ | නඩත්තු කිරීම් | 91.00 | 91.00 |
| කෑගල්ල | වන විද්‍යාත්මක ප්‍රතිකර්ම | 221.90 | 202.70 |
| **එකතුව** | | **370.80** | **356.50** |

**2.5.4.11 සිතියම් සකස් කිරීම**

භූමියේ සිදු කරන ලද මිණුම් පාදක කර ගනිමින් නව වන වගා සිතියම් ගත කරන ලදී. මේවා 1:20,000 පරිමාණයට පරිවර්ථනය කරන ලදී. වැඩිදුර තොරතුරු 2.13 වගුව මගින් දැක්වේ.

**වගුව :2.13 GPS සහ ප්‍රිස්මේන්තු කොම්පාසු උපයෝගි කර ගනිමින් සිදු කරන ලද වන වගා වල මිණුම්**

| දිස්ත්‍රික්කය | ඉලක්කය (හෙක්.) | ප්‍රගතිය (හෙක්.)) |
|---|---|---|
| පුත්තලම | 136.30 | 136.30 |
| කුරුණෑගල | 480.70 | 484.20 |
| ගම්පහ | 243.30 | 426.7 |
| අනුරාධපුරය | 54.20 | 54.20 |
| පොළොන්නරුව | 240.00 | 280.00 |
| අම්පාර | 314.00 | 314.00 |
| මුලතිව් | 70.00 | 70.00 |
| ත්‍රිකුණාමලය | 100.00 | 109.00 |
| මොණරාගල | 314.80 | 262.70 |

| දිස්ත්‍රික්කය | ඉලක්කය (හෙක්.) | ප්‍රගතිය (හෙක්.)) |
|---|---|---|
| බදුල්ල | 500.00 | 800.00 |
| මාතලේ | 60.00 | 58.00 |
| මහනුවර | 443.00 | 192.40 |
| **එකතුව** | **2,956.30** | **3,187.50** |

### 2.5.5 ස්වාරක්ෂක කලාපීය වන වගා ස්ථාපනය කිරීම- 2013

**වගුව 2.14 ස්වාරක්ෂක කලාපීය වන වගා ස්ථාපනය කිරීම - 2013**

| දිස්ත්‍රික්කය | ස්වාරක්ෂක කලාපීය වන වගා | |
|---|---|---|
| | ඉලක්කය (හෙක්.) | ප්‍රගතිය (හෙක්.) |
| කුරුණෑගල | 20 | 30 |
| **එකතුව** | **20** | **30** |

**වගුව 2.15 ස්වාරක්ෂක කලාපීය වන වගා නඩත්තු කිරීම - 2013**

| දිස්ත්‍රික්කය | ස්වාරක්ෂක කලාපීය වන වගා | |
|---|---|---|
| | ඉලක්කය (හෙක්.) | ප්‍රගතිය (හෙක්.) |
| කුරුණෑගල | 20 | 20 |
| **එකතුව** | **20** | **20** |

### 2.5.6 පරිහානියට පත් වන වගා - 2013

**වගුව 2.16 පරිහානියට පත් වන වගා පුනරුත්ථාපනය කිරීම - 2013**

| දිස්ත්‍රික්කය | පරිහානියට පත් වූ වන වගා | |
|---|---|---|
| | ඉලක්කය (හෙක්.) | ප්‍රගතිය (හෙක්.) |
| පුත්තලම | 20.00 | 20.00 |
| කුරුණෑගල | - | 28.80 |
| **එකතුව** | **20.00** | **48.80** |

**වගුව 2.17 පරිහානියට පත් වන වගා නඩත්තු කිරීම - 2013**

| **දිස්ත්‍රික්කය** | **පරිහානියට පත් වූ වන වගා** | |
|---|---|---|
| | **ඉලක්කය (හෙක්.)** | **ප්‍රගතිය (හෙක්.)** |
| පුත්තලම | 50.00 | 50.00 |
| **එකතුව** | **50.00** | **50.00** |

## 2.5.7 සුපෝෂණ වන වගා - 2013

**වගුව 2.18 - සුපෝෂණ වන වගා ස්ථාපනය කිරීම.**

| **දිස්ත්‍රික්කය** | **ඉලක්කය (හෙක්.)** | **ප්‍රගතිය (හෙක්.)** |
|---|---|---|
| ගාල්ල | - | 23.50 |
| මාතර | 22.00 | 55.40 |
| රත්නපුර | - | 8.00 |
| **එකතුව** | **22.00** | **86.90** |

**වගුව 2.19 - සුපෝෂණ වන වගා නඩත්තු කිරීම.**

| **දිස්ත්‍රික්කය** | **ඉලක්කය (හෙක්.)** | **ප්‍රගතිය (හෙක්.)** |
|---|---|---|
| රත්නපුර | 15.00 | 15.00 |
| **එකතුව** | **15.00** | **15.00** |

## 2.5.8. මිනුම් කිරීම සහ මායිම් සලකුණු කිරීම

සිදුකරන ලද ක්‍රියාකාරකම් වල තොරතුරු 2.20 වගුව මගින් දැක්වේ.

**වගුව 2.20 මිනුම් කිරීම සහ මායිම් සලකුණු කිරීම.**

| **දිස්ත්‍රික්කය** | **ඉලක්කය (කි.මී.)** | **ප්‍රගතිය (කි.මී.)** |
|---|---|---|
| මාතර | 30.00 | 30.00 |
| ගාල්ල | 20.50 | 12.00 |
| කෑගල්ල | - | 5.00 |
| රත්නපුරය | 50.00 | 45.00 |
| අම්පාර | 90.00 | 94.90 |
| ත්‍රිකුණාමලය | 30.00 | 32.00 |

| දිස්ත්‍රික්කය | ඉලක්කය (කි.මී.) | ප්‍රගතිය (කි.මී.) |
|---|---|---|
| මඩකලපුව | 30.00 | 30.00 |
| මන්නාරම | 20.00 | 20.00 |
| කිලිනොච්චිය | 30.00 | 30.00 |
| වවුනියාව | 35.00 | 35.00 |
| මුලතිව් | 45.00 | 45.00 |
| මහනුවර | 25.30 | 13.00 |
| බදුල්ල | 20.00 | 23.50 |
| නුවරඑළිය | 28.00 | 37.00 |
| මොණරාගල | 25.00 | 27.60 |
| කුරුණෑගල | 26.00 | 26.00 |
| කළුතර | 30.50 | 72.90 |
| ගම්පහ | 15.00 | 15.00 |
| **එකතුව** | **550.30** | **593.90** |

**වගුව 2.21 ස්වභාවික වනාන්තර මිණුම් කිරීම . - 2013**

| දිස්ත්‍රික්කය | ඉලක්කය (කි.මී.) | ප්‍රගතිය (කි.මී.) |
|---|---|---|
| මාතර | 22.00 | 25.00 |
| කළුතර | 35.00 | 8.50 |
| නුවරඑළිය | 33.00 | 93.75 |
| **එකතුව** | **90.00** | **127.25** |

### 2.5.9 මධ්‍යම කඳුකරයේ කඳු මුදුන් සංරක්ෂණය කිරීම - 2013

පහත සදහන් දිස්ත්‍රික්ක වල හෙක්ටයාර 244.3 ක භූමි ප්‍රමාණයක කඳු මුදුන් වන වගා ස්ථාපනය කර සංරක්ෂණය කරන ලදි.
(වගුව 2.22)

**වගුව 2.22 මධ්‍යම කඳුකරයේ කඳු මුදුන් සංරක්ෂණය කිරීම. - 2013**

| දිස්ත්‍රික්කය | ඉලක්කය (කි.මී.) | ප්‍රගතිය (කි.මී.) |
|---|---|---|
| රත්නපුරය | 20.00 | 26.00 |
| මහනුවර | 50.00 | 50.00 |
| නුවරඑළිය | 60.00 | 102.30 |
| බදුල්ල | 50.00 | 60.00 |
| කෑගල්ල | - | 6.00 |
| **එකතුව** | **180.00** | **244.30** |

**2.5.9.1 මධ්‍යම කඳුකරයේ කඳු මුදුන් වන වගා නඩත්තු කිරීම**

පහත සදහන් දිස්ත්‍රික්ක වලට අයත් මධ්‍යම කදුකරයේ මුහුදු මට්ටමේ සිට මීටර් 1200 කට වඩා ඉහලින් පිහිටි, 2012 වසරේදී ස්ථාපනය කරන ලද කඳු මුදුන් වන වගා හෙක්ටයාර 05 ක බිම් ප්‍රමාණයක් නඩත්තු කරන ලදී. (වගුව 2.23)

**වගුව 2.23 2012 වසරේදී මධ්‍යම කඳුකරයේ කඳුමුදුන් වල ස්ථාපනය කරන ලද වන වගා නඩත්තු කිරීම.**

| දිස්ත්‍රික්කය | ඉලක්කය (හෙක්) | ප්‍රගතිය (හෙක්.) |
|---|---|---|
| රත්නපුරය | 5.00 | - |
| කෑගල්ල | 5.00 | 5.00 |
| **එකතුව** | **10.00** | **5.00** |

පහත සදහන් දිස්ත්‍රික්ක වලට අයත් මධ්‍යම කදුකරයේ මුහුදු මට්ටමේ සිට මීටර් 1200 කට වඩා ඉහලින් පිහිටි 2011 වසරේදී ස්ථාපනය කරන ලද, කඳු මුදුන් වන වගා හෙක්ටයාර 311 ක් නඩත්තු කරන ලදී. (වගුව 2.24)

**වගුව 2.24 මධ්‍යම කඳුකරයේ කඳු මුදුන් වල 2011 දී ස්ථාපනය කරන ලද වන වගා නඩත්තු කිරීම.**

| දිස්ත්‍රික්කය | ඉලක්කය (හෙක්) | ප්‍රගතිය (හෙක්.) |
|---|---|---|
| නුවරඑළිය | 120.00 | 120.00 |
| බදුල්ල | 151.00 | 151.00 |
| මහනුවර | 20.00 | 20.00 |
| රත්නපුරය | 10.00 | 10.00 |
| කෑගල්ල | 10.00 | 10.00 |
| **එකතුව** | **311.00** | **311.00** |

පහත දැක්වෙන දිස්ත්‍රික්ක වල කඳු මුදුන් වන වගා නඩත්තු කරන ලදි. ( වගුව 2.25)

**වගුව 2.25 මධ්‍යම කදුකරයේ කඳු මුදුන් වල 2010 දී ස්ථාපනය කරන ලද බිම් නඩත්තු කිරීම.**

| දිස්ත්‍රික්කය | ඉලක්කය (හෙක්) | ප්‍රගතිය (හෙක්.) |
|---|---|---|
| නුවරඑළිය | 5.50 | 5.50 |
| බදුල්ල | 25.00 | 25.00 |
| **එකතුව** | **30.50** | **30.50** |

**2.5.10 වන වගා වල මාර්ග නඩත්තු කිරීම**

වගුව 2.26 මගින් දක්වා ඇති අන්දමට කි.මී. 24.5 ක් වූ වන වගා වල මාර්ග නඩත්තු කරන ලදී.

**වගුව 2.26 වන වගා වල මාර්ග නඩත්තු කිරීම - 2013**

| දිස්ත්‍රික්කය | ඉලක්කය (කි.මී.) | ප්‍රගතිය (කි.මී.) |
|---|---|---|
| මුලතිව් | 4.00 | 4.00 |
| කුරුණෑගල | 0.50 | 1.00 |
| ගම්පහ | 0.10 | 0.10 |
| කළුතර | 1.30 | 1.30 |
| බදුල්ල | 6.00 | 6.50 |
| නුවරඑළිය | 28.00 | 29.00 |
| **එකතුව** | **39.90** | **41.9** |

**2.5.11 පයිනස් වන වගා බිම් වලින් ඔලියො රෙසින් නිස්සාරණය කිරීම. - 2013**

පහත සඳහන් පුද්ගලික අංශයේ සංවිධාන හය, සිය වාණිජ මට්ටමේ රෙසින් නිස්සාරණය කිරීමේ ගිවිසුම් දීර්ඝ කරන ලදී. වැඩිදුර තොරතුරු වගුව 2.27 මගින් දැක්වේ.

i. කොනිෆර් ප්‍රොඩක්ට්ස් ප්‍රොසෙසින් (පුද්ගලික) සමාගම
ii. ඔරියන්ටල් රෙසින් (පුද්ගලික) සමාගම
iii. පයනියර් ලංකා පයිනස් (පුද්ගලික) සමාගම
iv. ජේ.සී.ටී. කෙමිකල්ස් (පුද්ගලික) සමාගම
v. චිලව් මෝබයිල්
vi. ග්‍රීන් ෆ්රෙන්ඩ්ස්

**වගුව 2.27 2013 වසරේදී බදු දුන් ඉඩම් ප්‍රමාණය සහ බදු ආදායම**

| සංවිධානයේ නම | බදු දුන් ඉඩම් ප්‍රමාණය (හෙක්.) | බදු ආදායම (රුපියල්) |
|---|---|---|
| **1.** කොනිෆර් ප්‍රොඩක්ට්ස් ප්‍රොසෙසින් (පුද්) සමාගම | 209.80 | 965,258.20 |
| **2.** පයනියර් ලංකා පයිනස් (පුද්) සමාගම | 1,291.40 | 4,595,007.35 |
| **3.** ඔරියන්ටල් රෙසින්ස් (පුද්) සමාගම | 1,005.34 | 3,676,358.74 |
| **4.** ජේ.සී.ටී. කෙමිකල්ස් (පුද්) සමාගම | 299.10 | 1,032,194.10 |
| **5.** චිලව් මෝබයිල් | 35.00 | 256,235.00 |
| **6.** ග්‍රීන් ෆ්‍රෙන්ඩ්ස් | 30.30 | 111,245.84 |
| **එකතුව** | **2,870.04** | **10,636,299.23** |

**2.5.12 2013 වසර සඳහා රාජ්‍ය භාණ්ඩාගාරයට ගෙවිය යුතු ස්කන්ධ භාගය**

**2013** වසර සඳහා රාජ්‍ය දැව සංස්ථාව විසින් රාජ්‍ය භාණ්ඩාගාරයට ගෙවිය යුතු සම්පූර්ණ ස්කන්ධ භාගය රු.694,952,297.59 කි. මෙයට වන වගා කළමනාකරණ තුලින් ලබාගත් දැව (රු.66,035,316.19 ) පුනර්ජනන හෙළීම් මගින් ලබාගත් දැව (රු.623,932,987.08) සහ වන අපරාධ වලින් අත්පත් කර ගෙන රාජ්‍ය දැව සංස්ථාවට ලබාදුන් දැව (රු.4,983,994.32) අයත් වේ.

**2.5.13 පෞද්ගලික අංශයේ නැවත වන වගා කිරීම.**

පෞද්ගලික අංශයේ සම්පත්, වන වගා සංවර්ධනයට උපයෝගි කර ගැනීමේ අරමුණින් පෞද්ගලික අංශයේ නැවත වන වගා කිරීමේ වැඩසටහන නිර්මාණය කර තිබේ. මෙම වැඩසටහනේ අදියර දෙකකින් 2000 වසරේදී සහ 2002 වසරේදී දියත් කරන ලදී. 2013 වසරේදී පුද්ගලික අංශය සමග ඇති කර ගත් ගිවිසුම් 2.28 වගුව මගින් දැක්වේ.

**වගුව : 2.28 2013 වසරේ පුද්ගලික අංශයේ නැවත වන වගා කිරීමේ වැඩසටහනේ තත්වය**

| දිස්ත්‍රික්කය | අඩවිය | ගිවිසුම් අංකය | විශේෂය | අදියර | | ප්‍රමාණය (හෙක්.) |
|---|---|---|---|---|---|---|
| | | | | I | II | |
| කුරුණෑගල | ගල්ගමුව | 1070 | තේක්ක | ✓ | | 17.80 |
| | ගල්ගමුව | 1108 | තේක්ක | ✓ | | 11.142 |
| | ගල්ගමුව | 1091 | තේක්ක | ✓ | | 6.244 |

| දිස්ත්‍රික්කය | අඩවිය | ගිවිසුම් අංකය | විශේෂය | අදියර | | ප්‍රමාණය (හෙක්.) |
|---|---|---|---|---|---|---|
| | | | | I | II | |
| අනුරාධපුරය | අනුරාධපුරය | 2002/01 | තේක්ක | | ✓ | 40.00 |
| | අනුරාධපුරය | 2002/09 | තේක්ක | | ✓ | 83.00 |
| | කැකිරාව | 2002/07 | තේක්ක | | ✓ | 35.00 |
| | කැකිරාව | 2002/05 | තේක්ක | | ✓ | 4.00 |
| | අනුරාධපුරය | 2002/12 | තේක්ක | | ✓ | 4.00 |
| | අනුරාධපුරය | 17 | තේක්ක | ✓ | | 20.234 |
| | කැකිරාව | 371 | තේක්ක | ✓ | | 15.00 |
| | කැකිරාව | 177 | තේක්ක | ✓ | | 4.00 |
| | කැකිරාව | 234 | තේක්ක | ✓ | | 14.77 |
| | අනුරාධපුරය | 201 | තේක්ක | ✓ | | 10.20 |
| | අනුරාධපුරය | 230 | තේක්ක | ✓ | | 4.02 |
| | අනුරාධපුරය | 168 | තේක්ක | ✓ | | 6.02 |
| පොළොන්නරුව | හබරණ | 2002/26 | මිශ්‍ර විශේෂ | | ✓ | 47.00 |
| මාතලේ | නාඋල | 1180 | තේක්ක | ✓ | | 9.50 |
| | නාඋල | 1228 | තේක්ක | ✓ | | 4.00 |
| | නාඋල | 2002/15 | තේක්ක | | ✓ | 3.00 |
| | නාඋල | 2002/20 | තේක්ක / කායා | | ✓ | 90.00 |
| | නාඋල | 2002/18 | තේක්ක | | ✓ | 5.00 |
| | නාඋල | 2002/16 | තේක්ක | | ✓ | 4.00 |
| **එකතුව** | | | | **12** | **10** | **437.93** |

### 2.5.14 සංචාරක බංගලා වලින් ලද ආදායම- 2013

සංචාරක බංගලා, සංරක්ෂණ මධ්‍යස්ථාන, නැරඹුම් කුටි සහ කඳවුරු බිම් මහජනතාවට පරිහරනය සදහා ලබා දීමෙන් රුපියල් 7,813,369.40 ක මුදලක් උපයා ගන්නා ලදී.මේ පිළිබඳ වැඩිදුර තොරතුරු වගුව 2.29 හි දක්වා තිබේ.

**වගුව : 2.29 සංචාරක බංගලා වලින් ලද ආදායම - 2013**

| සංචාරක බංගලාවේ නම | ආදායම (රුපියල්) |
|---|---|
| උඩවත්තකැලේ සංචාරක බංගලාව | 65,908.00 |
| ඩීන්ස්ටන් කදවුරු බිම | 186,592.00 |
| ඩීන්ස්ටන් සංරක්ෂණ මධ්‍යස්ථානය | 173,275.00 |
| ඉළුක්කුඹුර දුම්බර වන නිවහන | 653,808.00 |
| තෙල්ගමුඔය සංචාරක බංගලාව | 529,986.00 |
| රඹුක්ඔලුව කඳවුරු භූමිය | 281,332.00 |
| වීරබැද්ද සංචාරක බංගලාව | 1,680.00 |
| හාලි ඇල සංචාරක බංගලාව | 44,688.00 |
| හපුතලේ සංචාරක බංගලාව | 48,384.00 |
| ඔහිය සංචාරක බංගලාව | 33,152.00 |
| කන්දෙඇල සංචාරක බංගලාව | 525,056.00 |
| නුවරඑළිය සංචාරක බංගලාව | 130,534.00 |
| පට්ටිපොල සංචාරක බංගලාව | 157,352.00 |
| කතරගම සංචාරක බංගලාව | 102,808.00 |
| තණමල්විල සංචාරක බංගලාව | 33,532.00 |
| අනුරාධපුරය සංචාරක බංගලාව | 123,928.00 |

| **සංචාරක බංගලාවේ නම** | **ආදායම (රුපියල්)** |
|---|---|
| මින්නේරිය සංචාරක බංගලාව | 106,624.00 |
| මින්නේරිය ක්ෂේත්‍ර පරීක්ෂණ මධ්‍යස්ථානය | 41,664.00 |
| හිරිකටුඔය කඳවුරු භූමිය | 347,984.00 |
| කෙටේතැන්න සංචාරක බංගලාව | 3,360.00 |
| මුරකැලේ වත්ත සංචාරක බංගලාව | 141,298.00 |
| සිංහරාජ සංරක්ෂණ මධ්‍යස්ථානය (කුඩව) | 393,657.60 |
| සිංහරාජ සංරක්ෂණ මධ්‍යස්ථානය (කුඩව) නැරඹුම් කුටි | 552,709.80 |
| සිංහරාජ ක්ෂේත්‍ර පරීක්ෂණ මධ්‍යස්ථානය | 10,332.00 |
| සිංහරාජ ( මෝනිංසයිඩ්) සංචාරක බංගලාව | 216,160.00 |
| සිංහරාජ සංරක්ෂණ මධ්‍යස්ථානය (පිටදෙනිය) | 887,378.00 |
| ගිංගඟ සංචාරක බංගලාව | 192,864.00 |
| නාදුගල සංචාරක බංගලාව | 15,120.00 |
| කන්නෙලිය සංරක්ෂණ මධ්‍යස්ථානය | 1,716,947.00 |
| වැකුණගොඩ සංචාරක බංගලාව | 3,472.00 |
| හම්බන්තොට සංචාරක බංගලාව | 42,112.00 |
| තබ්බෝව සංචාරක බංගලාව | 16,296.00 |
| කුඹල්පොල සංචාරක බංගලාව | 33,376.00 |
| **එකතුව** | 7,813,369.40 |

### 2.5.15 මූල්‍යමය ප්‍රගතිය - 2013

අදාල වර්ෂය තුලදී සියළුම වන සංගණන සහ කළමනාකරණ කටයුතු සඳහා රුපියල් මිලියන 272,000,000.00ක මුදලක් ලැබී තිබූ අතර ඉන් රුපියල් මිලියන 271,769,681.99 ක මුදලක් වියදම් කර තිබේ. මේ පිළිබඳව වැඩිදුර තොරතුරු වගුව 2.30 මගින් දැක්වේ.

**වගුව 2.30 වන සංගණන සහ කළමනාකරණ අංශයේ මූල්‍යමය ප්‍රගතිය - 2013**

| ක්‍රියාකාරකම | ප්‍රතිපාදන (රු.) | වියදම (රු) | වියදම් ප්‍රතිශතය |
|---|---|---|---|
| පරිහානියට පත්වූ වන වගා පුනරුත්ථාපනය කිරීම. | 3,000,000.00 | 2,999,953.00 | 99.99 |
| සුපෝෂණ වන වගා නඩත්තු කිරීම. | 2,850,000.00 | 2,774,301.00 | 97.34 |
| ස්වාරක්ෂක කලාප වන වගා නඩත්තු කිරීම. | 2,150,000.00 | 2,136,896.32 | 99.39 |
| පැරණි වන වගා කළමනාකරණය කිරීම (වන විද්‍යාත්මක ප්‍රතිකර්ම) | 25,000,000.00 | 24,996,975.00 | 99.98 |
| පුනර්ජනන හෙලීම් සිදු කල ප්‍රදේශ වල නැවත වන වගා කිරීම. | 62,000,000.00 | 61,977,770.04 | 99.96 |
| මිණුම් කිරීම සහ ස්කන්ධභාග ගණනය කිරීම. | 4,000,000.00 | 3,912,904.69 | 97,82 |
| බීජ සහ පොලිතීන් සදහා වියදම. | 5,000,000.00 | 4,988,668.09 | 99.77 |
| නොමේරූ වන වගා නඩත්තු කිරීම. | 100,000,000.00 | 99,997,544.89 | 99.99 |
| වනාන්තර වල මායිම් නඩත්තු කිරීම. | 30,000,000.00 | 29,987,283.96 | 99.95 |
| වන වගා වල මාර්ග නඩත්තු කිරීම. | 3,000,000.00 | 2,999,430.00 | 99.98 |
| මධ්‍යම කඳුකරයේ කඳු මුදුන් සංරක්ෂණය කිරීම. | 16,000,000.00 | 16,000,000.00 | 100 |
| මධ්‍යම කඳුකරයේ කඳු මුදුන් නඩත්තු කිරීම. | 19,000,000.00 | 18,997,955.00 | 99.98 |
| **එකතුව** | **272,000,000.00** | 271,769,681.99 | **99.91** |

### 2.5.16 වන වගා වලින් ලද අස්වැන්න

අදාළ වර්ෂය තුලදී සිදුකරන ලද විවිධ දැව හෙලීම් සහ වන විද්‍යාත්මක ප්‍රතිකර්ම මගින් ලබාගත් දැව ප්‍රමාණය සාරාංශයක් ලෙස වගුව 2.31 මගින් දැක්වේ. මෙම ක්‍රියාකාරකම් වලට පූර්ව වාණිජමය තුනී කිරීම්, වාණිජමය තුනී කිරීම්, පුනර්ජනන හෙලීම් සහ වරණීය හෙලීම් ඇතුලත් වේ. ආරක්ෂක හේතූන් මත රටේ උතුරු - නැගෙනහිර ප්‍රදේශ වල ඇතැම් වනාන්තර හෙළි කිරීමේදී ලද දැව සහ කුඩා පරිමාණයේ සංවර්ධන ව්‍යාපෘති සඳහා වනාන්තර හෙළිකිරීමෙන් ලද දැවද මෙයට ඇතුලත් වේ. 2013 වසර තුලදී රජයේ වනාන්තර වලින් ලබාගත් සියළුම දැව වල අලෙවි වටිනාකම රුපියල් 1,791,302,143.40 කි.

වගුව 2.31 වන සම්පත් වලින් ලද ආදායම - 2013

| දැව වර්ගය | තුනී කිරීම් වලින් ලද අස්වැන්න (ඝන මීටර් ) | පුනර්ජනන හෙලීම් මගින් ලද අස්වැන්න (ඝන මීටර්) | සම්පූර්ණ අස්වැන්න (ඝන මීටර්) | වෙළඳපොල වටිනාකම (රුපියල්) |
|---|---|---|---|---|
| තේක්ක කඳන් ($m^3$) | 231.9 | 32,729 | 32,960.90 | 1,182,834,857.40 |
| නැදුන් කඳන්($m^3$) | - | - | - | - |
| මැහෝගනී කඳන්($m^3$) | 42 | 3 | 45 | 1,213,110.00 |
| මිල්ල කඳන් ($m^3$) | - | 103 | 103 | 1,529,241.00 |
| විශේෂ කඳන් ($m^3$) | 191.23 | 71.77 | 263 | 3,254,625.00 |
| I වන පන්තියේ දැවකඳන්($m^3$) | 725.28 | 36.72 | 762 | 7,254,240.00 |
| II වන පන්තියේ දැව කඳන් ($m^3$) | 2,416.25 | 1,777.76 | 4,194 | 67,881,987.00 |
| III වන පන්තියේ දැව කඳන්($m^3$) | 224 | 30 | 254 | 958,342.00 |
| පයිනස් කඳන්($m^3$) | 4,356 | 13,422 | 17,778 | 256,909,878.00 |
| සිල්පර කොටන් (සංඛ්‍යාව) | - | 2,142 | 2,142 | 23,052,204.00 |
| විදුලි කණු (සංඛ්‍යාව) | 23,660 | 6,505 | 30,165 | 205,845,960.00 |
| දර**($m^3$)** | 1,632 | 49,144 | 50,776 | 22,950,752.00 |
| වැට කණු (සංඛ්‍යාව) | 8,378 | 77,490 | 85,868 | 7,813,988.00 |
| වට කණු (සංඛ්‍යාව) | 11,335 | 84,688 | 96,023 | 9,602,300.00 |
| පිට පළු (සංඛ්‍යාව) | - | 3,401 | 3,401 | 200,659.00 |
| **එකතුව** | | | | **1,791,302,143.40** |

# 03 වන පරිච්ඡේදය
# පරිසර කළමනාකරණ අංශය

## 3.1 හැඳින්වීම

වන ප්‍රතිපත්තියේ මූලික අරමුණක් වන පාරිසරික පද්ධතීන් සංරක්ෂණය කිරීමේ අරමුණ මත පිහිටමින්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තු පාලනයේ පවත්නා සියළු පරිසර පද්ධතීන්හි ජෛව විවිධත්වය, පස, ජලය, ඓතිහාසික, සංස්කෘතික ආගමික හා සෞන්දර්යාත්මක අගයයන් සංරක්ෂණය කරමින් කළමනාකරණය කිරීම මෙම අංශයේ ප්‍රධාන වගකීම වේ.

## 3.2 ප්‍රධාන ක්‍රියාකාරකම්

- ප්‍රකාශිත සිංහරාජ හා නකල්ස් ලෝක උරුම වන භූමින්වල පවත්නා විශ්වීය වටිනාකම් වලට හානි නොවන සේ ඒවා රැකගනිමින් කළමනාකරණ කටයුතු සිදු කිරීම.

- මිනිසා හා ජෛවගෝල සංරක්ෂිත වනාන්තර කළමනාකරණ කටයුතු සිදු කිරීම.

- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශිත සංරක්ෂිත හා රක්ෂිත වනාන්තරවල කළමනාකරණ කටයුතු සිදු කිරීම .

- වන සංරක්ෂණ දෙපාර්තමේන්තු පාලනයේ පවත්නා භූමීන් තුල සිදු කිරීමට යෝජිත අත්‍යාවශ්‍ය සංවර්ධන කාර්යයන් සඳහා ජාතික පාරිසරික පනතට අනුව, සිදු කෙරෙන පාරිසරික ඇගයීම් ක්‍රියාවලියේදී ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනය ලෙසින් කටයුතු කරමින්, අවම පරිසර හානියකින් හා එමගින් සිදුවන හානිය අවම කිරීමට සුදුසු කොන්දේසි පනවමින් පාරිසරික අනුමැතීන් ලබාදීම.

- පාරිසරික ඇගයීම් ක්‍රියාවලියේදී, පාරිසරික ඇගයීම් තාක්ෂණික කමිටු සාමාජිකයෙකු ලෙස කටයුතු කරමින් පරිසර හානි අවම කර ගැනීම සඳහා නිර්දේශ ලබාදීම.

- පාරිසරික සංචාරක කර්මාන්තය සඳහා විභවයක් ඇති ස්ථානවල පාරිසරික සංචාරක ව්‍යාපාරය වැඩි දියුණු කිරීමට කටයුතු කිරීම තුලින් ජාතික ආර්ථිකය ඉහළ නැංවීම.

- කඩොලාන පරිසර පද්ධතීන් සංරක්ෂණය හා කළමනාකරණය කිරීම.

- වන සංරක්ෂණ දෙපාර්තමේන්තු පාලනයේ ඇති ස්වභාවික සෞන්දර්ය සහිත ස්ථානවල සුදුසු කොන්දේසි මත රූගත කිරීම් සඳහා අවසර දීම හා එමගින් ජාතික ආදායම ඉහළ නැංවීම.

- ජාතික සංරක්ෂණ විමසුම මගින් හඳුනාගෙන ඇති ප්‍රමුඛ පරිසර පද්ධතීන් සංරක්ෂණ හා කළමනාකරණය.

- වනාන්තර පරිසර පද්ධතීන්ගේ ආරක්ෂාව හා පැවැත්ම තහවුරු කිරීම සඳහා එම පද්ධතීන්ට යාව හා මැදිව ඇති පුද්ගලික ඉඩම් පවරා ගැනීමට කටයුතු කිරීම.

- පුහුණු හා අධ්‍යාපනික වැඩසටහන් මගින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයේ පරිසර කළමනාකරණ ගැටළු හඳුනා ගැනීම හා විසඳීමේ හැකියාව වැඩි දියුණු කිරීම.

### 3.3 ආයතනික සැකැස්ම

පරිසර කළමනාකරණ අංශය, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය වන සංරක්ෂකවරයකු යටතේ ක්‍රියාත්මක වේ.

මෙයට අමතරව ක්ෂේත්‍ර කටයුතු අදාල කලාප නියෝජ්‍ය වන සංරක්ෂකවරුන්, දිසා වන නිළධාරීන් හා ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය මගින් සිදු කරනු ලබයි.

### 3.4. වාර්ෂික ක්‍රියාකාරකම්

ඉහත 3. 2 ට අදාළව, පහත සදහන් ක්‍රියාකාරකම් සිදු කර ඇත.

#### 3.4.1 ලෝක උරුම වන භූමීන් නඩත්තුව හා කළමනාකරණය

(i) සිංහරාජ, නකල්ස් ලෝක උරුම වන භූමීන්ගේ පවත්වා ගෙන යනු ලබන ස්වභාවික මංපෙත්, නවාතැන් ඇතුළු සියළු පහසුකම් නඩත්තු කරමින් පවත්වා ගෙන යාම.

(ii) මෙම ස්ථාන නැරඹීමට පැමිණෙන පාසල් සිසුන් ඇතුළු සියළු කණ්ඩායම් දැනුවත් කිරීමේ වැඩසටහන් හා මාර්ගෝපදේශ පහසුකම් සැපයීම.

#### 3.4.2. සංරක්ෂණ මධ්‍යස්ථාන කළමනාකරණය

කන්නෙලිය, කොට්ටව, උඩවත්තකැලේ, ඔලියගන්කැලේ හා කුරුළුකැලේ යන සංරක්ෂණ මධ්‍යස්ථාන වල හා හපුතලේ උද්‍යානයේ අවශ්‍ය පහසුකම් නඩත්තු හා වැඩි දියුණු කරමින් පවත්වා ගෙන යාම.

#### 3.4.3. හුරුළු පාරිසරික උද්‍යානය

හුරුළු පාරිසරික උද්‍යානයේ සියළුම පහසුකම් වැඩි දියුණු කරමින් හා නඩත්තු කරමින් පවත්වා ගෙන යාම.

#### 3.4.5 සංචාරකයින්ගේ තොරතුරු සහ ඔවුන්ගෙන් ප්‍රවේශ ගාස්තු ලෙස එකතු කල ආදායම

සංචාරකයින්ගේ තොරතුරු සහ ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමෙන් රැස්කරන ලද ආදායම වගුව 3.1 (අ) – 3.1 (ඌ) මගින් දැක්වේ.

**වගුව 3.1. (අ) උඩවත්ත කැලේ ( මහනුවර)**

| අමුත්තන් වර්ගය | අමුත්තන් සංඛ්‍යාව | ප්‍රවේශ ගාස්තු ලෙස රැස්කල ආදායම (රුපියල්) |
|---|---|---|
| පාසැල් සිසුන් | 1,505 | |
| දේශීය ළමුන් | 457 | |
| දේශීය වැඩිහිටි | 6,635 | **2,819,895.86** |
| විදේශීය ළමුන් | 125 | |
| විදේශීය වැඩිහිටි | 3,886 | |
| **එකතුව** | **12,608** | |

වගුව 3.1. (ආ) නකල්ස් වනාන්තරය (ඩීන්ස්ටන් , මහනුවර)

| අමුත්තන් වර්ගය | අමුත්තන් සංඛ්‍යාව | ප්‍රවේශ ගාස්තු ලෙස රැස්කල ආදායම (රුපියල්) |
|---|---|---|
| පාසල් සිසුන් | - | |
| දේශීය වැඩිහිටි | 2,103 | |
| දේශීය ළමුන් | 10 | **506,307.20** |
| විදේශීය ළමුන් | 15 | |
| විදේශීය වැඩිහිටි | 730 | |
| **එකතුව** | **2,858** | |

වගුව 3.1. (ඇ) නකල්ස් වනාන්තරය (පිටවලපතන , මාතලේ )

| අමුත්තන් වර්ගය | අමුත්තන් සංඛ්‍යාව | ප්‍රවේශ ගාස්තු ලෙස රැස්කල ආදායම (රුපියල්) |
|---|---|---|
| පාසල් සිසුන් | 1,219 | |
| දේශීය වැඩිහිටි | 17,854 | |
| දේශීය ළමුන් | 1,248 | **617,844.00** |
| විදේශීය ළමුන් | 12 | |
| විදේශීය වැඩිහිටි | 252 | |
| **එකතුව** | **20,585** | |

වගුව 3.1. (ඈ) සිංහරාජ වනාන්තරය ( පිටදෙනිය, මාතර )

| අමුත්තන් වර්ගය | අමුත්තන් සංඛ්‍යාව | ප්‍රවේශ ගාස්තු ලෙස රැස්කල ආදායම (රුපියල්) |
|---|---|---|
| පාසල් සිසුන් | 0 | |
| දේශීය ළමුන් | 457 | |
| දේශීය වැඩිහිටි | 6,051 | **2,395,488.00** |
| විදේශීය ළමුන් | 587 | |
| විදේශීය වැඩිහිටි | 4,162 | |
| **එකතුව** | 11,**257** | |

වගුව 3.1. (ඉ) සිංහරාජ වනාන්තරය ( කුඩව, රත්නපුර )

| අමුත්තන් වර්ගය | අමුත්තන් සංඛ්‍යාව | ප්‍රවේශ ගාස්තු ලෙස රැස්කල ආදායම (රුපියල්) |
|---|---|---|
| පාසල් සිසුන් | 8,640 | |
| දේශීය ළමුන් | 12,498 | |
| දේශීය වැඩිහිටි | 2,141 | **4,188,244.68** |
| විදේශීය ළමුන් | 5,654 | |
| විදේශීය වැඩිහිටි | 168 | |
| **එකතුව** | **29,101** | |

වගුව 3.1. (ඊ) හුරුළු පාරිසරික උද්‍යානය ( හබරණ , පොළොන්නරුව)

| අමුත්තන් වර්ගය | අමුත්තන් සංඛ්‍යාව | ප්‍රවේශ ගාස්තු ලෙස රැස්කල ආදායම (වාහනද ඇතුළුව) (රුපියල්) |
|---|---|---|
| දේශීය ළමුන් | 612 | |
| දේශීය වැඩිහිටි | 23,167 | |
| විදේශීය ළමුන් | 757 | **26,671,474.00** |
| විදේශීය වැඩිහිටි | 13,269 | |
| **එකතුව** | **47,128** | |

වගුව 3.1. (උ) කොට්ටව වනාන්තරය (ගාල්ල)

| අමුත්තන් වර්ගය | අමුත්තන් සංඛ්‍යාව | ප්‍රවේශ ගාස්තු ලෙස රැස්කල ආදායම (රුපියල් ) |
|---|---|---|
| පාසල් සිසුන් | 28 | |
| දේශීය ළමුන් | 191 | |
| දේශීය වැඩිහිටි | 226 | **204,527.40** |
| විදේශීය ළමුන් | 55 | |
| විදේශීය වැඩිහිටි | 269 | |
| **එකතුව** | **769** | |

වගුව3.1. (ඌ) කන්නෙලිය වනාන්තරය (ගාල්ල )

| අමුත්තන් වර්ගය | අමුත්තන් සංඛ්‍යාව | ප්‍රවේශ ගාස්තු ලෙස රැස්කල ආදායම (රුපියල් ) |
|---|---|---|
| පාසල් සිසුන් | 5,681 | |
| දේශීය ළමුන් | 1,771 | |
| දේශීය වැඩිහිටි | 22,795 | **1,242,293.12** |
| විදේශීය ළමුන් | 49 | |
| විදේශීයවැඩිහිටි | 853 | |
| **එකතුව** | **31,149** | |

සම්පූර්ණ ආදායම රුපියල් 38,646,074.26 කි.

### 3.4.5. වනාන්තර තුල රූගත කිරීම් වලින් ලද ආදායම.

දෙපාර්තමේන්තුව මගින් කළමනාකරණය කරනු ලබන රක්ෂිත වනාන්තර තුල වීඩියෝ රූගත කිරීම් මගින් රුපියල් 291,256.00 ක ආදායමක් උපයා තිබුණි.

**3.4.6 පරිසර බලපෑම් ඇගයීම**

2004 වසරේ සිට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, රජයේ වනාන්තර භූමීන් වල ක්‍රියාත්මක විවිධ සංවර්ධන ව්‍යාපෘති වලින් සිදුවන පාරිසරික බලපෑම් ඇගැයීම සඳහා වන, ව්‍යාපෘති අනුමත කිරීමේ නියෝජිත ආයතනයක් ලෙස පත් කර තිබේ. ඒ අනුව 2007, 2008, 2009, 2010, 2011 සහ 2012 වසර සඳහා පාරිසරික අනුමැතිය ලබා ගැනීම සඳහා විවිධ ව්‍යාපෘති යෝජනා 30 ක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබේ.

මෙම යෝජනා අතරින් යෝජනා 02 ක් සඳහා මෙම වසරේදී පරිසර අනුමැතිය ලබා දී ඇත. (වගුව 3.2) පසුගිය වසර වල පරිසර අනුමැතිය ලබා දුන් විවිධ ව්‍යාපෘතින් ඒවායේ පනවනු ලැබූ කොන්දේසි යටතේ සිදු කරනු ලබන බවට අධීක්ෂණ කටයුතු සිදු කර ඇත. පාරිසරික අනුමැතිය ඉල්ලා යොමු කරන ලද අනෙකුත් ව්‍යාපෘති යෝජනා සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කෙරෙමින් පවතී.

**වගුව 3. 2**

| **අනු අංකය** | **අනුමත කල ව්‍යාපෘති ලැයිස්තුව** |
|---|---|
| 01 | ආඳා දොළ කුඩා ජල විදුලි ව්‍යාපෘතිය, ගාල්ල |
| 02 | කළුගල් ව්‍යාපෘතිය, දමන අම්පාර. |

මීට අමතරව, මෙම වසරේදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ආරම්භ කරන නිර්දේශිත ව්‍යාපෘති 50 ක් සම්බන්ධයෙන් වන තාක්ෂණික ඇගැයීම් කමිටු සාමාජිකයෙකු ලෙසද කටයුතු කර ඇත.

**3.4.7. පාරිසරික තොරතුරු කළමනාකරණ පද්ධතිය**

ස්වාභාවික වනාන්තරවල ජෛව විවිධත්ත්වය, පස, ජලය ආදී තොරතුරු එක් රැස් කර සිදු කරන ලද ජාතික සංරක්ෂණ විමසුමේ දත්ත ආශ්‍රයෙන් පාසල් සිසුන්, පර්යේෂකයින් සහ විවිධ පුද්ගලික සහ රාජ්‍ය අංශවල පුද්ගලයින් යන සියල්ලන්ටම අවශ්‍ය තොරතුරු සපයන ලදී.

**3.4.8. ඉඩම් නීත්‍යානුකූල කිරීම**

වනාන්තර මායිම් නැවත සලකුණු කිරීමේදී දිගු කාලීනව අනවසරව සංවර්ධනය කර තිබීමේ හේතුව නිසා තවදුරටත් වනාන්තර ලෙසට කළමනාකරණය කළ නොහැකි බැවින් වනාන්තර මායිමෙන් බැහැර කරන ලද ඉඩම්, නියමානුකූල කිරීම සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත නිදහස් කරන ලදී.

ජාතික සංවර්ධන වැඩසටහන් සඳහා හෙක්ටයාර 52.95 ක් විවිධ ආයතනවලට පැවරීම සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත නිදහස් කර ඇත.

උතුරු ප්‍රදේශයේ සිටින අවතැන්වූ ජනයා නැවත පදිංචි කිරීම සඳහා අදාල ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත හෙක්ටයාර 1,460 ක් නිදහස් කරන ලදී.

**3.4.9. ඉඩම් අත්පත් කර ගැනීම**

**3.4.9.1. සිංහරාජ ලෝක උරුම වන භූමිය**

සිංහරාජ ලෝක උරුම භූමියේ සංරක්ෂණ කටයුතු සඳහා වූ 2004 වසරේ අංක 04/0858/001/005-111 දරණ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව යටතේ වනාන්තර ඉඩම් අත්පත් කර ගැනීමට අදාල කටයුතු මෙම අංශය විසින් සිදු කරන ලදී. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසන් සභාවට අයත් ගාල්ල, මාතර සහ රත්නපුර යන දිස්ත්‍රික්ක ආවරණය කරන්නා වූ ඉඩම් හෙක්ටයාර 4,520.3 ක් අත්පත් කරගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. 2013 වසර තුලදී ඉඩම් හෙක්ටයාර 48.8 ක භුක්තිය ලබා ගැනීමට හැකිවිය. තවද, සිංහරාජ වනාන්තරයේ ආරක්ෂාව තහවුරු

කිරීමේ අරමුණින් රක්ෂිතයේ මායිම් පුළුල් කිරීම සඳහා පුද්ගලික ඉඩම් හෙක්ටයාර 400 ක් පමණ හඳුනාගෙන තිබේ. 2013 වසරේදී පරිසර සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ පැවති අතිගරු ජනාධිපතිතුමාගේ රැස්වීමෙන් අනතුරුව ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 38 (අ) වගන්තිය යටතේ ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියා පටිපාටිය ඉක්මන් කිරීමට කටයුතු කර ඇත.

### 3.4.9.2 නකල්ස් සංරක්ෂණ වනාන්තරය

මහනුවර සහ මාතලේ යන දිස්ත්‍රික්ක වල පිහිටි නකල්ස් වනාන්තරයට අයත් හෙක්ටයාර 3675.72 ක ඉඩම් ප්‍රමාණයක් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සිදුකෙරෙමින් පවතී. අදාළ අමාත්‍යාංශවලින් ලැබෙන උපදෙස් වලට අනුව අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සිදු කරයි. වැඩිදුර තොරතුරු වගුව 3.3 මගින් දැක්වේ.

**වගුව 3.3 නකල්ස් සංරක්ෂණ වනාන්තරය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම.**

| **විස්තරය** | **මහනුවර දිස්ත්‍රික්කය (හෙක්ටයාර)** | **මාතලේ දිස්ත්‍රික්කය (හෙක්ටයාර)** |
|---|---|---|
| 2012 වසර අවසන් වන විට අත්පත් කර ගැනීමට යෝජිත ඉඩම් ප්‍රමාණය | 2,064.78 | 1,504.49 |
| 2013 වසරේදී ආරම්භ කරන ලද නව ඉඩම් අත්පත් කර ගැනීම් | 0 | 121.06 |
| 2013 වසර අවසාන වන විට අත්පත් කර ගැනීමට යෝජිත මුළු භූමි ප්‍රමාණය | 2,050.17 | 1,625.55 |
| 2013 වසර අවසන්වන විට අත්පත් කරගත් මුළු භූමි ප්‍රමාණය | 384.93 | 451.54 |

2013 වසරේදී පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ පැවති අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රගති සමාලෝචන රැස්වීමෙන් අනතුරුව ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 38(අ) වගන්තිය යටතේ ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියා පටිපාටිය වේගවත් වී තිබේ.

### 3.4.9.3 වන වගා අත්පත් කර ගැනීම

1974 වසරේ සිට මහනුවර සහ නුවරඑළිය යන දිස්ත්‍රික්ක වල ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් තුල ස්ථාපනය කරන ලද වන වගා අත්පත් කර ගැනීමේ කටයුතු සිදු වෙමින් පවතී. පිළිවෙලින් මහනුවර සහ මාතලේ යන දිස්ත්‍රික්ක වලට අයත් වන වගා හෙක්ටයාර 1666.68 ක් සහ 1187.16 වූ වන වගා ප්‍රමාණයක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතුව පවත්නා අතර මේවා අත්පත් කර ගැනීමේ කටයුතු අදාළ අමාත්‍යාංශ වල උපදෙස් අනුව අදාල ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් සිදු කරනු ලැබේ.

# 04 වන පරිච්ඡේදය

## පර්යේෂණ සහ අධ්‍යාපන අංශය

### 4.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ විධිමත්, වන විද්‍යාත්මක පර්යේෂණ කටයුතුවල ආරම්භය සනිටුහන් කරමින්, 1937 වර්ෂයේදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පර්යේෂණ සහ අධ්‍යාපන අංශය, වන විද්‍යාත්මක පර්යේෂණ ඒකකය ලෙස ආරම්භ කරන ලදී. මෙම අංශයට දෙපාර්තමේන්තු බල සීමාව තුල, වන විද්‍යාත්මක පර්යේෂණ කටයුතු පරිපාලනය සහ වන විද්‍යා ක්ෂේත්‍රය හා සම්බන්ධ අධ්‍යාපන කටයුතු ක්‍රියාත්මක කිරීම යන කටයුතුවල වගකීම පැවරී තිබේ.

මෙම අංශය, කුරුණෑගල සහ බදුල්ල යන ස්ථානවල පිහිටි ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථාන, ශ්‍රී ලංකා වන විද්‍යායතනය සහ වන විද්‍යා තොරතුරු ඒකකය යන අංශ වලින් සමන්විත වේ. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පුස්තකාලයද මෙම අංශය යටතේ පවතී.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික පර්යේෂණ වැඩ සටහන්, පර්යේෂණ මධ්‍යස්ථාන හරහා ක්‍රියාත්මක කරනු ලබන අතර, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, රාජ්‍ය දැව සංස්ථාවේ සහ වන වගා කටයුතු වල නිරතව සිටින පුද්ගලික අංශයේ ගැටළු නිරාකරණය කිරීමේලා සෘජුව ක්‍රියා කරයි. මෙම මධ්‍යස්ථාන විසින්, සංරක්ෂණ සහ නිෂ්පාදන වන විද්‍යාව සම්බන්ධව ව්‍යවහාරික සහ අනුවර්තීය පර්යේෂණ කටයුතු සිදු කරයි.

දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සේවයේ කාර්ය මණ්ඩලයේ හැකියාවන් ශක්තිමත් කිරීම සඳහා, ප්‍රධාන වශයෙන්ම වන විද්‍යාව සහ පරිසරය ආශ්‍රිත විෂයන් මත පුහුණු වැඩ සටහන්, නුවරඑළියේ පිහිටා තිබෙන ශ්‍රී ලංකා වන විද්‍යායතනය මගින් සිදු කරනු ලබයි.

වන විද්‍යා තොරතුරු ඒකකය මගින්, වන විද්‍යාව හා සම්බන්ධ පර්යේෂණ වල ප්‍රතිඵල, ඒවා අපේක්ෂාවෙන් සිටින ප්‍රතිලාභ ලබන්නන් වෙත වඩාත් සාර්ථක අන්දමට ලබා දීමේ අරමුණින් ක්‍රියා කරයි. මේ වන විට පුස්තකාලය සතුව ග්‍රන්ථ 7125 ක් පමණද, වාර්තා 365 ක් පමණද, සඟරා 73 ක් පමණද තිබේ.

### 4.2 පර්යේෂණ හා අධ්‍යාපන අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම්

1. පර්යේෂණාත්මක සහ සංවර්ධනාත්මක පරිශ්‍රමයක් තුලින් ජාතික වන ක්ෂේත්‍ර සංවර්ධන වැඩසටහන් සඳහා තාක්ෂණික සහාය ලබාදීම.

2. ජාතික වන ප්‍රතිපත්තියේ අරමුණු කරා ලගාවීමට ශ්‍රී ලංකාව තුල සිදු කරන වන විද්‍යාත්මක පර්යේෂණ සඳහා මගපෙන්වීම, එම කටයුතු සම්බන්ධීකරණය, ප්‍රගතිය පාලනය කිරීම සහ ඇගයීම.

3. වනාන්තර පරිසර පද්ධතියට අදාළ පර්යේෂණ යෝජනා සමාලෝචනය කරන්නාවූද එම පර්යේෂණ කටයුතු සඳහා අවසර ලබාදෙන්නා වූද ජාතික වන ක්ෂේත්‍ර පර්යේෂණ කමිටුවේ රැස්වීම් හා සම්බන්ධව කටයුතු සම්බන්ධීකරණය කිරීම.

4. ජාතික ප්‍රමුඛතාවයන්ට අනුව පර්යේෂණ වැඩසටහන් සකස් කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම.

5. පර්යේෂණ අවසානයේදී ලබා ගන්නා ප්‍රයෝජනවත් තොරතුරු ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයට සහ අනෙකුත් අවශ්‍ය පුද්ගලයින් හට ලබාදීම සහ අවශ්‍ය කරන තාක්ෂණික උපදෙස් ලබාදීම.

6. ජාතික වන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කරන පර්යේෂණ කටයුතු සඳහා ප්‍රමුඛ ස්ථානය ලබා දී අදාළ ආයතන වලට නිර්දේශ ලබාදීම.

7. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහ රාජ්‍ය දැව සංස්ථාවේ තාක්ෂණික සහ උප තාක්ෂණික මට්ටම් වල සිටින නිලධාරීන්ගේ දැනුම වැඩි දියුණු කිරීම සහ හැකියාවන් දියුණු කිරීම මෙන්ම අනෙකුත් ආයතන වල පුහුණු අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා කටයුතු කිරීම.

8. වන විද්‍යා තොරතුරු ඒකකය සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තු පුස්තකාලය කළමනාකරණය කිරීම.

9. ශ්‍රී ලංකා වන විද්‍යාතනයේ පරිපාලනය සහ සංවර්ධනය යන අංශවල සමස්ථ අධීක්ෂණය.

10. දෙපාර්තමේන්තුවේ රාජකාරී කටයුතු සඳහා අවශ්‍ය කරන සියළුම ලිපි ලේඛණ ඉංග්‍රීසී භාෂාවෙන් සිංහල භාෂාවටද සිංහල භාෂාවෙන් ඉංග්‍රීසී භාෂාවටද පරිවර්තනය කිරීම.

11. දෙපාර්තමේන්තුවේ සියළුම කටයුතු වලදී අවශ්‍ය කරන භාෂා සංස්කරණ සහාය ලබාදීම.

**4.3 ආයතනික සැකැස්ම.**

මෙම අංශයේ ප්‍රධානියා ලෙස වන සංරක්ෂකවරයකු සේවය කරන ලද අතර ප්‍රධාන කාර්යාලයේ අනෙකුත් කාර්ය මණ්ඩලයට එක් පර්යේෂණ නිලධාරියකු, එක් භාෂා පරිවර්තකයකු එක් භාෂා සංස්කාරවරයකු, සංවර්ධන සහකාරවරු තිදෙනෙක්, එක් කළමනාකරණ සහකාරවරයකු, එක් බීට්ටු වන නිලධාරියකු සහ එක් විද්‍යාගාර සහකාරවරයකුද පුස්තකාල කාර්ය මණ්ඩලය සඳහා පුස්තකාලාධිපති සහ එක් වන ක්ෂේත්‍ර සහකාරවරයකුද අයත් වේ.

**4.4 නව පර්යේෂණ ක්‍රියාකාරකම් වල කාර්ය සාධනය - 2013**

**4.4.1 වන විද්‍යාත්මක සහ ශාක වැඩි දියුණු කිරීම හා සම්බන්ධ පර්යේෂණ.**

**4.4.1.1 තේක්ක වැඩි දියුණු කිරීමේ වැඩ සටහන**

**4.4.1.1.1 තේක්ක වල ජානමය පරීක්ෂණ සහ බීජ වතු සංවර්ධනය කිරීම.**

තේක්ක වැඩි දියුණු කිරීමේ වැඩ සටහනට දීර්ඝ කාලීන බෝකිරීමේ වැඩ සටහනක් සහ කෙටි කාලීන බෝ කිරීමේ වැඩ සටහනක් ඇතුලත් වේ. වන වගා ස්ථාපනය කිරීමේ වත්මන් වැඩසටහන සඳහා අවශ්‍ය කරන තේක්ක බීජ, 1970 දශකයේ ස්ථාපනය කරන ලද බීජ වතු වලින් සහ බීජ නිෂ්පාදන ප්‍රදේශ වලින් ලබා ගනියි. දීර්ඝ කාලීන බෝකිරීමේ වැඩසටහනට මූලික බෝ කිරීමේ ගහණ ස්ථාපනය කිරීම, එහි ප්‍රතිඵලයක් ලෙස ලැබෙන ඊලග පරම්පරාවන් ස්ථාපනය කිරීම සහ ක්ලෝනීකරණය කරන ලද නව බීජ වතු සංවර්ධනය කිරීම අයත් වේ. 2013 වසරේදී, තේක්ක බෝ කිරීමේ වැඩසටහනට අදාළ බිම් කොටස් ( ආනපල්ලම - හෙක්ටයාර 05 සහ නිකවෙහෙර හෙක්ටයාර 05 ) සහ ඇත්ගාල පිහිටි හෙක්ටයාර 05 ක් වූ අළුතින් සංවර්ධනය කරන ලද ක්ලෝනීකරණය කරන ලද බීජ වතුවල නඩත්තු කටයුතු සිදු කරන ලදී. තවද, දැනට තිබෙන බෝකිරීමේ වැඩසටහන සඳහා දේශීය ජානමය ද්‍රව්‍ය ලබා ගැනීමට ( 200+ ) ධන ශාක (ඉහල ගුණාත්මක බවකින් යුක්ත ශාක ) තේරීම ආරම්භ කරන ලද අතර 2013 වසරේදී තෝරාගත් ශාක 50 කින් බීජ රැස්කිරීමේ කටයුතු සම්පූර්ණ කරන ලදී.

**4.4.1.1.2 තේක්ක ක්ලෝන ආශ්‍රිතව සිදු කරන පර්යේෂණ සහ තවාන් සංවර්ධනය කිරීම**.

බදුල්ලේ පර්යේෂණාත්මක තවානෙන් ලබාගත් ක්ලෝනීය ප්‍රරෝහ භාවිතා කරමින් තේක්ක වල ක්ලෝනීය ගුණනය පිළිබඳව අධ්‍යනය කරන ලදී. ක්ෂුද්‍ර බෝකරණ ආකාර දෙකක් උපයෝගී කර ගනිමින් විවිධ මාධ්‍ය වර්ග පහක් සහ කැපුම් වර්ග තුනක් පරීක්ෂා කරන ලදී. ඉහත ප්‍රතිකර්ම භාවිතා කරමින් තවාන් පර්යේෂණ දෙකක් සිදු කරන ලදී. මෙහි සාර්ථකත්වය 50% කට වඩා පහල මට්ටමක පවතී. තවද, විවිධ කාල වලදී එම පර්යේෂණ වලින් ලැබෙන ප්‍රතිඵල වල විචල්‍ය ස්වභාවයක්ද දක්නට ලැබුණි. එබැවින්, ක්ලෝනීය ප්‍රචාරණය ආශ්‍රිත පර්යේෂණ නැවතත් 2014 වර්ෂයේදී සිදු කිරීමට නියමිතය.

බදුල්ලේ ස්ථාපනය කර තිබෙන ප්‍රචාරණ පහසුකම් වලට අමතරව, වැල්ලවායේ හඳපානාගල පැල තවානේද ක්ලෝනීය ප්‍රචාරණ පහසුකම් ඇති කර තිබේ. මෙහිදී වානිජ මට්ටමින් මෙම ක්ලෝනීය ප්‍රචාරණය සිදු කිරීමට අවශ්‍ය පර්යේෂණ

කටයුතු සිදු කරනු ලැබේ. තවද කුඩා ප්‍රමාණයේ බඩ වැටියක් ( පැල 500ක ) ද මෙම පැල තවානේ ස්ථාපනය කර තිබේ.

**4.4.1.1.3 තේක්ක ස්ථාපනය කිරීමේ පර්යේෂණ - නිකවැරටිය**

මෙම අධ්‍යනයේදී තේක්ක පැල සිටුවීමේදී පොහොර යොදා යාන්ත්‍රිකව වලවල් කපා පැල සිටුවීම සහ පොහොර නොයොදා අතින් වලවල් කපා පැල සිටුවීම සන්සන්දනය කරනු ලැබේ.

**4.4.1.1.4 තේක්ක, මිශ්‍ර විශේෂ පර්යේෂණ - නිකවැරටිය**

තේක්ක තුනී කිරීමේ ක්‍රියාකාරකම් වලදී සිදුවන අපතේ යෑම් අඩු කිරීම සඳහා ශීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරන විශේෂ වන කැපොක් (*Ceiba pentandra*) සහ ලුණු මිදෙල්ල ( *Melia dubia*) යන ශාක විශේෂ සමග තේක්ක මිශ්‍ර වගාවක් ලෙස සිදුකර එය තේක්ක පමණක් වගා කරන අවස්ථා සමග සන්සන්දනය කරනු ලැබේ.

**4.4.1.1.5 තේක්ක පිළිබඳ තවාන් පර්යේෂණ සහ තේක්ක ක්ෂේත්‍රයේ ස්ථාපනය කිරීම - නිකවැරටිය**

තේක්ක බීජ පැල, විවිධ රෝපණ මිශ්‍රන තුනක් උපයෝගී කර ගනිමින් ප්‍රමාණ අටක පෝච්චි වල සිටුවා වඩාත්ම පිරිවැය ඵලදායි පෝච්චියේ ප්‍රමාණය සහ රෝපණ මිශ්‍රණය හදුනා ගැනීමට පර්යේෂණ සිදු කරන ලදි. භාවිතා කරන ලද පෝච්චි වල ප්‍රමාණය අඟල් 4×6, 4×9, 5×6, 5×9, 6×6, 6×9, 8×6, 8×9 වූ අතර රෝපණ මිශ්‍රණ තුන ලෙස පස්, පස්+ කොම්පෝස්ට් සහ පස් + රසායනික පොහොර යොදා ගන්නා ලදි. පැළයේ උස, මුල්වල දිග, ශාක පත්‍ර වල ප්‍රමාණය, මුල් සංඛ්‍යාව, මුල් සහ කඳන් වල ජෛව ස්කන්ධය මෙහිදී බලන ලදි. මෙලෙස සිටුවන ලද පැළ ක්ෂේත්‍රයේදී ප්‍රතිචාර දක්වන අන්දම පරික්ෂා කිරීමට එහි සිටුවන ලදි.

**4.4.1.1.6 තේක්ක වල වර්ධක ප්‍රචාරණ පර්යේෂණ - නිකවැරටිය**

වර්ධක ප්‍රචාරණයෙන් ලබාගත් තේක්ක පැළ, පෝච්චි වල අතු සිටුවීමෙන් ලබාගත් පැල හා සන්සන්දනය කිරීමට ක්ෂේත්‍රයේ සිටුවන ලදි.

**4.4.1.2 කායා (*Khaya senegalensis)* වැඩි දියුණු කිරීමේ වැඩ සටහන**.

**4.4.1.2.1 ජානමය පර්යේෂණ**

ශ්‍රී ලංකාව තුල *Khaya senegalensis* විශේෂ වැඩි දියුණු කිරීමේ වැඩ සටහන ආරම්භ කරන ලද්දේ මෑතකදීය. 2008 වර්ෂයේදී වැල්ලවාය සහ නිකවෙහෙර යන ස්ථානවල කායා වල ප්‍රභේද පරීක්ෂණ දෙකක් (බටහිර අප්‍රිකානු රටවලින් එක්රැස් කරගත් පුළුල් පරාසයක් තුල ව්‍යාප්තවූ කායා බීජ යොදා ගනිමින්) ස්ථාපනය කරන ලදි. මෙම පරීක්ෂණ කටයුතු 2013 වසරේදි නඩත්තු කරන ලද අතර අවශ්‍ය මිණුම් ලබා ගන්නා ලදි. මෙම වැඩ සටහන යටතේ ධන ශාක 50 කට අධික ප්‍රමාණයක් දෙපාර්තමේන්තු වන වගාවලින් සහ ප්‍රභේද පරීක්ෂණ දෙකෙන් හදුනා ගන්නා ලදී.

**4.4.1.2.2 කායා ( khaya) ක්ලෝනීය බීජ වතු සංවර්ධනය සහ ක්ලෝනීය තවාන් සංවර්ධනය**

2011 දී *Khaya senegalensis* සඳහා මහා පරිමාණ ක්ලෝනීය බීජ වත්තක් බද්ධ පැල උපයෝගී කර ගනිමින් කුරුණෑගල ඇත්ගාල ප්‍රදේශයේ ස්ථාපනය කරන ලදී. 2013 වසරේදී මෙම ක්ලෝනීය බීජ වත්තේ නඩත්තු කටයුතු සිදු කරන ලදී. තවද තෝරාගත් ධන ශාකවලින් ලබාගත් අනුජ උපයෝගී කර ගනිමින් මෙම ශාක විශේෂ සඳහාවූ ක්ලෝනීය බිජ වත්ත පුළුල් කරගත හැකිය. ක්ලෝනීය බිජ වත්තේ සංවර්ධන කටයුතුවලට අමතරව එරබැද්දේ පිහිටි පරික්ෂණාත්මක පැල තවානේ මහා පරිමාණයේ ක්ලෝනීය බඩවැටියක්ද ස්ථාපනය කර තිබේ. බඩවැටිය ස්ථාපනය කිරීම සඳහා බද්ධ පැල නිපදවීමට ආනපල්ලම පිහිටි ප්‍රභේද පරීක්ෂණ භූමියෙන් තෝරාගත් ධන ශාක 6 ක අනුජ උපයෝගි කර ගන්නා ලදි. මෙම ව්‍යාපෘතියේ අරමුණ මෙම ශාක විශේෂ සඳහා ක්ලෝනීය ගුණන ක්‍රමයක් සකස් කිරීමයි.

**4.4.1.3 Eucalyptus අභිජනන වැඩ සටහන.**

**4.4.1.3.1 ජානමය පරීක්ෂණ සහ බීජ වතු සංවර්ධනය**

*Eucalyptus grandis* අභිජනන වැඩ සටහන ජානමය පරීක්ෂණ , බීජ වතු දියුණුකිරීම සහ ක්ලෝනීය වැඩි දියුණු කිරීම් යන සංරචක තුනකින් සමන්විත වේ. 2013 වසරේදී, 1995 සහ 2008 යන වසර වලදී සංවර්ධනය කරන ලද *Eucalyptus grandis* ජානමය පරීක්ෂණ සහ බීජ පැල, බීජ වතු නඩත්තු කිරීම් සහ ඇගැයීම් කටයුතු සිදු කරන ලදී.

**4.4.1.3.2 වර්ධක ප්‍රචාරණ අධ්‍යයනයන්**

*Eucalyptus grandis* වල බද්ධ කිරීම් සහ විශාල ප්‍රමාණයේ කැබලි යොදාගෙන සිදු කරන ප්‍රචාරණ කටයුතු පිළිබඳ අධ්‍යයන කටයුතු තව දුරටත් ඉදිරියට සිදු කරන ලදී. *Eucalyptus grandis* සහ *Eucalyptus teriticornis* යන විශේෂ වල වර්ධක ප්‍රචාරණ අධ්‍යයන කටයුතු වලින් වැදගත් ප්‍රතිඵල රැසක් අනාවරණය විය. රෝපණ මාධ්‍ය සහ ජල වාෂ්ප මට්ටම් වෙනස් කරමින් පරීක්ෂණ සිදු කරන ලදී. හොඳම තත්වයන් යටතේ මුල් ඇදීම 50% කට වඩා ඉහල මට්ටමක පැවතුනි. කෙසේ වුවද ,වසරේ විවිධ කාලවලදී ප්‍රතිඵල විවිධ විය. එබැවින් , තවාන් පරීක්ෂණ දෙකම ඉදිරි වසරේදීද සිදු කිරීමට නියමිතය.

**4.4.1.4 දේශීය විශේෂ වැඩි දියුණු කිරීම.**

**4.4.1.4.1 දේශීය ශාක විශේෂ ගෘහස්ථකරණය කිරීමේ වැඩ සටහන**

දේශීය ශාක විශේෂ ගෘහස්ථකරනය කිරීමේ වැඩ සටහන යටතේ වියළි කලාපීය ශාක විශේෂ දෙකක් තෝරාගෙන තිබේ.

1. *Pterocarpus marsupium* 2. *Berrya cordifolia*

2010 වසරේදී ඇත්ගල ස්ථාපනය කරන ලද *Pterocarpus marsupium* සහ *Berrya cordifolia* යන ශාක විශේෂ වල ඊලග පරම්පාරවන් අධ්‍යනය කිරීමේ පරීක්ෂණ වල ඇගයීම් කටයුතු සහ නඩත්තු කටයුතු සිදු කරන ලදී. හල්මිල්ල වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ 2013 වසරේදී ධන ශාක තේරීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී. මොණරාගල, කුරුණෑගල සහ මුලතිව් යන දිස්ත්‍රික්ක වලින් ධන ශාක 20 ක් මේ වන විට හදුනාගෙන තිබේ.

**4.4.1.4.2 කදුකර ප්‍රදේශ වල දේශීය ශාක විශේෂ ස්ථාපනය කිරීමේ පරීක්ෂණ - බදුල්ල සහ නුවරඑළිය.**

කදුකරයේ පිහිටි *Eucalyptus* සහ *Pine* වන වගා වෙනත් වගාවන් බවට පරිවර්තනය කිරීමේ අරමුණින් බදුල්ලේ වෙලන්හින්න සහ නුවරඑළියේ කොනිකල් හිල්ස් යන ස්ථාන වල ශාක විශේෂ දෙකක් ආශ්‍රිත පර්යේෂණ ස්ථාපනය කරන ලදී. දේශීය ශාක විශේෂ දහයක් ( වැලි දඹ, කුඩුදවුල, වෙලං, බට දඹ, මාදං, *Neolitsea Puscata*, අළුබෝඹු, කහ, අතුකැටිය, වන සපු) දේශිය ශාක බවට පත් කරන ලද ශාක විශේෂ පහක් ( *ටූනා*, කොස්, පිහිඹියා, කායා, මැහෝගනී) සහ ශ්‍රී ලංකාවට හදුන්වා දුන් ශාක විශේෂ පහක් (*Eucalyptus grandis, Eucalyptus microcorys, Eucalyptus cloeziana, Eucalyptus citriodora, Pinus caribaea* ) පරීක්ෂණ දෙක සදහාම ඇතුලත් කර තිබේ. මෙම ව්‍යාපෘතිය යටතේ දේශීය ශාක වල වර්ධන වේගය අධ්‍යනය කරන අතර එම ශාක වල වර්ධන වේගය දැනට තිබෙන වානිජ ශාක විශේෂ සමග සන්සන්දනය කිරීමක්ද සිදු කරයි.

මෙම පරීක්ෂණ දෙක සදහා RCBD සැලසුම උපයෝගී කර ගනිමින් පැල සිටුවන ලද අතර බහුගුණික හතරක්ද එයට ඇතුලත් විය. සෑම බිම් කොටසකටම ශාක 25 බැගින් වන ලෙස මීටර 2× මීටර 2 පරතරයකින් පැල සිටුවන ලදී.

**4.4.1.4.3. හල්මිල්ල ( *Berrya cordifolia*) ස්ථාපනය කිරීමේ පර්යේෂණය - අනුරාධපුර**

ප්‍රධාන වශයෙන්, පරිහානියට පත් වූ වියළි කලාපයේ පිහිටි ස්වභාවික වනාන්තර වල ස්ථාපනය කිරීම සඳහා යෝග්‍ය බවට තහවුරු වූ හල්මිල්ල ( *Berrya cordifolia*) මේ සදහා යොදා ගන්නා ලදී. කෙසේ වුවද, විවෘත තත්ව යටතේ මෙම ශාක විශේෂයේ ක්‍රියාකාරීත්වය පිළිබදව පරීක්ෂා කර නැති තරම්ය. මෙම අධ්‍යනයේදී තේක්ක සහ කොහොඹ යන ශාක විශේෂ වලට සාපේක්ෂව විවෘත, වියළි තත්වයන්ට හල්මිල්ල ශාක විශේෂය එහි ප්‍රමාණය අනුව හැඩ ගැසෙන ආකාරය පිළිබදවද පරීක්ෂා කරන ලදී. ඒ අතරතුර පොහොර යෙදීම අනුව සිදුවන බලපෑම්ද පරීක්ෂා කරන ලද අතර යාන්ත්‍රිකව වලවල් කපා පැල සිටුවීම සහ අතින් වලවල් කපා පැල සිටුවීම අතර ඇති වෙනසද අධ්‍යනය කරන ලදී.

**4.4.1.4.4 ආවරණයක් සහිතව සහ රහිතව මිල්ල (*Vitex pinata* ) රෝපණය කිරීමේ පරීක්ෂණය - නිකවැරටිය**

මිල්ල ඉතා වටිනා දැවමය ශාක විශේෂයක් වුවද වානිජ මට්ටමින් වගා කරනු නොලැබේ. මෙම අධ්‍යනයේදී ආවරණයක් සහිතව ( සෙවන සහිතව) මිල්ල ශාක සිටුවීමෙන් එහි වර්ධනයට සහ ශාකයේ ස්වරූපයට ඇතිවන බලපෑම් අධ්‍යනය කරන ලද අතර මෙහිදී ඉඹුල් පුළුං ශාකය සමග සහ ඉඹුල් පුළුං ශාකය රහිතව වගා කරන ලදි.

**4.4.1.4.5 දැව නොවන ශාක විශේෂ ස්ථාපනය - නිකවැරටිය**

මහජනයාට දැවමය නොවන ප්‍රතිලාභ ලබාදෙන අතරතුර වගා කරන ශාක විශේෂය සංරක්ෂණ කටයුතු සඳහා යෝග්‍යවන ආකාරය පිළිබඳව ඇගයීම සඳහා දැවමය නොවන ශාක විශේෂ වල කාර්ය සාධනය පිළිබඳ මූලික අධ්‍යනයක් ආරම්භ කරන ලදි. දැවමය නොවන ශාක වලට අරළු, බුළු, සදුන්, මී, මූණමල්, කොහොඹ, මාදං සහ කොස් ඇතුලත් වේ.

**4.4.1.4.6 ඉපිල් ඉපිල් වන වගාවක් ලෙස යොදා ගැනීමේ පරීක්ෂණය ( මූලික ව්‍යාපෘතිය) - වවුනියාවේ පම්පායිමඩු - 2013**

මෙම පර්යේෂණය 2011 වර්ෂයේදී කොස් වගාව ආරම්භ කරන ලද වවුනියාව දිස්ත්‍රික්කයේ පම්පායිමඩු ප්‍රදේශයේ ස්ථාපනය කරන ලදි. බීජ සහ මුලින් උදුරාගත් බීජ පැල ස්ථාපනය කරන ලදි.

**4.4.1.4.7 *Gyrinops walla* ශාක විශේෂයේ බීජ වල විභව කාලය සහ ජීව්‍යතාව සහ වර්ධක ප්‍රචාරණය පිළිබඳව අධ්‍යනය කිරීම.**

***Gyrinops walla*** ශාකයේ ප්‍රචාරණය දිනෙන් දිනම වැදගත් වන බැවින් මෙම ශාක විශේෂය බීජ මගින් සහ වර්ධක ප්‍රචාරණය මගින් ප්‍රචාරණය කිරීමේ හැකියාව පිළිබඳව සොයා බැලීම සඳහා මෙම අධ්‍යයනය සිදු කරන ලදි.

**4.4.1.5 වනාන්තර පුනර්ජනනය කිරීමේ වැඩසටහන**

**4.4.1.5.1 ශුෂ්ක කලාපයේ ක්‍රියාත්මක පුනර්ජනනය කිරීමේ අධ්‍යයනය - හම්බන්තොට.**

අත්හැර දමන ලද කෘෂිකාර්මික ඉඩම් වල ස්වභාවික පුනර්ජනනය අධ්‍යයනය කරන ලදි. එම ඉඩම් වල ස්වභාවික පුනර්ජනනයට පදුරු සහ කටු පදුරු හේතු කොටගෙන බාධා පැමිණ තිබේ. මෙම අනවශ්‍ය වෘක්ෂලතා ඉවත් කර මීටර 2.5× මීටර් 2.5 පරතරයකින් ශාක විශේෂ දහයක් පැල කරන ලදි. මෙම පැල වලට පොහොරද එකතු කරන ලදි.

**4.4.1.5.2 ජලාධාර ප්‍රදේශ කළමනානරණය කිරීම - නාඋල**

ජලාධාර සුරැකීම සඳහා භූමිය සාරවත් කිරීමේ අරමුණින් අතහැර දමන ලද ඉයුකැලිප්ටස් වන වගාවක සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරන දේශීය ශාක විශේෂ, පේළි සිටුවන ලදි.

**4.4.1.5.3 නකල්ස් වනාන්තරයේ තිබෙන පරිහානියට පත් වූ වනාන්තර ඉඩම් පුනරුත්ථාපනය කිරීම.**

ප්‍රධාන වශයෙන් තෘණ විශේෂ වලින් ආවරණය වී තිබෙන පරිහානියට පත් වූ මෙම ඉඩම් වල පුනර්ජනනය වැඩි දියුණු කිරීම වෙනුවෙන් විවිධ සිටුවීමේ ක්‍රම යොදා ගනිමින් පර්යේෂණ කටයුතු සිදු කරන ලදි. මේවාට,

1. බීජ ව්‍යාප්තිය
2. බීජ පැල සිටුවීම
3. බීජ සිටුවීම ඇතුලත් වේ.

මෙම අධ්‍යනයේදී අවට වනාන්තර ප්‍රදේශ වල තිබෙන ශේෂ වූ වනාන්තර කොටස් වල තිබෙන ශාක විශේෂ දහයක් යොදා ගන්නා ලදි.

#### 4.4.1.6 මහා ප්‍රචාරණය සහ ක්ෂුද්‍ර ප්‍රචාරණය

##### 4.4.1..6.1 මහා ප්‍රචාරණය

තේක්ක : තේක්ක ( ***Tectona grandis L***) කොපීස මුල් ඇද්දවීම කෙරෙහි පාරිසරික උෂ්ණත්වය සහ විවිධ මුල්ඇද්දවීමේ මාධ්‍ය වල බලපෑම ඇගයීම සඳහා මෙම පරීක්ෂණය සිදු කරන ලදි. මේ සඳහා තෝරා ගන්නා ලද ස්ථාන වන්නේ කුඹල්පොල සහ පොල්ගොල්ලය(මහනුවර)

ඇකේසියා : මේ සඳහා මි.මී.20 සිට මි.මී.4 දක්වා විශ්කම්භයෙන් යුක්ත දඬු, කොපීස වල එක් ගැටයක් සහිත කැබලි සහ අග්‍රස්ථ විභාජකය සහිත කොපීස යනාදී විවිධ කැබලි ( හෝර්මෝන කිසිවක් නොයොදා) යොදා ගන්නා ලදි. මුල් ඇදීමේ ප්‍රතිශතය ඉතා පහළ මට්ටමක පැවතුණි. (6%)

කොහොඹ : මෙම පරීක්ෂණය හෝර්මෝන, විවිධ මුල් ඇද්දවීමේ මාධ්‍ය සහ විවිධ පාරිසරික තත්වයන් දෙකක් යටතේ මුල් ඇද්දවීම සිදුවන ආකාරය හඳුනා ගැනීමට සිදු කරන ලදි.

##### 4.4.1.6.2 ක්ෂුද්‍ර ප්‍රචාරණය

උණ : මෙම අධ්‍යනයේදී රන්වන් උණ, කහපාට උණ සහ ආහාරයට ගන්නා උණ භාවිතා කරන ලදි.

ඉයුකැලිප්ටස් : පෝච්චි වල සිටුවන ලද අඩි 2.5 ක් උසැති බීජ පැල වලින් එක් ගැටයක් සහිත කැබලි ලබාගෙන ප්‍රචාරණය පිළිබඳව අධ්‍යයනය කරන ලදි.

බාදුරා : බාදුරා ශාකයේ කරල් ජීවානුහරණය කිරීමට යෝග්‍ය ශිල්පීය ක්‍රම පිළිබඳව සොයා බැලීමට සහ බාදුරා ඇට ප්‍රරෝහනය සඳහා යෝග්‍ය මාධ්‍ය පිළිබඳව සොයා ගැනීමට මෙම පරීක්ෂණය සිදු කරන ලදි. යෝග්‍ය වර්ධන සහ මුල් ඇද්දවීමේ මාධ්‍ය පිළිබඳව සොයා බැලීම සඳහා මෙම පරීක්ෂණය තව දුරටත් සිදු කරයි.

සුදුහඳුන් : නාළස්ථ සහ සජීවස්ථව, බීජ පැල වලින් , ලබා ගත් ගැටයක් සහිත කැබලි ගුණනය කිරීම සඳහා යෝග්‍ය මාධ්‍යයක් සොයා ගැනීමේ අරමුණින් මෙම පරීක්ෂණය සිදු කරන ලදි.

අරළු : අරළු බීජ ප්‍රරෝහනය සඳහා ක්‍රමවේදයක් සකස් කරන ලදි. අරළු බීජ ස්වභාවිකව ප්‍රරෝහණය වීමට ගන්නා කාලය ඉතාමත් වැඩි බැවින් ප්‍රරෝහණ ප්‍රතිශතය නිර්ණය කිරීම සඳහා මෙම ක්‍රමය භාවිතා කරන ලදි.

වෙනිවැල් : වෙනිවැල් වල එක් ගැටයක් සහිත කැබලි වල ක්ෂුද්‍ර ප්‍රචාරණ කටයුතු ආරම්භ කරන ලද නමුත් රෝපණ ද්‍රව්‍ය හිඟකම හේතුකොටගෙන මෙම පරීක්ෂණ කටයුතු ඉදිරියට සිදු කිරීමට නොහැකි විය.

#### 4.4.1.7 ආක්‍රමණශීලී ශාක පිළිබඳ පර්යේෂණ

##### 4.4.1.7.1. ආක්‍රමණශීලී හැසිරීම සහ හැටන් සහ නාවලපිටිය යන අඩවි වල *Clusia rosea* ව්‍යාප්ත වීම.

***Clusia rosea*** යන ශාක විශේෂය ශ්‍රීලංකාව තුල ආක්‍රමණශීලී ශාකයක් ලෙස සලකයි. වර්තමාන අධ්‍යනයේදී නාවලපිටිය සහ හැටන් යන අඩවි වල මෙම ශාක විශේෂය ආක්‍රමණශීලී ලෙස ව්‍යාප්ත වන ආකාරය පිළිබඳව අධ්‍යයනය කරන ලදි. සංවෘත ස්වභාවික වනාන්තර, විවෘත ස්වභාවික වනාන්තර, වන වගා, තෘණ බිම්, ගල් සහිත ප්‍රදේශ සහ දිය දහරා යනාදී විවිධාකාර වනාන්තර පරිසර පද්ධති කෙරෙහි මෙම ශාක විශේෂයේ බලපෑම අධ්‍යයනය කරන ලදි.

#### 4.4.1.7.2. හැටන් සහ නාවලපිටිය යන අඩවි වල *Miconia calvescens* ශාක විශේෂයේ ආක්‍රමණය සහ එහි පාලනය.

1988 වර්ෂයේදී *Miiconia calvescens* යන ශාක විශේෂය ශ්‍රී ලංකාවට හදුන්වා දෙන ලදි. එතැන් සිට ඉහළ කදුකරයේ උප කදුකර කලාපයේ විවිධ ස්ථාන වලට මෙම ශාකය ව්‍යාප්ත වී තිබේ. මෙම ශාක විශේෂය අප රටේ ආක්‍රමණශීලී ශාක විශේෂයක් ලෙස හදුනාගෙන තිබේ. වර්තමාන අධ්‍යනයේදී ආක්‍රමණශීලි හැසිරීම සහ හැටන් සහ නාවලපිටිය යන ප්‍රදේශ වල මෙම ශාක විශේෂයේ ව්‍යාප්තිය අධ්‍යනය කරන ලදි. සංවෘත ස්වභාවික වනාන්තර, විවෘත ස්වභාවික වනාන්තර, වන වගා, තෘණ බිම්, ගෙවතු සහ දිය දහරා යනාදී විවිධාකාර වනාන්තර පරිසර පද්ධති කෙරෙහි මෙම ශාකයේ බලපෑම මෙහිදී අධ්‍යයනය කරන ලදි.

### 4.4.1.8 වන වගා කළමනාකරණය

#### 4.4.1.8.1 කැලෑ ශාක ගෘහස්ථකරණය සහ කළමනාකරණ වැඩසටහන - මිහින්තලේ සහ වග

මෙම අධ්‍යයනය පෙර වසරේ සිට අඛණ්ඩව පවතින අධ්‍යනයකි. මෙම වැඩසටහන යටතේ තොරාගත් දේශීය ශාක විශේෂ පිළිබදව ඇගයීමක් සිදුකළ අතර මෙහිදී අනාගත නැවත වන වගා වැඩසටහන් සදහා මෙම ශාක විශේෂ හදුන්වා දීම අරමුණ කර ගන්නා ලදි.මේ සදහා වෙලං (*Pterospermum suberifolium*) ලියං (*Homalium ceylanicum*) හොර ( *Dipterocarpus zeylanicus*) පිහිඹිය (*Filicium decipiens*) නැදුන් (*Pericopsis mooniana*) වල්දෙල් (*Artocarpus nobilis*) කොස් ( *Artocarpusin tegrifolia*) සහ තේක්ක (*Tectona grandis* ) යොදා ගන්නා ලදි.

#### 4.4.1.8.2 *Dipterocarpus zeylanicus* සදහා ස්ථිර නියැදි බිම් කට්ටි ස්ථාපනය කිරීම. - කළුතර

***Dipterocarpus zeylanicus*** වගා වල සත්‍ය වර්ධන වේගය අධ්‍යයනය කිරීම උදෙසා කළුතර දිසාවේ ස්ථාන පහක ස්ථිර නියැදි බිම් කට්ටි දහයක් ස්ථාපනය කරන ලදි. මේ සම්බන්ධයෙන් රැස් කරන දත්ත, හොර ශාක විශේෂය සදහා අනාගතයේදී කළමනාකරණය සැලසුම් සකස් කිරීමට මෙන්ම පරිමාව සහ අස්වැන්න වගු සකස් කිරීමටද උපකාරී වනු ඇත.

#### 4.4.1.8.3 ජීව වැට වල් සකස් කිරීමේ වැඩසටහන - මිහින්තලේ

අලින් සදහා බාධකයක් ලෙස සාර්ථකව ජීව වැටවල් උපයෝගී කර ගත හැකි වේදැයි පරීක්ෂා කිරීම මීටර 10 ක පළලින් යුක්තව සිග්-සැග් ආකාරයට කටු උණ (*Bambusa bambos* )සහ හණ (*Crotalaria juncea* ) යනශාක විශේෂ දෙක සිටුවන ලදි.

#### 4.4.1.8.4 *Dipterocarpus zeylanicus* කළමණාකරන වැඩසටහන - වග

වඩාත්ම ගැලපෙන කළමණාකරන ක්‍රමය තෝරා ගැනීමේ අරමුණින් වග අඩවියේ මීටර 3 ×මීටර 3, මීටර 3 ×මීටර 4, මීටර 3 ×මීටර 5 පරතරයකින් පැල සිටුවා මූලික පරීක්ෂණය ස්ථාපනය කරන ලදි.

### 4.5 ජාතික වන ක්ෂේත්‍ර පර්යේෂණ කමිටුව

ජාතික වන ක්ෂේත්‍ර පර්යේෂණ කමිටුවේ සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ලබන්නේ මෙම අංශය විසිනි. අදාළ වර්ෂය තුලදී කමිටු රැස්වීම් 03 ක් පවත්වන ලදි. නව පර්යේෂණ යෝජනා 30 ක් ඇගයීමට ලක්කල අතර පර්යේෂණ කටයුතු සිදු කර ගෙන යෑමට අවසර ලබා දෙන ලදි. මෙයට අමතරව, මේ වන විට ආරම්භ කර තිබෙන පර්යේෂණ 05 කට ඉදිරියට එම කටයුතු සිදු කිරීමට කාලය දීර්ඝ කර දෙන ලදි.

**2013 වර්ෂයේදී අනුමත කරන ලද පර්යේෂණ ව්‍යාපෘති**

1. ආචාර්ය එම්.සී.එම්. ඉක්බාල් මහතාගේ ( මූලික අධ්‍යන ආයතනය ) ශ්‍රී ලංකාවේ නිවර්තන ,වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර වල ශාක විවිධත්වය, ව්‍යුහය සහ ගති විද්‍යාව පිළිබදව සන්සන්දනාත්මක අධ්‍යයනය.

2. ආචාර්ය සුමුදු රූබසිංහ මහතාගේ (පේරාදෙණිය විශ්ව විද්‍යාලය) ශ්‍රී ලංකාවේ හමුවන බ්‍රයෝෆිටා පිළිබද මූලික සමීක්ෂණය.

3. ආචාර්ය එස්.පී. නිස්සංක මහතාගේ ( පේරාදෙණිය විශ්ව විද්‍යාලය ), ප්‍රධාන වනාන්තර වර්ග වල කාබන් සංචිත ඇගයීම සහ තෝරාගත් සීඝ්‍ර වර්ධනයක් පෙන්වන දේශීය ශාක විශේෂ වල වර්ධන විභවය ඇගයීම.

4. ආචාර්ය ආර්.එච්.ජී. රනිල් මහතාගේ ( පේරාදෙණිය විශ්ව විද්‍යාලය ) ***Blechnaceae*** කුලයට අයත් ශ්‍රී ලංකාවේ හමුවන ශාක වල පරිසර විද්‍යාව, ජෛව භූගෝල විද්‍යාව සහ වංශ ප්‍රවේණික සම්භවය පිළිබද ඇගයීම.

5. ජාන ප්‍රවාහයට තිබෙන බාධක සහ එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ ඒක දේශීකතාව මැයෙන් ආචාර්ය සම්පත් එස් සෙනවිරත්න මහතාගේ ( කොළඹ විශ්ව විද්‍යාලය ) දේශගුණික සහ උච්චත්ව වෙනස්කම් සමග ආවේණික පක්ෂීන් සහ ඔවුන්ගේ වංශ ප්‍රවේණික ඥාතීන් අතර ගති ලක්ෂණ වෙනස්වීම සහ ජාන ප්‍රවාහ මට්ටම් පිළිබද ගැඹුරු ඇගයීම.

6. ආචාර්ය පී.එස්. සපුතන්ත්‍රි මහත්මියගේ ( කොළඹ විශ්ව විද්‍යාලය ) බ්‍රයෝෆිටා වලින් ජෛව ක්‍රියාකාරී ස්වභාවික සංඝටක වෙන්කර ගැනීම සහ විභාජනය පිළිබද අධ්‍යනය.

7. මහාචාර්ය දීප්ති යකන්දාවල මහත්මියගේ ( පේරාදෙණිය විශ්ව විද්‍යාලය ), ***Anacardiaceae***, ***Ebaenaceae, Orchidaceae*** සහ ***Zingiberaceae*** යන කුල වලට ප්‍රමුඛතාවය ලබාදෙමින් ශ්‍රී ලංකාවට ආවේණික ශාක විශේෂ වල වර්ණදේහ පරිනාමය.

8. මහාචාර්ය එස්.ඩබ්ලිව්. කොටගම මහතාගේ ( කොළඹ විශ්ව විද්‍යාලය) ***Urocissa ornate*** ( ශ්‍රී ලංකා පොල්කිච්චා) ගේ පරිසර විද්‍යාව, ජීව විද්‍යාව සහ සංරක්ෂණය පිළිබද ව්‍යාපෘතිය ඉදිරියට සිදු කර ගෙන යෑම

9. ආචාර්ය කේ.එම්.ජී.ජී. ජයසූරියගේ ( පේරාදෙණිය විශ්ව විද්‍යාලය) ශ්‍රී ලංකාව තුල හමුවන තෝරාගත් කදුකර වනාන්තර විශේෂ කිහිපයක සුප්තතාව සහ බීජ ප්‍රරෝහනය සදහා වන අවශ්‍යතාවයන් සහ මෙම විශේෂ වලට දේශගුණික විපර්යාස මගින් ඇතිවිය හැකි බලපෑම්.

10. මහාචාර්ය දේවක වීරකෝන් මහතාගේ (කොළඹ විශ්ව විද්‍යාලය) ශ්‍රී ලාංකීය රන්වන් උරුලෑවා සංරක්ෂණය කිරීම සදහා වැඩ සටහනක් ස්ථාපනය කිරීම.

11. ආර්.ඒ.එස්.ඩබ්ලිව්. රණසිංහ මහතාගේ (ජාතික උද්භිද උද්‍යානය) ශ්‍රී ලංකාවේ කදු මුදුන්වල හමුවන ශාක පිළිබද ගවේශනාත්මක අධ්‍යයනය.

12. ආචාර්ය මාධව මීගස්කුඹුර මහතාගේ( පේරාදෙණිය විශ්ව විද්‍යාලය) ශ්‍රී ලාංකීය උභය ජීවීන්ගේ පරිණාමික පරිසර විද්‍යාව සහ බන්ධුතාවය.

13. ආචාර්ය පී.කේ.පී. පෙරේරා මහතාගේ (ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය) ශ්‍රී ලංකාවේ ඉහලම නැරඹුම් ප්‍රවනතාවයක් සහිත රක්ෂිත ප්‍රදේශවල පක්ෂීන්ගේ ව්‍යාප්තිය සහ සුලබතාව කෙරෙහි මිනිස් විනෝදාත්මක කටයුතු නිසා ඇති වන බලපෑම්.

14. අචාර්ය සුධීරා රංවල මහත්මියගේ (කොළඹ විශ්ව විද්‍යාලය) ඉංගිරිය Dipterocarp රක්ෂිත වනාන්තරයේ ශාක පුනර්ජනනය කෙරෙහි ශාක සංයුතියේ සහ වනාන්තර මායිම්වල බලපෑම.

15. මහාචාර්ය පී.ආර්.ආර්. රණවක මහතාගේ (ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය) ශ්‍රී ලංකාවේ සමනළුන්ගේ ජානමය විවිධත්වය නිගමනය කිරීම.

16. ආචාර්ය ජී.ඒ.එස්. ප්‍රේමකුමාර මහතාගේ (කාර්මික තාක්ෂණික ආයතනය) ශ්‍රී ලංකාවේ වෘක්ෂලතා වලින් ස්වාභාවික සුගන්ධ සහ අනෙකුත් වාශ්පශීලි ද්‍රව්‍ය ලබා ගැනීම පිළිබදව අධ්‍යයනය කිරිම සහ ඒවායේ කාර්මික යෙදීම.

17. ආචාර්ය ජගත් ගුණතිලක මහතාගේ ( පේරාදෙණිය විශ්ව විද්‍යාලය ) GIS සහ දුරස්ථ සන්නිවේදනය උපයෝගී කර ගනිමින් තෝරාගත් ජෛවගෝල වනාන්තරවල ආක්‍රමණශීලී ශාක විශේෂ ව්‍යාප්තිය සිතියම් ගත කිරීම සහ අනෙකුත් පළකිරිම.

18. ආචාර්ය එස්.එම්.සී.යු.පි. සුබසිංහ මහතාගේ (ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය ) වල්ල පට්ට ශාකයේ තවාන් ක්‍රම සහ රෙසින විවිධත්වය.

19. ආචාර්ය චන්දිම විජයසිරිවර්ධන මහතාගේ (කාර්මික තාක්ෂණික ආයතනය) වල්ල පට්ට ශාකයේ ඖෂධීය වටිනාකම පිළිබද අධ්‍යයනය.

20. ආචාර්ය ඒ.එම්.ඒ.එස්. අත්තනායක මහත්මියගේ (ජාතික උද්භිද උද්‍යානය) Goniothalamus (Annonaceae කුලයේ) පරාගණය, අභිජනනය සහ බීජ ව්‍යාප්තිය

21. ආචාර්ය එස්.සී.කේ. රූබසිංහ මහතාගේ (පේරාදෙණිය විශ්ව විද්‍යාලය) අණුක වංශ ප්‍රවේණික ප්‍රවේශ උපයෝගී කරගෙන ශ්‍රී ලංකාවේ Gesneriaceae විශේෂය සහ බන්ධුතා පිළිබදව අධ්‍යයනය කිරීම.

22. මහාචාර්ය එස්.ඩබ්ලිව්. කොටගම මහතාගේ (කොළඹ විශ්ව විද්‍යාලය) සිංහරාජ ලෝක උරුම රක්ෂිතයේ මිශ්‍ර පක්ෂි විශේෂ රැන්වල වෙනස්වන පරිසර විද්‍යාත්මක ලක්ෂණ සහ හඩ පිළිබද අධ්‍යයනය.

23. මහාචාර්ය වයි.එන්.ඒ. ජයතුංග මහතාගේ (කොළඹ විශ්ව විද්‍යාලය) ජලජ කෘමි කීටයින් දර්ශකයක් ලෙස යොදා ගනිමින් ජලයේ ගුණාත්මක බව පිළිබදව විද්‍යාත්මකව පර්යේෂණ කිරීම.

24. මහාචාර්ය කමනී එච්. තෙන්නකෝන් මහත්මියගේ (කොළඹ විශ්ව විද්‍යාලය) පියයුරු පිළිකාවට එරෙහිව යොදාගත හැකි සෛලිය විෂ සංයෝග සදහා තෝරාගත් ආවේණික ශාක කීහිපයක් පිරික්සීම සහ එලෙස හදුනාගත් පිළිකා නාශක සංයෝග වෙන්කර ගැනීම සහ ඒවායේ ව්‍යුහය නිශ්චය කිරීම.

25. ආචාර්ය එච්.බී.අසන්ති මහත්මියගේ (රුහුණු විශ්ව විද්‍යාලය) කන්නෙලිය වනාන්තරයේ තෝරාගත් දිය පහර කීපයක ජලජ ශාක විවිධත්වය කෙරෙහි පාංශු ස්ථරයේ බලපෑම අධ්‍යයනය කිරීම.

26. ආචාර්ය එස්.එච්. කත්‍රිආරච්චි මහත්මියගේ (කොළඹ විශ්ව විද්‍යාලය) Acrotrema ඝණයේ (Dilleniaceae කුළයේ) වර්ගීකරණය.

27. ආචාර්ය. සුමුදු සී.කේ.රූබසිංහ මහතාගේ ශ්‍රී ලංකාවේ වෘක්ෂලතාවල ( පේරාදෙණිය විශ්ව විද්‍යාලය) ජෛව භූගෝලීය ආකර්ශණය.

28. ආචාර්ය රංජලා රත්නායක මහත්මියගේ (Nature’s Beauty Creations) ඖෂධීය ශාක පටක රෝපණය.

29. ආචාර්ය. ජේ. ඩබ්ලිව්. දැමුණුපොල මහත්මියගේ (පේරාදෙණිය විශ්ව විද්‍යාලය) නකල්ස් රක්ෂිත වනාන්තරයේ පිළිසකර කිරීම් සදහා තෝරාගත් දේශීය ශාක විශේෂවල වර්ධක ප්‍රචාරණය.

**දැනට සිදුකරමින් පවතින පර්යේෂණ සඳහා කාලය දීර්ඝ කිරීම් ලබාදිම.**

1. මහාචාර්ය. කේ.බී. රණවන මහතාගේ (පේරාදෙණිය විශ්ව විද්‍යාලය) නාඋල, මරගමුව පිහිටි අස්වැන්න ලබාගත් ඉයුකැලිප්ටස් වන වගාවල ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම.

2. ආචාර්ය එම්.සී.එම්. ඉක්බාල් මහතාගේ ( මූලික අධ්‍යයන ආයතනය) ශ්‍රී ලංකාවේ තෝරාගත් වනාන්තර කීහිපයක කාබන් තිරකිරීම සහ ගති විද්‍යාව.

3. ආචාර්ය යූ.කේ.ජී.කේ. පද්මලාල් මහතාගේ ( ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය) ශ්‍රී ලංකාවේ තෙත් සහ අතරමැදි කලාප වල රතු වදුරා (*Loris tardigradus* ) සඳහා මූලික සංරක්ෂණ වැඩසටහන.

4. ආචාර්ය යූ.කේ.ජී.කේ. පද්මලාල් මහතාගේ ( ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය) වඳවීයාමේ තර්ජනයට දැඩිලෙස මුහුණදී සිටින කදුකර උනහපුළුවාගේ පැවැත්මට දක්වන දායකත්වයක් ලෙස තැන් තැන්වල විසිරී තිබෙන ඔවුන්ගේ වාසස්ථාන අතර සම්බන්ධතාවයක් ගොඩනංවා ස්වාභාවික වාසස්ථාන වැඩි දියුණු කිරීම්.

5. මහාචාර්ය දීප්ති යකන්දාවල මහත්මියගේ (පේරාදෙණිය විශ්ව විද්‍යාලය) *Nymphaea nouchali* Burm.f. වර්ගීකරණය සහ අණුක දත්ත උපයෝගීකර ගනිමින් දෙමුහුම් තක්සෝන හඳුනා ගැනීම.

## 4.6 වන විද්‍යා අධ්‍යාපනය.

ශ්‍රී ලංකා වන විද්‍යායතනයේදී පහත සදහන් පුහුණු වැඩ සටහන් පවත්වන ලදි.

### 4.6.1 සේවයේ නිරත නිලධාරින්හට ලබාදුන් පුහුණු වැඩ සටහන් -2013

සෑම මට්ටමකම ක්ෂේත්‍ර නිලධාරින් සඳහා මේ කාණ්ඩය යටතේ පුහුණු වැඩසටහන් 16 ක් පවත්වන ලදී.

**වගුව 4.1 සේවයේ නිරත නිලධාරින් හට ලබාදුන් පුහුණු වැඩ සටහන් -2013**

| අනු අංකය | පාඨමාලාවේ නම | සහභාගිවූ කාණ්ඩය | සහභාගි වූ සංඛ්‍යාව | දින ගණන |
|---|---|---|---|---|
| 1 | සහභාගීත්ව වන කළමනාකරණයේ මූලධර්ම | වන ව්‍යාප්ති නිලධාරී | 66 | 01 |
| 2 | වන සංරක්ෂණය සඳහා භූගෝලීය තොරතුරු පද්ධතිය සහ දුරස්ථ සන්නිවේදනය යොදා ගැනීම. | කථිකාචාර්ය / අඩවි වන නිලධාරි, | 36 | 03 |
| 3 | විශේෂ හදුනා ගැනීම සහ ක්ෂේත්‍ර මිණුම් කිරීමේ ක්‍රම | අඩවි වන නිලධාරි, | 31 | 02 |
| 4 | වන විද්‍යාවේදී GPS භාවිතය | පර්යේෂණ අංශයේ සිටින ක්ෂේත්‍ර නිලධාරින් | 10 | 02 |
| 5 | තිරසාර සංවර්ධනය කරා ජෛව විවිධත්ව සංරක්ෂණය | දිසා වන නිලධාරි/ අඩවි වන නිලධාරි, අනෙකුත් ක්ෂේත්‍ර නිලධාරින් | 35 | 02 |
| 6 | දැව නිෂ්පාදනය සහ භාවිතය පිළිබඳ වර්තමාන ප්‍රවණතාව | දිසා වන නිලධාරි / වන පාලක / අඩවි වන නිලධාරි, | 31 | 02 |
| 7 | ඒකාබද්ධ ජල පෝෂක ප්‍රදේශ කළමනාකරණය | දිසා වන නිලධාරි/ අඩවි වන නිලධාරි, | 36 | 02 |
| 8 | වන විද්‍යාවේදී G.P.S භාවිතය | බීට්ටු වන නිලධාරි | 37 | 03 |
| 9 | වන ව්‍යාප්ති | වන ව්‍යාප්ති නිලධාරී | 25 | 03 |
| 10 | සන්නිවේදන සහ ඉදිරිපත් කිරීමේ තාක්ෂණ | වන ව්‍යාප්ති නිලධාරී | 25 | 03 |
| 11 | වන නීතිය සහ අධිකරණ ක්‍රියා පටිපාටිය | බීට්ටු වන නිලධාරි | 65 | 03 |

| | | | | |
|---|---|---|---|---|
| 12 | පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩ සටහන<br>මොඩියුල: අංක 01 | අඩවි වන නිලධාරී/<br>වන ව්‍යාප්ති නිලධාරී | 29 | 03 |
| 13 | වන විද්‍යාවේදී GPS භාවිතය | බීට්ටු වන නිලධාරී | 26 | 03 |
| 14 | පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩ සටහන<br>මොඩියුල: අංක02 | අඩවි වන නිලධාරී/<br>වන ව්‍යාප්ති නිලධාරී | 30 | 03 |
| 15 | වන නීතිය හා අධිකරණ ක්‍රියා පටිපාටිය | බීට්ටු වන නිලධාරී | 55 | 03 |
| 16 | පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩ සටහන<br>මොඩියුල: අංක 03 | අඩවි වන නිලධාරී/<br>වන ව්‍යාප්ති නිලධාරී | 30 | 03 |

### 4.6.2 කෙටි කාලීන පුහුණු වැඩ සටහන් - 2013

අනෙකුත් රාජ්‍ය නිලධාරීන් සදහා වන විද්‍යාව හා සම්බන්ධ විෂයයන් පිළිබදව කෙටි කාලීන පුහුණු වැඩ සටහන් 09 ක් පවත් වන ලදි.

**වගුව 4.2 කෙටි කාලීන පුහුණු වැඩ සටහන් -2013**

| අනු අංකය | පාඨමාලාවේ නම | ආයතනය | පුහුණුවට සහභාගිවූ නිලධාරී කණ්ඩායම | පුහුණුවට සහභාගිවූ සංඛ්‍යාව | දින ගණන |
|---|---|---|---|---|---|
| 1 | වන කළමනාකරණය පිළිබද ආරම්භක පුහුණුව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ආධුනික නිලධාරීන් | 43 | 05 |
| 2 | වන නීතිය සහ නියාමනය පිළිබද හදුන්වාදීමේ වැඩ සටහන | දකුණු පලාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | ක්ෂේත්‍ර නිලධාරීන් | 80 | 01 |
| 3 | වන නීතිය හා ඒ ආශ්‍රිත නීති හදුන්වාදීම | පලාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | ක්ෂේත්‍ර නිලධාරීන් | 50 | 02 |
| 4 | ශ්‍රී ලංකාවේ කදුකර ප්‍රදේශයේ ජලාධාර වැඩි දියුණු කිරීම සදහා ඉඩම් සහ ජල සම්පත් ඒකාබද්ධව කලමනාකරණය කිරීම. | ශ්‍රී ලංකා වන විද්‍යායතනය | නුවරඑළිය දිස්ත්‍රික්කයේ රජයේ නිලධාරීන් | 40 | 02 |
| 5 | වන ප්‍රතිපත්තිය සහ වන සංරක්ෂණ උපාය මාර්ග | රාජ්‍ය දැව සංස්ථාව | රාජ්‍ය දැව සංස්ථාවේ පුහුණුවන කළමනාකරුවන් | 25 | 01 |
| 6 | වන සම්පත් කලමනාකරණය පිළිබද හදුන්වාදීම | මහවැලි අධිකාරිය | ක්ෂේත්‍ර නිලධාරීන් | 35 | 03 |
| 7 | කෘෂි වන විද්‍යාව පිළිබද පුහුණු වැඩ සටහන | ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය, කුණ්ඩසාලේ | 2 වන වසර විශ්ව විද්‍යාල සිසුන් | 30 | 02 |
| 8 | පරිසර සංරක්ෂණය සහ ජලාධාර කළමනාකරණය | ඌව පලාත් කාර්යාලය | වාරිමාර්ග නිලධාරීන් | 29 | 02 |
| 9 | වන කළමනාකරණය පිළිබද හදුන්වාදිම | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය (පරිසර හා වන සංරක්ෂණය) | ක්ෂේත්‍ර නිලධාරීන් | 35 | 03 |

### 4.7. පුස්තකාලය

අදාල වසර තුලදී රුපියල් 709,902.42 ක වටිනාකමකින් යුක්ත ග්‍රන්ථ සහ සගරා පුස්තකාලය සඳහා මිළදී ගෙන තිබුණි. මෙයට විවිධ මාතෘකා 15 ක් යටතේ මිළදී ගත් පොත් සහ විවිධ මාතෘකා 19 ක් යටතේ මිළදී ගත් සගරාද ඇතුලත් වේ. තවද විවිධ මාතෘකා 37 ක් යටතේවූ ග්‍රන්ථ පරිත්‍යග ලෙස ලැබුණි.

CD-ISIS පුස්තකාල පැකේජය යොදා ගනිමින් පුස්තකාල ග්‍රන්ථ නාමාවලිය මෙම වසරේදීද පරිඝනක ගත කරන ලදී. මෙම අදාල වර්ෂය අවසානයේදී දත්ත 4,715 ක් මෙම දත්ත ගබඩාවල ඇතුලත් කර තිබුණි. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මෙම වසර සඳහා IUFRO සාමාජිකත්වය ලබාගෙන තිබේ. (සාමාජික මුදල් ලෙස රුපියල් 70,350.54 ක් ගෙවා තිබේ.)

**වන විද්‍යා තොරතුරු සේවාව**

- ශ්‍රී ලංකාව තුල හමුවන විදේශීය ශාක හදුනාගැනීම සඳහා මුලික සහ සරල තොරතුරු සපයන ශාක හදුනා ගැනීමේ තොරතුරු පොත සැකසීමේ කටයුතු ආරම්භ කරන ලදී.
- ශ්‍රී ලංකා ෆොරස්ට්‍ර් සගරාවේ 32 සහ 33 ඒකාබද්ධ වෙළුම මුද්‍රණය කරන ලදී.
- වන විද්‍යා පර්යේෂණ මධ්‍යස්ථානයේ වාර්ෂික ප්‍රකාශනය වන, වන විද්‍යා පර්යේෂණ ප්‍රවෘත්ති පත්‍රිකාව මෙම වසරේදීද වන විද්‍යාවේ විවිධ පැතිකඩ පිළිබද විස්තර දක්වමින් එළි දක්වන ලදී.
- පටක රෝපණය පිළිබදව සිංහල භාෂාවෙන් සකස් කරන ලද පත්‍රිකාවක් සහ පිරිමි පුෂ්පය උපයෝගී කර ගනිමින් කෙසෙල් ශාකයේ ක්ෂුද්‍ර ප්‍රචාරණය සිදු කරන අන්දම දක්වන පෝස්ටරයක් මුද්‍රණය කරන ලදී.

**පහත සදහන් උපදේශාත්මක පත්‍රිකා ද මුද්‍රණය කරන ලදී. (සිංහල මාධ්‍යයෙන්)**

- *Prosopis juliflora* - ආක්‍රමණශීලී ශාක විශේෂයකි.
- *Myconia calvescence* - ආක්‍රමණශීලී ශාක විශේෂයකි
- තේක්ක ශාකය හා සම්බන්ධ රෝග.
- කායා බීජ නිෂ්පාදනය, හසුරුවීම සහ තවාන් කළමනාකරණය
- වන වගා කප්පාදු කිරීම
- වල්ල පට්ට හදුනාගැනීම
- ඉයුකැලිප්ටස් gall Wasp

### 4.8.1 ප්‍රකාශන - පර්යේෂණ පත්‍ර සහ උද්ධෘත

#### 4.8.1.1 පර්යේෂණ පත්‍ර

I. පී.පී.එස්. සම්පත් , ඒ.එල්.එම්. සුහ්රි සහ ඩබ්ලිව්. ජේ. එස්.කේ. වීරක්කොඩි (2013) ගේ මේරූ අතු කැබලි මගින් සිදු කරන කොහොඹ වල (*Azadirachta indica*) වර්ධක ප්‍රචාරණය

II. එන්.එස්.බී. සිරිවර්ධන, ඕ.එල්.එම්. සුහ්රි සහ ඩබ්ලිව්.ජේ.එන්.කේ . වීරක්කොඩි (2013) ගේ බීජ රෝපණය මගින් Nepenthes විශේෂයේ ක්ෂුද්‍ර ප්‍රචාරණය

III. ඒ..ඊ.ටී.බී. සෝමසිරි, ඒ.එල්.එම්. සුහ්රි සහ ඩබ්ලිව්.ජේ.එස්.කේ. වීරක්කොඩි (2013) ගේ තේක්ක කොපිස මුල් ඇද්දවීම කෙරෙහි පරිසර උෂ්ණත්වය සහ විවිධ මුල් ඇද්දවීමේ මාධ්‍යවල බලපෑම.

#### 4.8.1.2 පර්යේෂණ උද්ධෘත

පහත සඳහන් උද්ධෘත 2014 IUFRO ලෝක වන විද්‍යා සම්මේලනය සඳහා ඉදිරිපත් කරන ලද අතර පිළිගෙනද තිබුණි.

(අ) ශ්‍රී ලංකාවේ තිබෙන අතහැර දමන ලද පොකිරිස්සන් කොටුවල කඩොලාන පරිසර පද්ධතිය පිළිසකර කිරීම.
සිද්ධි අධ්‍යයනය, ආර්.එම්. ඩී. අලවතුගොඩ මිය

(ආ) ශ්‍රී ලංකාව තුල ඉන්දියානු සුදු හදුන් ගෘහස්ථකරණය (*Santalum album*) ; අභියෝග සහ අවස්ථාඃ ආර්.එම්.ඩී. අලවතුගොඩ මිය

(ඇ) ශ්‍රී ලංකාවේ වන තවාන්වල සහ වන වගාවල ආක්‍රමණශීලී කෘමීන් ඇතිවීම :
ආර්.එම්.ඩී. අලවතුගොඩ මිය

(ඈ) *Tectona grandis* සඳහා වඩා හොද වර්ධනයක් : කෘෂිකාර්මික වගාව සමග ඒකාබද්ධ කිරීමඃ ආර්.එම්.ඩී. අලවතුගොඩ මිය

(ඉ) සත්ව විවිධත්වය සංරක්ෂණය කිරීම කෙරෙහි *Pleurostylia opposite* (පානක්කා) ශාකයේ කාර්ය භාරය.
සිද්ධි අධ්‍යයනයඃ ආර්.එම්.ඩී. අලවතුගොඩ මිය

(ඊ) වනාන්තර ප්‍රතිචාරය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් නකල්ස් අඩවියේ පිහිටි දෝතළුගල වනාන්තරයේ ශාක විවිධත්වය. : එස්.එච්.බන්දුමාලා මිය

(උ) පිළිසකර කිරීම් සඳහා වියලි සදාහරිත වනාන්තරවල හායන මට්ටම් හදුනා ගැනීම. :
එස්.එච්.බන්දුමාලා මිය

### 4.9. අංශයේ මූල්‍යමය කාර්ය සාධනය

මෙම අංශයට ලැබුණු සම්පූර්ණ ප්‍රතිපාදන ප්‍රමාණය වන රුපියල් මිලියන 27.4 ක මුදලින් රුපියල් මිලියන 26.98 ක් වියදම් කරන ලදි.

## 05 වන පරිච්ඡේදය
## වන ආරක්ෂණ සහ නීති ක්‍රියාත්මක කිරීමේ අංශය

### 5.1 හැඳින්වීම

වන ආරක්ෂණ සහ නීති ක්‍රියාත්මක කිරීමේ අංශයේ ප්‍රධාන අරමුණ වන්නේ, නීතිමය ආරක්ෂාව තහවුරු කර, ස්වභාවික වනාන්තර, වන වගා සහ එහි සිටින වන ජීවීන්ද, අනෙකුත් ජෛව විවිධත්වය සඳහා දායකවන සම්පත්ද, සුරැකීමට සහ සංරක්ෂණය කිරීමට සහාය වී, එමඟින් වනාන්තර වලින් සැපයෙන පාරිසරික සේවාවන් සහ වනජ නිෂ්පාදන අඛණ්ඩව සැපයීමට, රජයට අයත් වන සම්පත් වලට ලැබිය යුතු නීතිමය ආරක්ෂාව සැපයීමයි. මීට අමතරව ප්‍රාදේශීය කාර්ය මණ්ඩලය, හදිසි වැටලීම් අංශ සහ දැව පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථාන හරහා, වන නීතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු සිදු කරයි.

### 5.2 ප්‍රධාන ක්‍රියාකාරකම්

වන ආරක්ෂණ සහ නීති ක්‍රියාත්මක කිරීමේ අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම් පහත දක්වා තිබේ.

i. වන සංරක්ෂණ ආඥා පනතේ පරිපාලනමය කටයුතු.

ii. වන සංරක්ෂණ ආඥා පනත යටතේ වනාන්තර ප්‍රකාශයට පත් කිරීම.

iii. දැව පදනම් කරගත් කර්මාන්ත සහ දැව ප්‍රවාහනය පාලනය කිරීම.

iv. රජයේ වනාන්තර සම්පත්, භෞතික වශයෙන් ආරක්ෂා කිරීම සහ පාලනය කිරීම.

v. වන සංරක්ෂණ දෙපාර්තමේන්තු අරමුදලේ, පරිපාලන කටයුතු සිදු කිරීම.

vi. වන නිලධාරීන් සදහා නිල ඇඳුම් මිලදී ගැනීම හා සැපයීම.

vii. දැව සහ දැව නොවන වනජ ද්‍රව්‍ය අපනයනය පාලනය කිරීම.

### 5.3. ආයතනික සැකැස්ම

මෙම වසර තුලදී මෙම අංශය, ප්‍රධාන කාර්යාලයේ සිටින එක් සහකාර වන සංරක්ෂකවරයකුගේ සහ ජ්‍යෙෂ්ඨ වන පාලකවරු තිදෙනෙකුගේ සහාය ඇතිව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය වන සංරක්ෂක වරයකු විසින් මෙහෙයවන ලදී.

දිසා වන නිලධාරීන් 23 දෙනාට සහ ඔවුන්ගේ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයට, අදාල දිසාවන්හි පිහිටි රජයේ වනාන්තර ආරක්ෂා කිරීම සහ නීති ක්‍රියාත්මක කිරීම යන කටයුතු වල වගකීම පැවරී තිබේ.

ප්‍රාදේශීය ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය හැරුණ විට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය වන සංරක්ෂක / කලාප නියෝජ්‍ය වන සංරක්ෂක / අදාල දිසාවන්හි දිසා වන නිලධාරීන්ගේ අධීක්ෂණය සහ මඟ පෙන්වීම යටතේ සෘජුවම ක්‍රියාත්මක වන, පහත සඳහන් ඒකකද පාලනය වේ.

| | | | |
|---|---|---|---|
| i) | හදිසි වැටලීම් අංශය | - | 02 |
| ii) | ස්ථිර දැව පරීක්ෂාකිරීමේ මධ්‍යස්ථාන<br>(හංවැල්ල, දඹුල්ල, තණමල්විල, පස්යාල,) | - | 04 |

ප්‍රධාන කාර්යාලයේ හදිසි වැටලීම් අංශය අඩවි වන නිලධාරීන් 01, බීට්ටු වන නිලධාරීන් 03, සහ එක් වන ක්ෂේත්‍ර සහකාරවරයකුගෙන් සමන්විත වන අතර විශේෂ වන පාලකවරයෙකුගේ අධීක්ෂණය යටතේ පවතී. මෙය නීති විරෝධී ක්‍රියාකාරකම් මැඩ පැවැත්වීමට අදාල හදිසි වැටලීම් කටයුතු වල නිරත වේ.

අදාල දිසා වන නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ, දැව පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථාන ක්‍රියාත්මක වන අතර, මෙම ඒකක ජ්‍යෙෂ්ඨ අඩවි වන නිලධාරියෙකුගේ මූලිකත්වයෙන් ක්‍රියා කරයි.

## 5.4. ක්‍රියාකාරකම් පිළිබඳ සාමාන්‍ය සමාලෝචනයක්

ආරක්ෂණය සහ සම්බන්ධ ප්‍රධාන කාර්ය භාරයන් දිසාවන් 23 ට අනුබද්ධව සේවය කරන ප්‍රාදේශීය කාර්ය මණ්ඩලය විසින් ඉටු කරයි. 2013 වසර තුලදී මෙම දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය විසින් වන අපරාධ 3023 ක් නීතියට හසුකරගෙන තිබේ.

මහජනයාගෙන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය වන සංරක්ෂක වෙත හෝ වන සංරක්ෂක ජනරාල් වෙත හෝ අමාත්‍යාංශය වෙත හෝ ජනාධිපති කාර්යාලය වෙත ඍජුව ලැබෙන තොරතුරු මත විශාල ප්‍රමාණයේ වන අපරාධ වැටලීම සඳහා ප්‍රධාන කාර්යාලයේ හදිසි වැටලීම් අංශය යෙදවීමට ක්‍රියා කරයි.

වන සංරක්ෂණ ආඥා පනතේ නියෝගවලට අනුකූලව දවසේ පැය 24 පුරාම නීති විරෝධී දැව සහ වනජ නිෂ්පාදන ප්‍රවාහනයන් අල්ලා ගැනීම සඳහා ස්ථිර දැව පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථාන ක්‍රියාත්මක වේ.

දැව ඉරුම්හල්, දැව අලෙවිසැල්, යාන්ත්‍රික සහ යාන්ත්‍රික නොවන වඩුමඩු, දර අලෙවිසැල් ආදිය ලියාපදිංචි කිරීම, ප්‍රාදේශීය ලේකම් වරුන්ගේ නිර්දේශ මත දිසා වන නිලධාරීන් විසින් සිදු කරනු ලැබේ.

වන සංරක්ෂණ ආඥා පනත අනුව ශ්‍රී ලංකාවේ වනාන්තර සංරක්ෂණ වනාන්තර ලෙස හෝ රක්ෂිත වනාන්තර ලෙස ප්‍රකාශයට පත් කිරීම මෙම අංශය මගින් සිදු කරන තවත් ප්‍රධාන කාර්යයකි.

ඉහත ක්‍රියාකාරකම් වලට අමතරව දැව / දැවමය නිෂ්පාදන සහ ශාක / ශාකමය ද්‍රව්‍ය අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කරමින් එම ද්‍රව්‍ය අපනයනය නියාමනය කිරීමද මෙම අංශයේ වගකීමක් වේ.

## 5.5. වන සංරක්ෂණ ආඥා පනත යටතේ නව වනාන්තර ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම

2013 වසර තුල එම කාර්යයන් යටතේ අති විශේෂ ගැසට් 18 ක් නිකුත් කරන ලද අතර, සංරක්ෂිත වනාන්තර 18ක් හා රක්ෂිත වනාන්තර 74 ක් යනාදී වශයෙන් වනාන්තර 92ක් ප්‍රකාශයට පත් කරන ලදී.

## 5.6 ආරක්ෂණ කටයුතු වල ප්‍රගතිය

### 5.6.1. සාමාන්‍ය

නීති විරෝධී දැව හෙළීම්, එළි පෙහෙළි කිරීම්, ප්‍රවාහනය, මැණික් ගැරීම්, රජයේ දැව සන්තකයේ තබාගැනීම සහ ලියාපදිංචියක් රහිතව පුද්ගලික දැව ව්‍යාපාර පවත්වාගෙන යාම ආදිය ඇතුලත් වන අපරාධ 3023 ක් 2013 වසර තුලදී වාර්තා වී ඇත.

දෙපාර්තමේන්තුව විසින් නීති විරෝධී දැව සන්තකයේ තබාගැනීම් 143 ක් පිළිබඳව අවසන් තීරණ ගන්නා ලද අතර, ඉතිරි වන අපරාධ 2880 ක් උසාවියට ඉදිරිපත් කරන ලදී. ඒවාට පුද්ගලයින් 3,652 ක් අදාල වී තිබේ. මේවාට අයත් නඩු 20 කදී පුද්ගලයින් සිරගත කරන ලද අතර, තවත් නඩු 63 කදී අදාල පුද්ගලයින්ට දැඩි ලෙස අවවාද කර තිබේ. තවත් නඩු 1866 කදී වැරදිකරුවන්ගෙන් රු. 49,478,625.97 ක මුදලක් දඩ ලෙස අය කරගෙන තිබේ. රාජසන්තක කරන ලද වාහන අතර ලොරි 17, ලෑන්ඩ් මාස්ටර් 45, ට්‍රැක්ටර් 05, එක්ස්කැවේටර් 01, යතුරු පැදි 01, පාපැදි 07, ගොන් කරත්ත 02ක් වන අතර ඒවායේ මුළු වටිනාකම රු. 31,924,000.00 කි. වන අපරාධ පිළිබඳ වැඩිදුර විස්තර ඇමුණුම් I , II , සහ III මගින් දැක්වේ.

### 5.6.2 හදිසි වැටලීම් ඒකකයන්හි කාර්ය සාධනය

හදිසි වැටලීම් ඒකකයන්ගේ කාර්ය සාධනය පහත 5.1 වගුවේ දක්වා තිබේ.

**වගුව 5.1 හදිසි වැටලීම් අංශයේ ප්‍රගතිය**

| ඒකකයේ නම | වන අපරාධ සංඛ්‍යාව | දැව පරිමාව (ඝන මීටර) | දැව වටිනාකම (රු) | දඩය (රු) |
|---|---|---|---|---|
| රත්නපුර කලාපය | 03 | 39.3800 | 80,039.99 | 10,000.00 |

### 5.6.3 දැව පරීක්ෂණ මධ්‍යස්ථාන

2013 වසර තුලදී හංවැල්ල, තණමල්විල, දඹුල්ල සහ පස්යාල යන ස්ථානවල දැව පරීක්ෂණ මධ්‍යස්ථාන ක්‍රියාත්මක විය.

### 5.6.4 පුද්ගලික දැව ව්‍යාපාර

2013 වසර තුලදී දැව ඉරුම් හල් 399 ක් , දැව අලෙවි සැල් 832, යාන්ත්‍රික වඩු මඩු 1,107, යාන්ත්‍රික නොවන වඩුමඩු 314, ගෘහභාණ්ඩ වෙළඳසැල් 1,375 සහ දර විකුණුම්හල් 212ක් අළුතින් ලියා පදිංචි කරන ලදී. (ඇමුණුම IV)

2013 වසර අවසාන වනවිට ලියාපදිංචි දැව ව්‍යාපාර සංඛ්‍යාව 18,724 ක් ලෙස වාර්තා වී තිබුණි. (ඇමුණුම V)

### 5.7 පුහුණු වැඩසටහන්

පහත සඳහන් දැනුවත් කිරීමේ සහ පුහුණු කිරීමේ වැඩ සටහන් අදාල වර්ෂය තුලදී සිදුකරන ලදී.

i. පොලිස් නිලධාරීන් 535ක් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 15 ක් පවත්වන ලදී.

ii. ප්‍රාදේශීය ලේකම්වරුන් 1,718ක් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 35 ක් පවත්වන ලදී.

iii. වන නිලධාරීන් 501 ක් සඳහා, දැනුවත් කිරීමේ වැඩසටහන් 45ක් සිදුකරන ලදී.

iv. වෙනත් පුද්ගලයින් 6,500 ක් සඳහා, දැනුවත් කිරීමේ වැඩසටහන් 174ක් පවත්වන ලදී.

v. වන නිලධාරීන් 459 ක් සඳහා ගිනි අවි පුහුණු වීම් 18ක් පවත්වන ලදි.

vi. වන නිලධාරීන් 130 ක් සඳහා වන නීතිය පිළිබද විශේෂ පුහුණු වැඩසටහන් 02 ක් පවත්වන ලදී. ( ඇමුණුම VI)

### 5.8 ත්‍යාග මුදල් ලබා දීම

උසාවිය මගින් වරදකරුවන් කරන ලද වන අපරාධ වලට අදාලව කරන ලද කටයුතු වෙනුවෙන් 2013 වසර තුලදී රුපියල් 4,409,775.70 ක මුදලක් නිලධාරීන් 1,229 ක් සහ තොරතුරු ලබාදුන් පුද්ගලයින් 16ක් අතර බෙදා දෙන ලදී. (වැඩිදුර විස්තර ඇමුණුම VII හි දක්වා ඇත.)

### 5.9 වන ආරක්ෂණ කමිටු රැස්වීම්

දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ මූලිකත්වයෙන් පවත්වන ලද දිස්ත්‍රික් වන ආරක්ෂණ රැස්වීම් වලදී, ඒ ඒ දිස්ත්‍රික්කවල වන ආරක්ෂණ කටයුතු සමාලෝචනය කරන ලදී. 2013 වසර තුල මෙවැනි රැස්වීම් 101ක් පවත්වන ලදී.

### 5.10 මූල්‍යමය ප්‍රගතිය

වන සංරක්ෂණ දෙපාර්තමේන්තු අරමුදල යටතේ සිදු කරනු ලබන ක්‍රියාකාරකම් සඳහා 2013 වසරේදී ලද සම්පූර්ණ ප්‍රතිපාදන ප්‍රමාණය රු. 17,160,000.00 කි. 2013 වසරේදී නිල ඇඳුම් සඳහා රු. 13,000,000.00 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් වූ අතර, එයින් 9,573,952.00 ක මුදලක් වියදම් වී ඇත. වන සංරක්ෂණ දෙපාර්තමේන්තු අරමුදලේ මූල්‍යමය ප්‍රගතිය 94.39% ක් වන අතර නිල ඇඳුම් සඳහා වැය වූ ප්‍රතිපාදන ප්‍රමාණය මත එහි මූල්‍යමය ප්‍රගතිය 73.7% ක්ද වේ.

(වගුව 5.2 මගින් වැඩිදුර තොරතුරු දැක්වේ.)

**වගුව : 5.2 වන සංරක්ෂණ දෙපාර්තමේන්තු අරමුදලේ මූල්‍යමය ප්‍රගතිය**

| **විෂය** | **ප්‍රතිපාදන** | **වියදම** | **ප්‍රගතිය %** |
|---|---|---|---|
| වන සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන්ට සහ අනෙකුත් තොරතුරු සැපයුවන්ට ලබාදුන් ත්‍යාග මුදල් | 6,400,000.00 | 6,321,010.00 | 91.76 |
| ගමන් වියදම් (උසාවි) | 4,000,000.00 | 3,675,000.00 | 91.87 |
| වන ආරක්ෂණ ක්‍රියාකාරකම් | 5,200,000.00 | 4,787,251.70 | 92.06 |
| පුහුණු වීම් | 1,200,000.00 | 1,061,290.00 | 88.44 |
| වෙනත් (බලපත්‍ර පොත් මුද්‍රණය , ගැසට් ප්‍රකාශයට පත් කිරීම ආදිය) | 360,000.00 | 354,379.20 | 98.43 |
| **එකතුව** | **17,160,000.00** | **16,198,930.90** | **94.39** |

### 5.11 වනාන්තර නොවන ප්‍රභව වලින් ලබා ගන්නා නිෂ්පාදන අපනයනය කිරීම

වනාන්තර නොවන ප්‍රභව වලින් ලබා ගන්නා නිෂ්පාදන අපනයනය කිරීම සඳහා අනුමැතිය ලබා දීමද මෙම අංශය මගින් ඉටු කෙරේ. ඒ යටතේ 2013 වසර තුල එක්දින සේවාවන් තුලින් රු. 866,960.00 ක මුදලක්ද , සාමාන්‍ය සේවාවෙන් තුලින් රු. 759,798.50 ක මුදලක්ද, ශාක/ශාකමය ද්‍රව්‍ය සහ බීජ අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීමෙන් අදාල වර්ෂය තුලදී උපයා ගෙන තිබේ. තවද ගෘහ භාණ්ඩ, අත්කම් භාණ්ඩ, සෙල්ලම් බඩු සහ අගය එකතු කරන ලද දැවමය නිෂ්පාදන අපනයනය සඳහා එක් දින සේවාව මගින් බලපත්‍ර නිකුත් කිරීමෙන් රු.2,294,558.00 ක්ද, සාමාන්‍ය සේවාව මගින් බලපත්‍ර නිකුත් කිරීමෙන් රු.759,010.00 ක්ද උපයාගෙන තිබේ. මෙලෙස ඉහත දැක්වූ සියළුම සේවාවන් මගින් රු.4,680,326.50 ක සම්පූර්ණ ආදායමක් උපයා තිබේ. .(ඇමුණුම VIII, IX, X සහ XI )

### 5.12 විවිධ වර්ගයේ වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීම සහ ඉන් ලද ආදායම

2013 වසර තුලදී විදුලි සංදේශ කුළුණු, ජල විදුලි බලාගාර, සහ වන සෙනසුන් සඳහා බලපත්‍ර නිකුත් කිරීම සහ අනෙකුත් ක්‍රියාකාරකම් මගින්ද රු.14,915,735.60 ක මුදලක් විසින් උපයාගෙන තිබේ.

# 06 වන පරිච්ඡේදය
# සැලසුම් හා ප්‍රගති පාලන අංශය

## 6.1 හැඳින්වීම

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ විවිධ ක්‍රියාකාරකම් වලට අදාළ වාර්ෂික සැලසුම් සකස් කිරීමේ ප්‍රධාන වගකීම පැවරී ඇත්තේ සැලසුම් හා ප්‍රගති පාලන අංශය වෙතයි. වාර්ෂික සැලසුම් හා අයවැය සකස් කිරීම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය හා සම්බන්ධ වන සියළුම ව්‍යාපෘතිවල ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ ප්‍රගතිය වාර්තා කිරීම සහ නව ව්‍යාපෘති සඳහා වාර්තා සැකසීම සැලසුම් හා ප්‍රගති පාලන අංශයේ ප්‍රධාන කර්තව්‍යයන් වේ.

## 6.2 මෙම අංශයේ ප්‍රධාන අරමුණු

i. ඉදිරි වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ අය වැය ඇස්තමේන්තු සැකසීම.

ii. ප්‍රාග්ධන අයවැය යටතේ මුල්‍යමය බැඳීම් ඇතුළු වාර්ෂික වැඩසටහන දෙපාර්තමේන්තුව වෙනුවෙන් සැලසුම් කිරීම.

iii. දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ක්‍රියාකාරකම් පිළිබඳව මාසික ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය ඇතුළු විවිධ ආයතයන වලට ප්‍රගතිය වාර්තා කිරීම.

iv. විදේශ අරමුදල් සහ ඒකාබද්ධ අරමුදල් ලබා ගැනීම සඳහා ව්‍යාපෘති වාර්තා සකස් කිරීම.

v. නව ගොඩනැගිලි ඉදි කිරීම සහ දැනට තිබෙන ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම මගින් දෙපාර්තමේන්තුවට අවශ්‍ය කරන යටිතල පහසුකම් ගොඩ නැංවීම.

vi. වාර්ෂික කාර්ය සාධන වාර්තාව සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය තුනෙන්ම පිළියෙල කිරීම හා එම වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ඉදිරිපත් කිරීම.

## 6.3 ආයතනික සැකැස්ම

සැලසුම් හා ප්‍රගති පාලන අංශය, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය වන සංරක්ෂකවරියකගේ පාලනය යටතේ පැවතිනි.

## 6.4 ප්‍රධාන ක්‍රියාකාරකම්

මෙම වාර්තා කරන කාලය තුළ පහත සඳහන් ප්‍රධාන ක්‍රියාකාරකම්, සැලසුම් සහ ප්‍රගති පාලන අංශය විසින් සිදු කරන ලදී.

### 6.4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රාග්ධන අයවැය සකස් කිරීම

2013 වසර සඳහා දෙපාර්තමේන්තුවේ වාර්ෂික වැඩසටහන සහ 2014 වසරේ දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයන් සියල්ල සැලකිල්ලට ගෙන, 2014 වසර සඳහා වාර්ෂික ප්‍රාග්ධන අයවැය සකස් කරන ලදී.

### 6.4.2 ප්‍රගති වාර්තා සැපයීම

ප්‍රාග්ධන අයවැය යටතේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වල ප්‍රගතිය කාර්තුවට වරක් වශයෙන් පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය වෙත යවන ලදී. වෙනත් විවිධ ආයතන වෙත ඒවායේ ඉල්ලීම සහ අවශ්‍යතාව අනුව වරින්වර ප්‍රගති වාර්තා ඉදිරිපත් කරන ලදී.

මහින්ද චින්තන වැඩසටහන සඳහා දිගු කාලීන හා කෙටි කාලීන සැලසුම් සකස් කිරීම, කාර්තුවකට වරක් සහ වාර්ෂිකව වාර්තා සකස් කිරීම, මෙම වසර තුලදී සිදු කරන ලදී.

අදාල කාලය තුලදී, 2012 වසර තුල දෙපාර්තමේන්තුව විසින් සිදුකල ක්‍රියාකාරකම් පිළිබඳ සියළු තොරතුරු අඩංගු කාර්ය සාධන වාර්තාවක් සකස් කරන ලදී.

### 6.4.3. ගොඩනැගිලි ඉදිකිරීම සහ අළුත්වැඩියාව

#### 6.4.3.1 ගොඩනැගිලි ඉදිකිරීම

සමාලෝචනය සිදු කල වසර තුලදී ඒකාබද්ධ අරමුදලේ, මුදල් උපයෝගී කර ගනිමින් ගොඩනැගිලි 04ක ඉදි කිරීම් කටයුතු සිදු කරන ලදී. මේ පිළිබඳ වැඩිදුර තොරතුරු වගුව 6.1 මගින් දැක්වේ.

**වගුව 6.1 ඒකාබද්ධ අරමුදල උපයෝගී කර ගනිමින් ඉදි කල ගොඩනැගිලි පිළිබඳ තොරතුරු -2013**

| දිසාව | ගොඩනැගිල්ල |
|---|---|
| මුලතිව් | අඩවි වන කාර්යාලය - ඕලුමඩු |
| කිලිනොච්චි | අඩවි වන කාර්යාලය - පලෙයි |
| මන්නාරම | අඩවි වන කාර්යාලය - මන්නාරම |
| ත්‍රිකුණාමලය | අඩවි වන කාර්යාලය - කන්තලේ |

ඉහත වැඩසටහනේ මූල්‍යමය කාර්ය සාධනය පහත දැක්වේ ( වගුව 6.2)

**වගුව 6.2 : 2013 වසර තුල ගොඩනැගිලි ඉදිකිරීම හා සම්බන්ධ මූල්‍යමය කාර්ය සාධනය**

| අරමුදල | වාර්ෂික ප්‍රතිපාදන (රු.) | වියදම (රු..) | ප්‍රගතිය (%) |
|---|---|---|---|
| ඒකාබද්ධ අරමුදල | 12,000,000.00 | 11,999,788.15 | 99.99 |

**6.4.3.2 ගොඩනැගිලි නඩත්තු කිරීම**

මෙම වසර තුලදී ගොඩනැගිලි නඩත්තු කිරීමේ වැඩසටහන් යටතේ ගොඩනැගිලි 72 ක නඩත්තු කටයුතු සිදු කරන ලදී ඒ පිළිබඳ වැඩිදුර විස්තර වගුව 6.3 මගින් දැක්වේ.

**වගුව 6.3 : වර්ෂ 2013 තුල නඩත්තු කරන ලද ගොඩනැගිලි වල තොරතුරු.**

| ගොඩනැගිල්ල | ස්ථානය | | |
|---|---|---|---|
| දිසා වන කාර්යාල | 1. ගම්පහ | | |
| | 2. මාතලේ | | |
| | 3. මාතර | | |
| | 4. වවුනියා | | |
| දිසා වන නිලධාරී නිල නිවාස | 1. පුත්තලම | | |
| අඩවි වන කාර්යාල | 1 .ගම්පහ | - | ගම්පහ |
| | 2. මාතලේ | - | මාතලේ |
| | 3.කෑගල්ල | - | කිතුල්ගල |
| | 4. ගාල්ල | - | නෙළුව |
| | 5. මාතර | - | මාතර |
| | 6. මාතර | - | කඹුරුපිටිය |
| | 7. පොළොන්නරුව | - | හබරණ |
| | 8. වවුනියා | - | නෙදුන්කනී |
| | 9. වවුනියා | - | වවුනියා |
| | 10. කිලිනොච්චිය | - | කිලිනොච්චිය |
| අඩවි වන නිලධාරී නිල නිවාස | 1. නුවරඑළිය | - | නුවරඑළිය |
| | 2. බදුල්ල | - | බදුල්ල |
| | 3. ත්‍රිකුණාමලය | - | ත්‍රිකුණාමලය |
| බීට්ටු වන නිලධාරී නිල නිවාස | 1.කුරුණෑගල | - | බරිගොඩ |
| | 2.කළුතර | - | ඉංගිරිය |
| | 3.කළුතර | - | වග |
| | 4.කළුතර | - | අගලවත්ත |
| | 5.පුත්තලම | - | මහකුඹුක්කඩවල |
| | 6.පුත්තලම | - | පරමාකන්ද |
| | 7.පුත්තලම | - | කලාඔය පැල තවාන |
| | 8.පුත්තලම | - | අට්ටවිල්ලුව |
| | 9.මහනුවර | - | පුංචිකැලේ |
| | 10.මහනුවර | - | රඹුක්වැල්ල |
| | 11.මාතලේ | - | නාඋල |
| | 12.මාතලේ | - | දඹුල්ල |
| | 13.මාතලේ | - | කළුදැවල |
| | 14.නුවරඑළිය | - | මස්කෙලිය |
| | 15.නුවරඑළිය | - | පිදුරුතලාගල |
| | 16.නුවරඑළිය | - | කඳපොල |
| | 17.බදුල්ල | - | මහියංගනය |
| | 18.මොණරාගල | - | බුත්තල |
| | 19.මොණරාගල | - | බිබිල |
| | 20.මොණරාගල | - | සියඹලාණ්ඩුව |
| | 21.රත්නපුර | - | රත්තනගොල්ල |
| | 22.රත්නපුර | - | කණාදොල |

| | |
|---|---|
| | 23.රත්නපුර - තලගහකන්ද<br>24.රත්නපුර - මියනපලාව<br>25.කෑගල්ල - නාරම්බැද්ද<br>26.කෑගල්ල - හක්බෙල්ලාව<br>27.ගාල්ල - යක්කටුව<br>28.ගාල්ල - ඉමදූව<br>29.මාතර - අතුරලිය<br>30.මාතර - දොළමාවත<br>31.මාතර - කැකුන්දෙනිය<br>32.හම්බන්තොට - රිදියගම<br>33.හම්බන්තොට - කුඩාගම්මාන 11<br>34.අනුරාධපුර - අනුරාධපුර<br>35.අනුරාධපුර - කෝපාකුලම<br>36.අනුරාධපුර - කහල්ල<br>37.අනුරධපුර - පලුගස්වැව<br>38.පොළොන්නරුව - හබරණ<br>39.පොළොන්නරුව - හතරුස්කොටුව<br>40.පොළොන්නරුව - බටුඔය<br>41.පොළොන්නරුව - මනම්පිටිය<br>42.ත්‍රිකුණාමලය - ලව්ලේන්<br>43.මඩකලපුව - මඩකලපුව<br>44.අම්පාර - පදියතලාව<br>45.අම්පාර - වඩිනාගල<br>46.අම්පාර - මහඔය<br>47.කිලිනොච්චි - අරුවියල්නගර් |
| සංචාරක බංගලා | 1. මාතර - නාදුගල<br>2. බදුල්ල - හපුතලේ |
| තවාන් ගොඩනැගිලි | 1. කළුතර - දෙපානම |
| තොරතුරු මධ්‍යස්ථාන | 1. ගාල්ල - කොට්ටව |
| ක්ෂේත්‍ර පරීක්ෂණ නිවාසය | 1. ත්‍රිකුණාමලය - ක්ෂේත්‍ර පරීක්ෂණ නිවාසය |
| සංචාරක බංගලා භාරකරු නිල නිවාසය | 1. ගාල්ල - වැකුණගොඩ |
| සුළු සේවක නිවාස සංකීර්ණය | 1. නුවරඑළිය - හාවාළිය |

සමාලෝචනය සිදු කරන වසර තුල ගොඩනැගිලි නඩත්තු කිරීමේ වැඩසටහනේ මූල්‍යමය ප්‍රගතිය පහත දැක්වේ. (වගුව 6.**4** )

**වගුව 6. 4. ගොඩනැගිලි නඩත්තුව - මූල්‍යමය ප්‍රගතිය 2013**

| වාර්ෂික ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | ප්‍රගතිය (%) |
|---|---|---|
| 22,000,000.00 | 21,997,229.66 | 99.98 |

# 07 වන පරිච්ඡේදය
# මානව සම්පත් කළමනාකරණ, පරිපාලන සහ ආයතනික සංවර්ධන අංශය

## 7.1. හැඳින්වීම.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මානව සම්පත් කළමනාකරණ, පරිපාලන සහ ආයතනික සංවර්ධන අංශය වෙත සමස්ථ පරිපාලන කටයුතු සිදු කිරීම සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සේවකයින්ගේ සහ ආයතනික පද්ධතියේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා සුදුසු පරිපාලන සහ කළමනාකරණ වැඩ රාමු තුල ප්‍රධාන කාර්යාලය, කලාප කාර්යාල, දිසාවන කාර්යාල සහ අඩවි වන කාර්යාල වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම යන වගකීම් පැවරී තිබේ.

පිරිස් සහ පාලන යන විෂයන්ට අදාල විවිධ කටයුතු 2013 වසරේදී මෙම අංශය විසින් ක්‍රියාත්මක කරන ලද අතර මෙම කටයුතු සේවා ව්‍යවස්ථා, බඳවා ගැනීමේ පටිපාටි, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ අනෙකුත් අදාළ චක්‍රලේඛ යනාදී රාජ්‍ය/ රජයේ සහ අනෙකුත් අදාල නිතී, නියමයන් සහ නියෝගයන්ගේ සීමාවන් ඇතුලත සිටිමින් මෙම අංශය විසින් ක්‍රියාත්මක කරන ලදී.

2013 වසර අවසන් වන විට ජ්‍යෙෂ්ඨ, තෘතීක, ද්විතියික සහ ප්‍රාථමික යන සියළුම කාණ්ඩ වලින් සමන්විත වන පහත දක්වා ඇති ආකාරයේ සේවක සංඛ්‍යාවක් මෙම දෙපාර්තමේන්තුව සතුය. ඒ අනුව දෙපාර්තමේන්තුවේ සේවක සංඛ්‍යාව 2,269ක් වූ අතර පුරප්පාඩු 850 ක් පැවතිනි. වැඩිදුර විස්තර 7.1 වගුවේ දැක්වේ.

වගුව 7:1

| | අනුමත සේවක සංඛ්‍යව | දැනට සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 85 | 44 | 41 |
| තෘතීක මට්ටම | 42 | 30 | 12 |
| ද්විතියික මට්ටම | 1,383 | 977 | 406 |
| ප්‍රාථමික මට්ටම | 1,609 | 1,218 | 391 |
| එකතුව | 3,119 | 2,269 | 850 |

## 7.2. බඳවා ගැනීම්

- සංවර්ධන සහකාරවරු 36 කට, බීට්ටු වන නිලධාරින් 26 කට සහ කම්කරුවන් 06 කට පත්වීම් ලිපි ලබාදෙන ලදී.
- දෙපාර්තමේනතුවේ විධායක සේවක සංඛ්‍යාව ඉහල නැංවීම සඳහා වන සංරක්ෂක (පර්යේෂණ ) නව තනතුර ඇති කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගන්නා ලදී.
- රාජ්‍ය කළමනාකරණ සහකාරවරු 16 ක් බඳවා ගැනිමට අනුමැතිය ලබාගෙන තිබේ.

## 7.3. උසස්වීම්

- වන සංරක්ෂක ( පර්යේෂණ සහ අධ්‍යාපන) ලෙස සේවය කල අනුර සතුරුසිංහ මහතා වන සංරක්ෂක ජනරාල් තනතුරට කැබිනට් මණ්ඩලය මගින් උසස් කරන ලදී.
- වන සංරක්ෂක ( පිරිස් සහ පාලන ) ලෙස සේවය කරමින් සිටි ඩබ්.ඒ.එස්.බී.අමරතුංග මහතා අතිරේක වන සංරක්ෂක ජනරාල් ( මානව සම්පත් කළමනාකරණ, පරිපාලන සහ ආයතිනක සංවර්ධන ) තනතුරට උසස් කරන ලදී.
- නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) ලෙස සේවය කල යූ.ඩී.එන්.එස්.සිරිවර්ධන මහත්මිය ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුරට උසස් කරන ලදී.
- රජයේ ආයතන ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන යටතේ අළුතින් අනුමත කරගත් ජ්‍යෙෂ්ඨ තනතුරු (10) සඳහා නිලධාරින් පත් කිරීමට අවශ්‍ය උපලේඛණ සහ අනෙකුත් තොරතුරු පරිසර සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය සහ රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යන අමාත්‍යාංශ හරහා රාජ්‍ය සේවා කොමිසන් සභාවට ඉදිරිපත් කර තිබේ.

### 7.4. විශ්‍රාම ගැනීම්

අදාළ කාල වකවානුව තුල පහත සදහන් තනතුරු දරණ ලද නිලධාරීන් විශ්‍රාම ගන්නා ලදී.

- වන සංරක්ෂක ජනරාල්
- එක් නියෝජ්‍ය වන සංරක්ෂකවරියක
- වන පාලකවරුන් තුන්දෙනෙකු
- අඩවි වන නිලධාරීන් සිව්දෙනෙකු
- රාජ්‍ය කළමනාකරණ සහකාරවරු දහ හතර දෙනෙකු
- බිට්ටු වන නිලධාරීන් දහතුන් දෙනෙකු
- වන ක්ෂේත්‍ර සහකාරවරු හයදෙනෙකු
- රියදුරන් සිව්දෙනෙකු
- කාර්යාල කාර්ය සහයකයින් තිදෙනෙකු
- කම්කරුවන් තිදෙනෙකු

### 7.5. විනය කටයුතු

#### 7.5.1. වැඩ තහනම් කිරීම්

අදාළ කාල වකවානුව තුල පහත සදහන් තනතුරු දරණ ලද නිලධාරීන් විනය හේතු මත වැඩ තහනමට ලක් කරන ලදී.

- බීට්ටු වන නිලධාරීන් දෙදෙනෙක්
- වන ක්ෂේත්‍ර සහකාරවරු දෙදෙනෙක්

#### 7.5.2. නැවත සේවයේ පිහිටුවීම

වැඩ තහනමට ලක්ව සිටි පහත සදහන් තනතුරු දරණ නිලධාරීන් නැවත සේවයේ පිහිටුවන ලදී.

- එක් බීට්ටු වන නිලධාරියකු
- වන කෙෂ්ත්‍ර සහකාරවරු දෙදෙනෙකු
- එක් කම්කරුවෙකු

#### 7.5.3. විනය පරීක්ෂණ

- 2013 වසර තුල විනය පරීක්ෂණ 05 ක කටයුතු සම්පූර්ණ කර තිබෙන අතර, විනය පරීක්ෂණ 06 ක කටයුතු සිදුකරගෙන යයි.

### 7.6. ණය ලබාදීම

දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයට අයත් නිලධාරීන්ට රජයේ සේවකයින්ට හිමි ණය යටතේ පහත සදහන් ණය ලබා දීම් අදාල වර්ෂය තුල ඉටු කර ඇත.

- නිවාස ණය - 23
- ආපදා ණය - 114
- බයිසිකල් ණය - 06

### 7.7. විභාග

- රියදුරන් සහ කාර්යාල කාර්ය සහයකයින් හට කාර්යක්ෂමතා කඩඉම් විභාගය පවත් වන ලදී.
- දෙපාර්තමේන්තුවේ සේවය කරන සහකාර වන සංරක්ෂකවරු, අඩවි වන නිලධාරීන් ,බීට්ටු වන නිලධාරීන් , වන ව්‍යාප්ති නිලධාරීන් සහ වන කේෂ්ත්‍ර සහකාරවරුන් සදහා වන නීතිය විභාග පවත්වා ප්‍රතිඵල ද නිකුත් කරන ලදී.
- වන ක්ෂේත්‍ර සහකාරවරු බීට්ටු වන නිලධාරි තනතුරට උසස් කිරීම සදහා විභාග පැවැත්වීමට අවශ්‍ය කරන උපලේඛණ සහ තොරතුරු විභාග දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබේ.

### 7.8. රාජ්‍ය අංශය ප්‍රතිව්‍යුහගත කිරීම.

- බඳවා ගැනීමේ පටිපාටි 08 ක් අනුමත කරගෙන තිබේ. තවත් බඳවා ගැනීමේ පටිපාටි 05ක් අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබේ.
- අඩවි වන නිලධාරී පුරප්පාඩු 95 ක්, රාජ්‍ය කලමනාකරණ සහකාර සේවයේ පුරප්පාඩු 16 ක්, බීට්ටු වන නිලධාරී පුරප්පාඩු 182 ක්, වන ව්‍යාප්ති නිලධාරී පුරප්පාඩු 47 ක්, වන ක්ෂේත්‍ර සහකාර පුරප්පාඩු 208 ක්, රියදුරු පුරප්පාඩු 30 ක්, කාර්යාල කාර්ය සහායක පුරප්පාඩු 35ක් සහ කණිෂ්ඨ කාර්ය මණ්ඩල පුරප්පාඩු 37 ක් පිරවීම සඳහා අනුමැතිය ලබාගෙන තිබේ.

### 7.9. සේවයෙන් ඉල්ලා අස්වීම්

- එක් අඩවි වන නිලධාරියකු සහ එක් සංවර්ධන සහකාරවරයකු සේවයෙන් ඉල්ලා අස්වී තිබේ.
- සංවර්ධන සහකාරවරු දෙදෙනෙක්, එක් සංවර්ධන නිලධාරියෙක් සහ එක් රාජ්‍ය රාජ්‍ය කලමනාකරණ සහකාරවරයකු වෙනත් තනතුරු වලට නිදහස් කර තිබේ.

### 7.10. සේවය අතහැරයෑම් සහ නැවත සේවයේ පිහිටුවීම්

- බීට්ටු වන නිලධාරී - නිලධාරීන් දෙදෙනෙකු සේවය අත්හැර ගොස් තිබෙන අතර එක් නිලධාරියෙකු නැවත සේවයේ පිහිටුවා තිබේ.
- වන ව්‍යාප්ති නිලධාරීන් - එක් නිලධාරියකු සේවය අත්හැර ගොස් තිබෙන අතර එක් නිලධාරියෙකු නැවත සේවයේ පිහිටුවා තිබේ.
- වන ක්ෂේත්‍ර සහකාරවරු - දෙදෙනෙකු සේවය අත්හැරගොස් තිබෙන අතර එක් අයෙකු නැවත සේවයේ පිහිටුවා තිබේ.
- රියදුරන් - දෙදෙනෙක් සේවය අත්හැරගොස් තිබේ.
- කාර්යාල කාර්ය සහායකයින් - දෙදෙනෙක් සේවය අත්හැරගොස් තිබේ.

### 7.11. විවිධ

- 2014 වර්ෂය සඳහා වාර්ෂික ස්ථානමාරු මණ්ඩල සහ අභියාචනා මණ්ඩල නියමකරගත් කාලවකවානු තුල රැස්වන ලදී.
- නව බඳවා ගැනීමේ පටිපාටි යටතේ බීට්ටු වන නිලධාරීන්, වන ව්‍යාප්ති නිලධාරීන් සහ වන ක්ෂේත්‍ර සහකාරවරු එම නිලයේ අදාල පන්ති වලට ඇතුලත් කිරීම සඳහා අවශ්‍ය කරන තොරතුරු කලාප කාර්යාල වලින් ලබා ගැනිමට කටයුතු කරන ලදී.

## 08 වන පරිච්ඡේදය
## මුදල් අංශය

### 8.1. හැඳින්වීම

දෙපාර්තමේන්තුවට අදාල මූල්‍යමය කටයුතු සියල්ල සම්බන්ධීකරණය කරනු ලබන්නේ මුදල් අංශය මගිනි. මෙම අංශය මහා භාණ්ඩාගාරය, රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව සහ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වැනි ආයතන සමග සම්බන්ධීකරණ කටයුතුවල නිරත විය.

### 8.2. මුදල් අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම්

1. දෙපාර්තමේන්තුවේ වාර්ෂික ආදායම් සහ අයවැය වියදම් සැලසුම් කිරීම, මෙහෙයවීම සහ ගිණුම් තැබීම.
2. විවිධ ව්‍යාපෘති කාර්යාල වලින් සහ මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන අක් මුදල් පිළිබඳ මූල්‍යමය පාලනය.
3. මහා භාණ්ඩාගාරයට, පරිසර හා පුනර්ජනනිය බලශක්ති අමාත්‍යාංශයට සහ දෙපාර්තමේන්තුවේ ඉහළ කළමනාකරණයට , මූල්‍යමය තොරතුරු වර්ගීකරණය කර ඉදිරිපත් කිරීම.
4. විසර්ජන ගිණුම, ආදායම් ගිණුම , රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම් සහ දෙපාර්තමේන්තුව පාලනය කරනු ලබන, වන සංරක්ෂණ දෙපාර්තමේන්තු අරමුදලේ අවසන් ගිණුම ආදිය පිලිබඳ වාර්ෂික ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීම.

### 8.3. ආයතනික සැකැස්ම

මෙම අංශයේ ප්‍රධානියා ලෙස අධ්‍යක්ෂ (මුදල්) කටයුතු කරනලද අතර, ඔහුට නියෝජ්‍ය අධ්‍යක්ෂ වරියක් (මුදල්), සහාය විය.

### 8.4. අයවැය තොරතුරු

2013 වසරට දෙපාර්තමේන්තුවට සම්බන්ධ අයවැය විස්තර පහත පරිදි වේ.

දෙපාර්තමේන්තුවේ මූල්‍යමය ප්‍රගතිය පහත සඳහන් තොරතුරු මගින් විදහා දැක්වේ.

### 8.4.1 දෙපාර්තමේන්තු අයවැය ප්‍රගතිය

**වගුව - 8.1 දෙපාර්තමේන්තු අයවැය ප්‍රගතිය**

| වැය විෂය අංකය | විස්තරය | ප්‍රතිපාදන (රු:) 2013 | වියදම (රු:) 2013 | ඉතිරිය (රු:) |
|---|---|---|---|---|
| | පුනරාවර්තන වියදම් | 909,570,000.00 | 839,863,974.28 | 69,706,025.72 |
| | වැටුප් | 765,000,000.00 | 710,595,339.59 | 54,404.660.41 |
| | අනෙකුත් පුනරාවර්තන | 144,570,000.00 | 129,268,634.69 | 15,301,305.31 |
| | ප්‍රාග්ධන වියදම් | 453,900,000.00 | 452,174,424.44 | 1,725,575.56 |
| | ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩි දියුණු කිරීම් | 304,500,000.00 | 303.357,295.61 | 1,142,704.39 |

| වැය විෂය අංකය | විස්තරය | ප්‍රතිපාදන (රු:) 2013 | වියදම (රු:) 2013 | ඉතිරිය (රු:) |
|---|---|---|---|---|
| 2001 | ගොඩනැගිලි | 289,000,000.00 | 288,318,158.29 | 681,841.71 |
| 2002 | යන්ත්‍රෝපකරණ සහ උපකරණ | 2,500,000.00 | 2,123,151.40 | 376,848.60 |
| 2003 | වාහන | 13,000,000.00 | 12,915,985.92 | 84,014.08 |
| | ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම | 97,344,000.00 | 96,783,211.20 | 560,788.80 |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 5,000,000.00 | 4,843,923.80 | 156,076.20 |
| 2103 | යන්ත්‍රෝපකරණ | 2,500,000.00 | 2,480,160.93 | 19,839.07 |
| 2104 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 12,000,000.00 | 11,999,788.15 | 211.85 |
| 2105 | ඉඩම් හා ඉඩම් දියුණු කිරීම | 77,844,000.00 | 77,459,338.32 | 384,661.68 |
| | කුසලතා හැකියා වර්ධනය කිරීම | 1,656,000.00 | 1,645,955.46 | 10,044.54 |
| 2401 | පුහුණු වීම් හා හැකියාව දියුණු කිරීම | 1,656,000.00 | 1,645,955.46 | 10,044.54 |
| | අනෙකුත් ප්‍රාග්ධන වියදම් | 50,400,000.00 | 50,387,962.17 | 12,037.83 |
| 2502 | අනෙකුත් ආයෝජන | 50,400,000.00 | 50,387,962.17 | 12,037.83 |
| | **ව්‍යාපෘති 01 සම්පූර්ණ වියදම** | **1,363,470,000.00** | **1,292,038,398.72** | **71,431,601.28** |

**8.4.2 අත්තිකාරම් ගිණුම**

වගුව 8.2 මගින් රාජ්‍ය සේවකයන්ගේ අත්තිකාරම් ගිණුම හා සම්බන්ධ ගණුදෙනු වල සාරාංශයක් දක්වා තිබේ.

**වගුව 8.2 රාජ්‍ය සේවකයින්ගේ අත්තිකාරම් ගිණුම- 28301**

| සීමාව | ඇස්තමේන්තුව (රු:) | සත්‍ය වියදම (රු:) | වෙනස (රු:) |
|---|---|---|---|
| උපරිම වියදම් සීමාව | 75,000,000.00 | 59,440,212.24 | 15,559,787.76 |
| අවම ලැබීම් සීමාව | 45,000,000.00 | 63,341,898.57 | 18,341,898.57 |
| උපරිම හර ශේෂ සිමාව | 301,000.000.00 | 237,787,857.57 | 63,212,142.43 |

### 8.5 අදායම් රැස් කිරීම.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ආදායම්, ශීර්ෂ දෙකක් (02) යටතේ පහත පරිදි රැස් කරන ලදී.
1003:07:03 පුද්ගලික ඉඩම් වලින් දැව ප්‍රවාහනය කිරීම සඳහා බලපත්‍ර ගාස්තු
2002:01:02 රජයේ කැළෑ වලින් ලැබෙන ආදායම

**වගුව 8.3 2013 වසර තුල රැස්කල ආදායම**

| ආදායම් ශීර්ෂය | ඇස්තමේන්තුව (රු) | සත්‍ය ආදායම (රු) | වෙනස( රු) |
|---|---|---|---|
| 1003:07:03 | 65,000,000.00 | 56,743,835.73 | 8,256,164.27 |
| 2002:01:02 | 974,000,000.00 | 903,956,846.26 | 70,043,153.74 |
| එකතුව | 1,039,000,000.00 | 960,700,681.99 | 78,299,318.01 |

### 8.6 කැළෑ දෙපාර්තමේන්තු අරමුදල

වගුව 8.4 මගින් කැළෑ දෙපාර්තමේන්තු අරමුදල් ගිණුම හා සම්බන්ධ ගණුදෙනු වල සාරාංශයක් දක්වා තිබේ.
වගුව 8.4

| **විස්තර** | **රුපියල්** | **රුපියල්** |
|---|---|---|
| 2013.01.01 ඉදිරියට ගෙනා ශේෂය | - | 86,672,226.44 |
| **හර** | | |
| 1. උසාවියෙන් අයකර ගත් දඩ මුදල් | 23,197,795.81 | |
| 2. ආයෝජන වලින් ලද පොලිය | 423,533.30 | 23,621,329.11 |
| සම්පූර්ණ ලැබීම් | | 110,293,555.55 |
| **බැර** | | |
| 1. ත්‍යාග පිරි නැමීම | 5,620,336.39 | |
| 2. උසාවිවල පෙනී සිටීම සඳහා ගමන් වියදම් | 2,754,645.28 | |
| 3. ආරක්ෂණ වියදම් | 4,373,560.34 | |
| 4.පුහුණුවීම් සඳහා වියදම් | 1,045,091.60 | |
| 5. අනෙකුත් වියදම් | 354,379.20 | |
| 6. උසාවියෙන් අයකර ගත් දඩ මුදල් | 90,448.00 | |
| සම්පූර්ණ ගෙවීම් | | 14,238,460.81 |
| 2013.12.31 ඉදිරියට ගෙන ආ ශේෂය | | 96,055,094.74 |

# වන අපරාධ වල සාරාංශය (උසාවි නඩු) - 2013

| අංකය | දිසාව | වන අපරාධ සංඛ්‍යාව | වාර්තා කල අලාභයේ අගය (රු.) | වැරදිකරුවන් සංඛ්‍යාව | සිරගත කිරීම් කළ නඩු සංඛ්‍යාව | දඩ පමණක් ගැසූ සංඛ්‍යාව | | අවවාද කර නිදහස් කල නඩු සංඛ්‍යාව | අනවසර පදිංචි වීම් වූ රජයේ කැලෑ ප්‍රමාණය ( හෙක්.) | නඩු සංඛ්‍යාව | | | | | අල්ලාගත් දැව ප්‍රමාණය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | නඩු සංඛ්‍යාව | දඩ මුදල (රු) | | | අ | ආ | ඇ | ඈ | ඉ | පරිමාව කියු.මී | අගය (රු) |
| 1 | අම්පාර | 135 | 6,886,124.48 | 193 | 0 | 82 | 1,978,000.00 | 02 | 36.8600 | 60 | 25 | 19 | 09 | 22 | 94.2500 | 2,623,649.43 |
| 2 | අනුරාධපුර | 448 | 10,513,651.52 | 574 | 0 | 369 | 7,118,502.32 | 22 | 83.7300 | 285 | 65 | 17 | 29 | 52 | 156.8153 | 7,117,913.32 |
| 3 | බදුල්ල | 215 | 12,348,237.11 | 330 | 0 | 100 | 2,047,500.00 | 12 | 19.7100 | 59 | 35 | 28 | 44 | 49 | 310.2680 | 10,909,312.61 |
| 4 | මඩකලපුව | 77 | 1,681,518.50 | 76 | 09 | 67 | 602,000.00 | 0 | 18.5000 | 28 | 12 | 30 | 0 | 07 | *29.0380 | 1,376,093.50 |
| 5 | ගාල්ල | 105 | 963,610.04 | 148 | 06 | 72 | 1,553,212.11 | 0 | 1.4900 | 27 | 30 | 01 | 17 | 30 | 71.4840 | 674,448.08 |
| 6 | ගම්පහ | 35 | 2,680,291.64 | 25 | 0 | 19 | 399,235.96 | 0 | 0.0000 | 0 | 09 | 09 | 09 | 08 | 104.5000 | 2,658,037.68 |
| 7 | හම්බන්තොට | 98 | 2,628,775.57 | 128 | 0 | 77 | 977,500.00 | 0 | 24.0000 | 52 | 17 | 01 | 04 | 24 | 28.9170 | 861,297.66 |
| 8 | කළුතර | 101 | 1,035,595.28 | 119 | 0 | 72 | 1,358,579.98 | 01 | 2.2300 | 11 | 68 | 04 | 10 | 08 | 68.6000 | 2,283,052.28 |
| 9 | කිලිනොච්චි | 23 | 1,967,363.09 | 24 | 0 | 17 | 270,000.00 | 0 | 0.0000 | 0 | 02 | 05 | 08 | 08 | 37.6860 | 1,991,330.25 |
| 10 | මහනුවර | 53 | 1,077,610.99 | 74 | 04 | 31 | 782,246.83 | 0 | 0.9682 | 03 | 12 | 08 | 15 | 15 | 89.1150 | 1,106,804.10 |
| 11 | කෑගල්ල | 38 | 617,094.07 | 46 | 0 | 37 | 636,500.00 | 0 | 0.1000 | 01 | 12 | 06 | 15 | 04 | 44.3780 | 750,117.00 |
| 12 | කුරුණෑගල | 57 | 1,449,975.91 | 67 | 0 | 32 | 845,291.40 | 01 | 3.5500 | 12 | 21 | 04 | 16 | 04 | 63.7300 | 1,441,213.97 |
| 13 | මාතලේ | 96 | 1,678,046.02 | 94 | 0 | 53 | 891,500.00 | 0 | 7.1000 | 43 | 12 | 02 | 09 | 30 | 45.4680 | 5,305,414.47 |
| 14 | මාතර | 91 | 3,188,994.41 | 96 | 0 | 63 | 1,777,438.56 | 0 | 1.2800 | 27 | 46 | 04 | 10 | 04 | 16.8830 | 2,314,897.55 |
| 15 | මුලතිව් | 57 | 2,061,319.70 | 122 | 0 | 38 | 1,711,000.00 | 0 | 4.8000 | 07 | 33 | 04 | 0 | 13 | 42.3000 | 1,968,759.70 |

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 16 | මොණරාගල | **441** | **26,919,877.71** | **524** | **0** | **249** | **13,609,505.00** | **0** | **140.8500** | **215** | **75** | **19** | **20** | **112** | **460.8500** | **22,172,307.35** |
| 17 | මන්නාරම | **11** | **81,512.50** | **20** | **0** | **11** | **116,000.00** | **11** | 0.0000 | **0** | **04** | **02** | **0** | **05** | **2.4615** | **59,112.50** |
| 18 | නුවරඑළිය | **137** | **421,558.80** | **170** | **0** | **87** | **1,853,297.33** | **06** | **1.9050** | **18** | **42** | **02** | **02** | **73** | **29.2030** | **386,608.80** |
| 19 | පොළොන්නරුව | **66** | **2,079,991.13** | **74** | **0** | **41** | **866,983.46** | **0** | **2.4000** | **16** | **25** | **14** | **04** | **07** | **35.7910** | **1,938,288.80** |
| 20 | පුත්තලම | **145** | **1,752,070.06** | **147** | **0** | **90** | **1,403,360.00** | **0** | **5.5700** | **31** | **31** | **34** | **25** | **24** | **69.7100** | **1,293,742.06** |
| 21 | රත්නපුරය | **309** | **6,323,392.76** | **389** | **01** | **192** | **6,276,473.02** | **07** | **8.3150** | **64** | **106** | **20** | **29** | **90** | **225.2390** | **6,615,899.50** |
| 22 | ත්‍රිකුණාමලය | **65** | **1,928,529.17** | **81** | **0** | **36** | **1,218,500.00** | **01** | **10.0650** | **24** | **05** | **07** | **0** | **29** | **33.9400** | **1,662,914.18** |
| 23 | වවුනියාව | **59** | **4,992,822.18** | **114** | **0** | **18** | **1,085,000.00** | **0** | **0.0000** | **05** | **26** | 10 | **02** | 16 | **196.5958** | **4,115,272.17** |
| 24 | ප්‍රධාන කාර්යාලය හ.වැ. අංශය | **0** | **0** | **0** | **0** | **0** | **0** | **0** | **0.0000** | **0** | **0** | **0** | **0** | **0** | **0.0000** | **0.00** |
| 25 | කලාප කාර්යාලය - කොළඹ | **15** | **0** | **15** | **0** | **12** | **91,000.00** | **0** | **0.0000** | **0** | **0** | **0** | **15** | **0** | **5.5400** | **66,772.84** |
| 26 | රත්නපුර කලාප හදිසි වැටලීම් ඒකකය | **03** | **86,799.82** | **02** | **0** | **01** | **10,000.00** | **0** | **0.0000** | **0** | **02** | **0** | **0** | **01** | **39.3800** | **80,039.99** |
| | **එකතුව** | **2,880** | **95,364,762.46** | **3,652** | **20** | **1866** | **49,478,625.97** | **63** | **373.4232** | **988** | 715 | 250 | **292** | 635 | **2,302.1426** | **81,773,299.79** |

*= 2570 දඩ

අ - නීතී විරෝධි පදිංචි වීම් සහ එළිපෙහෙලි කිරීම.

ආ - නීතී විරෝධි හෙලීම්

ඇ - නීතී විරෝධි දැව ප්‍රවාහනය

ඈ - නීත්‍යානුකූල නොවන දැව ගබඩා

ඉ - අනෙකුත් නීතී විරෝධි ක්‍රියාකාරකම්

ඇමුණුම II

## වන සංරක්ෂණ ආඥා පනතේ 30 වන වගන්තිය යටතේ සිදු කල වන අපරාධ -2013

| අංකය | දිසාව | නඩු සංඛ්‍යාව | සම්පූර්ණ වටිනාකම (රු.) | රාජ සන්තක කල දැව | | | නිදහස් කරන ලද දැව | | | නොවිසිඳී ඇති නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | වන අපරාධ සංඛ්‍යාව | දැව පරිමාව කියු.මී | වටිනාකම රු. | වන අපරාධ සංඛ්‍යාව | දැව පරිමාව කියු.මී | වටිනාකම රු. | |
| 1 | අම්පාර | 07 | 383,126.72 | 03 | 8.4282 | 162,624.83 | 0 | 0.0000 | 0.00 | 04 |
| 2 | අනුරාධපුර | 13 | 1,045,172.33 | 03 | 2.2195 | 155,744.14 | 0 | 0.0000 | 0.00 | 10 |
| 3 | බදුල්ල | 19 | 2,156,649.44 | 05 | 54.9200 | 1,912,698.09 | 01 | 0.0295 | 243,951.35 | 13 |
| 4 | මඩකලපුව | 09 | 685,989.22 | 08 | 27.2871 | 685,989.22 | 0 | 0.0000 | 0.00 | 01 |
| 5 | ගාල්ල | 10 | 550,925.48 | 06 | 21.0580 | 210,440.36 | 02 | 18.3080 | 287,765.50 | 02 |
| 6 | ගම්පහ | 09 | 502,693.12 | 06 | 17.2250 | 251,583.04 | 03 | 8.0690 | 251,110.08 | 0 |
| 7 | හම්බන්තොට | 01 | 35,537.04 | 0 | 0.0000 | 0.00 | 0 | 0.0000 | 0.00 | 01 |
| 8 | කළුතර | 05 | 117,662.59 | 03 | 7.5290 | 86,485.78 | 0 | 0.0000 | 0.00 | 02 |
| 9 | කිලිනොච්චි | 01 | 215,435.65 | 0 | 0.0000 | 0.00 | 0 | 0.0000 | 0.00 | 01 |
| 10 | මහනුවර | 01 | 57,145.59 | 01 | 0.1088 | 7,752.61 | 01 | 0.3024 | 49,392.98 | 0 |
| 11 | කෑගල්ල | 05 | 289,062.07 | 03 | 10.5780 | 239,310.20 | 01 | 1.5720 | 16,045.64 | 01 |
| 12 | කුරුණෑගල | 07 | 500,383.44 | 04 | 6.1420 | 232,236.39 | 02 | 6.2690 | 227,685.61 | 01 |
| 13 | මාතලේ | 02 | 880,791.81 | 0 | 0.0000 | 0.00 | 0 | 0.0000 | 0.00 | 02 |
| 14 | මාතර | 01 | 127,541.72 | 0 | 0.0000 | 0.00 | 0 | 0.0000 | 0.00 | 01 |
| 15 | මුලතිව් | 06 | 876,986.93 | 0 | 0.0000 | 0.00 | 0 | 0.0000 | 0.00 | 06 |
| 16 | මොණරාගල | 12 | 1,490,866.85 | 06 | 8.2000 | 390,674.18 | 01 | 3.2000 | 722,987.23 | 05 |
| 17 | මන්නාරම | 05 | 233,172.09 | 05 | 4.3240 | 233,172.09 | 0 | 0.0000 | 0.00 | 0 |
| 18 | නුවරඑළිය | 03 | 49,045.00 | 01 | 0.2000 | 3,700.00 | 0 | 0.0000 | 0.00 | 02 |
| 19 | පොළොන්නරුව | 08 | 136,229.58 | 06 | 1.4074 | 124,954.18 | 0 | 0.0000 | 0.00 | 02 |
| 20 | පුත්තලම | 05 | 175,291.29 | 05 | 3.4645 | 175,291.29 | 0 | 0.0000 | 0.00 | 0 |
| 21 | රත්නපුරය | 05 | 204,000.00 | 01 | 6.3734 | 188,931.14 | 0 | 0.0000 | 0.00 | 04 |
| 22 | ත්‍රිකුණාමලය | 02 | 22,604.00 | 02 | 0.9930 | 22,604.00 | 0 | 0.0000 | 0.00 | 0 |
| 23 | වවුනියාව | 06 | 908,454.27 | 06 | 6.5510 | 908,054.27 | 0 | 0.0000 | 0.00 | 0 |
| 24 | ප්‍රධාන කාර්යාලය හ.වැ. අංශය | 0 | 0.00 | 0 | 0.0000 | 0.00 | 0 | 0.0000 | 0.00 | 0 |
| 25 | කලාප කාර්යාලය - කොළඹ | 01 | 27,738.81 | 0 | 0.0000 | 0.00 | 0 | 0.0000 | 0.00 | 01 |
| 26 | රත්නපුර කලාප හදිසි වැටලීම් ඒකකය | 0 | 0.00 | 0 | 0.0000 | 0.00 | 0 | 0.0000 | 0.00 | 0 |
| | **එකතුව** | 143 | 11,672,505.04 | 74 | 187.0089 | 5,992,245.81 | 11 | 37.7499 | 1,798,938.39 | 59 |

ඇමුණුමIII

## 2013 වසර තුලදී රාජසන්තක කල වාහන

| අංකය | දිසාව | වන අපරාධ වාර්තා අංකය | නඩු අංකය | දැව වල වටිනාකම (රු) | වාහන වල ස්වභාවය | | වාහනයේ වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | පන්තිය | අංකය | |
| 1 | අම්පාර | 01/2012 | 51089 | 4,200.00 | ලොරි | EP PS 3393 | 600,000.00 |
| | | 20/2009 | 34081 | 55,000.00 | ලොරි | EP GE 2249 | 1,000,000.00 |
| | | 09/2012 | 51194 | 51,289.39 | අත් ට්‍රැක්ටර් | EP JX 2205 | 15,000.00 |
| | | 12/2012 | 51260 | 0.00 | ට්‍රැක්ටර් | EP JY 2430 | 1,000,000.00 |
| | | 12/2011 | 715 | 2,603.54 | අත් ට්‍රැක්ටර් | EP RA 5021 | 400,000.00 |
| | | 02/2011 | 332 | 7,967.96 | අත් ට්‍රැක්ටර් | අංක රහිත | 400,000.00 |
| 2 | අනුරාධපුර | 112/2011 | 26015 | 12,705.08 | අත් ට්‍රැක්ටර් | ලියාපදිංචි නොකල | 300,000.00 |
| | | 50/2012 | 32939 | 3,341.10 | අත් ට්‍රැක්ටර් | ලියාපදිංචි නොකල | 300,000,00 |
| | | 104/2012 | 34409 | 88,236.98 | ලොරි | NC LG 1679 | 2,500,000.00 |
| | | 46/2013 | 40984 | 4,539.81 | අත් ට්‍රැක්ටර් | ලියාපදිංචි නොකල | 300,000.00 |
| | | 02/2013 | 13847 | 2,788.00 | අත් ට්‍රැක්ටර් | ලියාපදිංචි නොකල | 45,000.00 |
| | | 11/2013 | 14706 | 4,476.00 | අත් ට්‍රැක්ටර් | ලියාපදිංචි නොකල | 60,000.00 |
| | | 14/2013 | 15706 | 20,194.27 | අත් ට්‍රැක්ටර් | ලියාපදිංචි නොකල | 75,000.00 |
| | | 20/2013 | 16835 | 1,770.47 | අත් ට්‍රැක්ටර් | ලියාපදිංචි නොකල | 65,000.00 |
| | | 41/2013 | 18152 | 920.00 | අත් ට්‍රැක්ටර් | ලියාපදිංචි නොකල | 50,000.00 |
| | | 42/2013 | 18385 | 29,605.00 | අත් ට්‍රැක්ටර් | ලියාපදිංචි නොකල | 55,000.00 |
| | | 55/2013 | 18638 | 2,497.00 | අත් ට්‍රැක්ටර් | ලියාපදිංචි නොකල | 67,000.00 |
| 3 | බදුල්ල | 2/2013 | 89506 | 0.00 | ට්‍රැක්ටර් | CP RC 9364 | 1,500,000.00 |
| | | 11/2013 | 90063 | 50,042.74 | අත් ට්‍රැක්ටර් | අංක රහිත | 350,000.00 |
| | | 41/2013 | 91302 | 56,805.32 | අත් ට්‍රැක්ටර් | අංක රහිත | 350,000.00 |
| | | 71/2013 | 93227 | 43,556.00 | අත් ට්‍රැක්ටර් | අංක රහිත | 350,000.00 |
| 4 | මඩකලපුව | 32/2011 | 2897/F/12 | 700.00 | ට්‍රැක්ටර් | 88243768 | 4,500.00 |
| | | 11/2012 | F/5260 | 3,000.00 | පාපැදි | 55975973 | 6,000.00 |
| | | 30/2012 | F/5993 | 3,750.00 | පාපැදි | GCC 99668 | 6,000.00 |
| | | 04/2013 | 20480/F/2013 | 22,156.20 | ගොන් කරත්තය | - | 4,000.00 |
| | | 07/2013 | 21086/F/2013 | 350.00 | පාපැදි | අංක රහිත | 2,500.00 |
| | | 08/2013 | 21087/F/2013 | 350.00 | පාපැදි | අංක රහිත | 2,500.00 |
| | | 09/2013 | 21088/F/2013 | 350.00 | පාපැදි | අංක රහිත | 2,500.00 |
| | | 10/2013 | 21089/F/2013 | 350.00 | පාපැදි | අංක රහිත | 2,500.00 |
| | | 14/2013 | 22028/F/2013 | 900.00 | පාපැදි | අංක රහිත | 2,500.00 |
| | | 31/2013 | AR/330/F/2013 | 3,944.16 | ගොන් කරත්තය | - | 4,000.00 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 5 | ගාල්ල | **12/2012** | **74676** | **330.12** | අත් ට්‍රැක්ටර් | අංක රහිත | **200,000.00** |
| | | **26/2013** | **62996** | **697.60** | අත් ට්‍රැක්ටර් | අංක රහිත | **175,000.00** |
| | | **16/2011** | **74741** | **25857.94** | ලොරි | **227-3369** | **1,000,000.00** |
| | | **04/2013** | **68894** | **1,097.07** | අත් ට්‍රැක්ටර් | අංක රහිත | **150,000.00** |
| 6 | ගම්පහ | **0** | | | | | |
| 7 | හම්බන්තොට | **0** | | | | | |
| 8 | කළුතර | **0** | | | | | |
| 9 | කිලිනොච්චි | **0** | | | | | |
| 10 | මහනුවර | **16/2013** | **64321** | **13,080.00** | ලොරි | **68-9965** | **800,000.00** |
| | | **56/2009** | **69684** | **20,272.78** | ලොරි | **CP HR 5432** | **1,800,000.00** |
| | | **07/2013** | **89839** | **9,949.06** | අත් ට්‍රැක්ටර් | අංක රහිත | **150,000.00** |
| | | **11/2013** | **B 90242** | **33,381.53** | අත් ට්‍රැක්ටර් | අංක රහිත | **150,000.00** |
| 11 | කෑගල්ල | **09/2013** | **48639** | **2,279.25** | අත් ට්‍රැක්ටර් | අංක රහිත | **75,000.00** |
| | | **03/2013** | **19665** | **7,663.80** | අත් ට්‍රැක්ටර් | අංක රහිත | **200,000.00** |
| 12 | කුරුණෑගල | **17/2012** | **11170** | **150,941.76** | ලොරි | **28-5905** | **400,000.00** |
| 13 | මාතලේ | **0** | | | | | |
| 14 | මාතර | **11/2013** | **88547** | **1,960.00** | ට්‍රැක්ටර් | **SP UF 4525** | **200,000.00** |
| 15 | මුලතිව් | **0** | | | | | |
| 16 | මොණරාගල | **11/2013** | **60671** | **10,654.67** | අත් ට්‍රැක්ටර් | අංක රහිත | **75,000.00** |
| | | **12/2013** | **60789** | **19,004.00** | ට්‍රේලරය සහිත අත් ට්‍රැක්ටර් | අංක රහිත | **105,000.00** |
| | | **26/2013** | **61762** | **3,521.76** | අත් ට්‍රැක්ටර් | අංක රහිත | **75,000.00** |
| | | **69/2013** | **64031** | **2,167.70** | ට්‍රේලරය සහිත අත් ට්‍රැක්ටර් | අංක රහිත | **105,000.00** |
| | | **17/2012** | **72494** | **85,701.40** | අත් ට්‍රැක්ටර් | අංක රහිත | **150,000.00** |
| 17 | මන්නාරම | **0** | | | | | |
| 18 | නුවරඑළිය | **24/2012** | **25638** | **7,209.61** | ලොරි | **40 Sri 8620** | **100,000.00** |
| 19 | පොළොන්නරුව | **04/2003** | **80770** | **32,166.72** | අත් ට්‍රැක්ටර් | **75-7191** | **200,000.00** |
| | | **06/2011** | **83607** | **930.93** | අත් ට්‍රැක්ටර් | අංක රහිත | **200,000.00** |
| | | **11/2011** | **85906** | **2,480.84** | අත් ට්‍රැක්ටර් | අංක රහිත | **200,000.00** |
| | | **12/2012** | **91766** | **1,668.04** | අත් ට්‍රැක්ටර් | අංක රහිත | **200,000.00** |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 20 | පුත්තලම | 110/2010 | 49535 | 22,307.58 | අත් ට්‍රැක්ටර් | අංක රහිත | 40,000.00 |
| | | 48/2012 | 71179 | 6,000.00 | ලොරි | 226-4220 | 1,650,000.00 |
| | | 45/2012 | 70397 | 6,000.00 | ලොරි | 226-9439 | 1,700.000.00 |
| | | *06/2012 | 60536 | 2,000.00 | ලොරි | NW HI 8161 | 120,000.00 |
| | | 42/2011 | 63243 | 169,167.11 | අත් ට්‍රැක්ටර් | අංක රහිත | 35,000.00 |
| | | 52/2012 | 73471 | 1,800.00 | අත් ට්‍රැක්ටර් | අංක රහිත | 40,000.00 |
| | | 43/2013 | 79623 | 2,400.00 | ලොරි | NW PU 2459 | 500,000.00 |
| | | 44/2013 | 79624 | 3,200.00 | අත් ට්‍රැක්ටර් | NW SL 8257 | 80,000.00 |
| | | 29/2013 | 78779 | 3,200.00 | අත් ට්‍රැක්ටර් | NW SK 7655 | 85,000.00 |
| | | 61/2013 | 81781 | 2,400.00 | ලොරි | NW PR 0410 | 500,000.00 |
| | | 21/2013 | 68467 | 68,467.00 | අත් ට්‍රැක්ටර් | අංක රහිත | 150,000.00 |
| | | 16/2013 | 68110 | 68,110.00 | අත් ට්‍රැක්ටර් | අංක රහිත | 50,000.00 |
| 21 | රත්නපුර | 19/2011 | 36708 | 11,175.12 | ට්‍රැක්ටර් | 7845 | 400,000.00 |
| | | 11/2012 | 39682 | 7,700.00 | ලොරි | 47-1853 | 800,000.00 |
| | | 30/2012 | 40643 | 73,737.93 | ලොරි | LB 3270 | 4,000,000.00 |
| | | 37/2012 | 40991 | 9,600.00 | එක්ස්කැවේටර් | ACERA SK 70 | 1,200,000.00 |
| | | 07/2011 | 50671 | 271,100.00 | ලොරි | 227-1261 | 200,000.00 |
| | | 18/2010 | 38/597 | 1,100.00 | අත් ට්‍රැක්ටර් | E. No: 97 X 81412 | 25,000.00 |
| | | 43/2013 | 92533 | 3,733.00 | අත් ට්‍රැක්ටර් | E. No: 000923 | 45,000.00 |
| | | 07/2013 | 83768 | 16,330.00 | අත් ට්‍රැක්ටර් | අංක රහිත | 30,000.00 |
| | | 36/2011 | 58034 | 9,917.00 | අත් ට්‍රැක්ටර් | E. No: 13609 | 40,000.00 |
| | | 50/2013 | 95331 | 5,458.00 | අත් ට්‍රැක්ටර් | E. No: 60953 | 55,000.00 |
| | | 37/2013 | 47695 | 6,477.13 | අත් ට්‍රැක්ටර් | අංක රහිත | 500,000.00 |
| | | 14/2013 | 13116 | 75,148.92 | ලොරි | 27-4843 | 3,000,000.00 |
| | | 47/2013 | 29104 | 32,000.00 | යතුරු පැදි | SG WR 1341 | 150,000.00 |
| 22 | ත්‍රිකුණාමලය | 0 | | | | | |
| 23 | වවුනියාව | 0 | | | | | |
| 24 | ප්‍රධාන කාර්යාලය හ.වැ. අංශය | 0 | | | | | |
| 25 | රත්නපුර කලාප හදිසි වැටලීම් ඒකකය | 0 | | | | | |
| | **එකතුව** | | | 1,789,934.39 | | | 31,924,000.00 |

* වැලි– Rs. 2000.00

# 2013 වසර තුල ලියාපදිංචි වූ දැව පදනම් කරගත් නව ව්‍යාපාර

| අංකය | දිසාව | ගෘහ භාණ්ඩ වෙළඳසැල් | වඩුමඩු | | දැව ගබඩා | | දැව ඉරුම්හල් | | | දර විකුණුම් හල් |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | යාන්ත්‍රික නොවන | යාන්ත්‍රික | 300< | 300> | රවුම් කියත් | රවුම් සහ පටි කියත් | අතින් ඉරන | |
| 1 | අම්පාර | 261 | 33 | 223 | 148 | 70 | 71 | 0 | 0 | 65 |
| 2 | අනුරාධපුර | 650 | 206 | 428 | 14 | 165 | 44 | 16 | 04 | 31 |
| 3 | බදුල්ල | 17 | 01 | 11 | 04 | 02 | 02 | 01 | 0 | 09 |
| 4 | මඩකලපුව | 27 | 08 | 14 | 24 | 0 | 03 | 0 | 0 | 01 |
| 5 | ගාල්ල | 23 | 11 | 19 | 09 | 28 | 26 | 03 | 04 | 05 |
| 6 | ගම්පහ | 35 | 35 | 45 | 56 | 04 | 01 | 09 | 03 | 06 |
| 7 | හම්බන්තොට | 27 | 01 | 28 | 14 | 07 | 20 | 0 | 0 | 07 |
| 8 | කළුතර | 07 | 01 | 20 | 13 | 23 | 12 | 06 | 0 | 02 |
| 9 | කිලිනොච්චි | 12 | 01 | 10 | 0 | 08 | 02 | 03 | 03 | 03 |
| 10 | මහනුවර | 32 | 0 | 40 | 05 | 19 | 07 | 08 | 01 | 05 |
| 11 | කෑගල්ල | 18 | 0 | 20 | 07 | 17 | 16 | 04 | 0 | 06 |
| 12 | කුරුණෑගල | 39 | 0 | 40 | 08 | 11 | 22 | 09 | 0 | 06 |
| 13 | මාතලේ | 11 | 0 | 08 | 03 | 0 | 01 | 03 | 0 | 0 |
| 14 | මාතර | 23 | 02 | 17 | 03 | 16 | 17 | 01 | 0 | 07 |
| 15 | මුලතිව් | 03 | 0 | 03 | 0 | 02 | 0 | 0 | 01 | 03 |
| 16 | මොණරාගල | 13 | 02 | 30 | 04 | 0 | 13 | 01 | 0 | 0 |
| 17 | මන්නාරම | 06 | 0 | 03 | 02 | 0 | 02 | 0 | 0 | 02 |
| 18 | නුවරඑළිය | 08 | 02 | 08 | 05 | 02 | 01 | 0 | 0 | 0 |
| 19 | පොළොන්නරුව | 20 | 02 | 21 | 01 | 0 | 01 | 01 | 0 | 01 |
| 20 | පුත්තලම | 37 | 02 | 31 | 20 | 03 | 08 | 02 | 0 | 05 |
| 21 | රත්නපුරය | 19 | 01 | 20 | 05 | 06 | 04 | 03 | 0 | 05 |
| 22 | ත්‍රිකුණාමලය | 20 | 0 | 15 | 0 | 08 | 0 | 01 | 01 | 04 |
| 23 | වවුනියාව | 37 | 05 | 38 | 14 | 27 | 05 | 06 | 03 | 39 |
| 24 | ප්‍රධාන කාර්යාලය හ.වැ. අංශය | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 25 | කලාප කාර්යාලය - කොළඹ | 30 | 01 | 15 | 07 | 48 | 15 | 09 | 0 | 0 |
| 26 | රත්නපුර කලාප හදිසි වැටලීම් ඒකකය | **0** | **0** | **0** | **0** | **0** | **0** | **0** | **0** | **0** |
| | **එකතුව** | **1,375** | **314** | **1,107** | **366** | **466** | **293** | **86** | **20** | **212** |

ඇමුණුම V

# ක්‍රියාකාරීත්වයේ පවතින ලියාපදිංචි මුළු දැව ව්‍යාපාර සංඛ්‍යාව - 2013

| අංකය | දිසාව | දැව ඉරුම්හල් | දැව ගබඩා | යාන්ත්‍රික වඩු මඩු | යාන්ත්‍රික නොවන වඩු මඩු | ගෘහ භාණ්ඩ වෙළඳසැල් | දර විකුණුම්හල් |
|---|---|---|---|---|---|---|---|
| 1 | අම්පාර | 325 | 281 | 308 | 131 | 386 | 76 |
| 2 | අනුරාධපුර | 21 | 28 | 60 | 10 | 74 | 13 |
| 3 | බදුල්ල | 34 | 70 | 220 | 39 | 239 | 49 |
| 4 | මඩකලපුව | 68 | 218 | 109 | 78 | 217 | 54 |
| 5 | ගාල්ල | 249 | 303 | 246 | 101 | 223 | 35 |
| 6 | ගම්පහ | 337 | 671 | 600 | 57 | 294 | 40 |
| 7 | හම්බන්තොට | 258 | 245 | 526 | 108 | 437 | 83 |
| 8 | කළුතර | 231 | 301 | 290 | 12 | 112 | 14 |
| 9 | කිලිනොච්චි | 12 | 13 | 12 | 0 | 14 | 06 |
| 10 | මහනුවර | 323 | 481 | 439 | 122 | 341 | 111 |
| 11 | කෑගල්ල | 257 | 210 | 310 | 11 | 185 | 24 |
| 12 | කුරුණෑගල | 647 | 366 | 756 | 93 | 550 | 63 |
| 13 | මාතලේ | 56 | 85 | 164 | 35 | 146 | 03 |
| 14 | මාතර | 304 | 300 | 238 | 60 | 286 | 64 |
| 15 | මුලතිව් | 03 | 05 | 06 | 04 | 09 | 05 |
| 16 | මොණරාගල | 75 | 27 | 297 | 62 | 60 | 0 |
| 17 | මන්නාරම | 07 | 32 | 21 | 04 | 38 | 11 |
| 18 | නුවරඑළිය | 11 | 24 | 32 | 07 | 16 | 05 |
| 19 | පොළොන්නරුව | 21 | 47 | 175 | 25 | 167 | 05 |
| 20 | පුත්තලම | 157 | 267 | 372 | 57 | 345 | 316 |
| 21 | රත්නපුරය | 112 | 133 | 311 | 44 | 204 | 15 |
| 22 | ත්‍රිකුණාමලය | 89 | 124 | 165 | 18 | 170 | 21 |
| 23 | වවුනියාව | 86 | 230 | 207 | 31 | 170 | 158 |
| 24 | ප්‍රධාන කාර්යාලය හ.වැ. අංශය | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 25 | කලාප කාර්යාලය - කොළඹ | 117 | 481 | 473 | 34 | 232 | 07 |
| 26 | රත්නපුර කලාප හදිසි වැටලීම් ඒකකය | 0 | **0** | **0** | **0** | **0** | **0** |
| | **එකතුව** | **3,800** | **4,942** | **6,337** | **1,143** | **4,915** | **1,178** |

ඇමුණුම VI

## පුහුණු වැඩසටහන්– 2013

| අංකය | දිසාව | පොලිස් නිලධාරීන් | | ප්‍රාදේශීය ලේකම්වරු | | වන නිලධාරීන් | | ගිනි අවි | | වෙනත් | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වැඩසටහන් සංඛ්‍යාව | නිලධාරීන් සංඛ්‍යාව | වැඩසටහන් සංඛ්‍යාව | නිලධාරීන් සංඛ්‍යාව | වැඩසටහන් සංඛ්‍යාව | නිලධාරීන් සංඛ්‍යාව | වැඩසටහන් සංඛ්‍යාව | නිලධාරීන් සංඛ්‍යාව | වැඩසටහන් සංඛ්‍යාව | නිලධාරීන් සංඛ්‍යාව |
| 1 | අම්පාර | 0 | 0 | 0 | 0 | 03 | 84 | 02 | 58 | 12 | 87 |
| 2 | අනුරාධපුර | 0 | 0 | 03 | 03 | 01 | 01 | 0 | 0 | 09 | 87 |
| 3 | බදුල්ල | 0 | 0 | 04 | 274 | 0 | 0 | 02 | 114 | 43 | 2,086 |
| 4 | මඩකලපුව | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 5 | ගාල්ල | 05 | 225 | 01 | 45 | 0 | 0 | 02 | 16 | 0 | 0 |
| 6 | ගම්පහ | 02 | 100 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 02 | 125 |
| 7 | හම්බන්තොට | 0 | 0 | 0 | 0 | 0 | 0 | 01 | 14 | 0 | 0 |
| 8 | කළුතර | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 9 | කිලිනොච්චි | 0 | 0 | 0 | 0 | 01 | 29 | 01 | 02 | 01 | 30 |
| 10 | මහනුවර | 0 | 0 | 0 | 0 | 16 | 51 | 0 | 0 | 0 | 0 |
| 11 | කෑගල්ල | 0 | 0 | 05 | 291 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 12 | කුරුණෑගල | 05 | 120 | 02 | 120 | 02 | 40 | 01 | 03 | 06 | 200 |
| 13 | මාතලේ | 0 | 0 | 0 | 0 | 01 | 18 | 0 | 0 | 0 | 0 |
| 14 | මාතර | 0 | 0 | 05 | 420 | 02 | 20 | 02 | 08 | 0 | 0 |
| 15 | මුලතිව් | 0 | 0 | 0 | 0 | 06 | 06 | 0 | 0 | 0 | 0 |
| 16 | මන්නාරම | 0 | 0 | 02 | 35 | 01 | 25 | 0 | 0 | 01 | 25 |
| 17 | මොණරාගල | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 18 | නුවරඑළිය | 0 | 0 | 01 | 96 | 02 | 110 | 01 | 10 | 24 | 1,728 |
| 19 | පොළොන්නරුව | 0 | 0 | 0 | 0 | 05 | 52 | 01 | 10 | 60 | 1,557 |
| 20 | පුත්තලම | 02 | 55 | 05 | 185 | 05 | 65 | 0 | 0 | 16 | 575 |
| 21 | රත්නපුරය | 01 | 35 | 07 | 249 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 22 | ත්‍රිකුණාමලය | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 23 | වවුනියාව | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 24 | ප්‍රධාන කාර්යාලය හ.වැ. අංශය | 0 | 0 | 0 | 0 | 0 | 0 | 05 | 224 | 0 | 0 |
| 25 | කලාප කාර්යාලය - කොළඹ | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 26 | රත්නපුර කලාප හදිසි වැටලීම් ඒකකය | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| | **එකතුව** | 15 | 535 | 35 | 1,718 | 45 | 501 | 18 | 459 | 174 | 6500 |

ඇමුණුම VII

## ත්‍යාග ගෙවීම් - 2013

| අංකය | දිසාව | ප්‍රමාණය ( රුපියල් ) | නිලධාරීන් සංඛ්‍යාව | තොරතුරු සැපයූ පුද්ගලයින් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | අම්පාර | 0 | 0 | 0 |
| 2 | අනුරාධපුර | 198,699.00 | 54 | 0 |
| 3 | බදුල්ල | 273,000.00 | 53 | 0 |
| 4 | මඩකලපුව | 0 | 0 | 0 |
| 5 | ගාල්ල | 136,195.00 | 87 | 1 |
| 6 | ගම්පහ | 131,115.00 | 16 | 0 |
| 7 | හම්බන්තොට | 65,514.30 | 30 | 0 |
| 8 | කළුතර | 153,981.00 | 129 | 0 |
| 9 | කිලිනොච්චි | 0 | 0 | 0 |
| 10 | මහනුවර | 11,400.00 | 11 | 0 |
| 11 | කෑගල්ල | 37,923.00 | 18 | 0 |
| 12 | කුරුණෑගල | 0 | 0 | 0 |
| 13 | මාතලේ | 97,250.00 | 31 | 0 |
| 14 | මාතර | 148,425.00 | 44 | 0 |
| 15 | මුලතිව් | 0 | 0 | 0 |
| 16 | මොණරාගල | 811,254.00 | 362 | 4 |
| 17 | මන්නාරම | 0 | 0 | 0 |
| 18 | නුවරඑළිය | 498,779.00 | 124 | 0 |
| 19 | පොළොන්නරුව | 737,732.40 | 55 | 10 |
| 20 | පුත්තලම | 59,725.00 | 22 | 0 |
| 21 | රත්නපුරය | 882,983.00 | 114 | 1 |
| 22 | ත්‍රිකුණාමලය | 129,500.00 | 58 | 0 |
| 23 | වවුනියාව | 13,300.00 | 12 | 0 |
| 24 | ප්‍රධාන කාර්යාලය හ.වැ. අංශය | 0 | 0 | 0 |
| 25 | කලාප කාර්යාලය - කොළඹ | 0 | 0 | 0 |
| 26 | රත්නපුර කලාප හදිසි වැටලීම් ඒකකය | 23,000.00 | 9 | 0 |
| | **එකතුව** | 4,409,775.70 | 1,229 | 16 |

ඇමුණුම VIII

## බීජ පැල, බීජ, ශාක සහ ශාක කොටස් අපනයනය මගින් ලද ආදායම - 2013 එක් දින සේවය

| මාසය | නිකුත්කල බලපත්‍ර සංඛ්‍යාව | ආදායම (රු) | 12% අගය එකතු කිරීමේ බද්ද (රු) | 10% මුද්දර ගාස්තු (රු) | එකතුව (රු) |
|---|---|---|---|---|---|
| ජනවාරි | 68 | 78,200.00 | 9,384.00 | 7,820.00 | 95,404.00 |
| පෙබරවාරි | 34 | 39,100.00 | 4,692.00 | 3,910.00 | 47,702.00 |
| මාර්තු | 52 | 59,800.00 | 7,176.00 | 5,980.00 | 72,956.00 |
| අප්‍රේල් | 40 | 46,000.00 | 5,520.00 | 4,600.00 | 56,120.00 |
| මැයි | 47 | 54,050.00 | 6,486.00 | 5,405.00 | 65,941.00 |
| ජුනි | 40 | 46,000.00 | 5,520.00 | 4,600.00 | 56,120.00 |
| ජුලි | 23 | 26,450.00 | 3,174.00 | 2,645.00 | 32,269.00 |
| අගෝස්තු | 54 | 62,100.00 | 7,452.00 | 5,715.00 | 75,267.00 |
| සැප්තැම්බර් | 68 | 79,350.00 | 9,522,00 | 7,325.00 | 96,197.00 |
| ඔක්තෝබර් | 85 | 98,900.00 | 11,868.00 | 9,165,00 | 119,933.00 |
| නොවැම්බර් | 61 | 70,150.00 | 8,418.00 | 5,945.00 | 84,513.00 |
| දෙසැම්බර් | 46 | 52,900.00 | 6,348.00 | 5,290.00 | 64,538.00 |
| **එකතුව** | **618** | **713,000.00** | **85,560.00** | **68,400.00** | **866,960.00** |

## බීජ පැල, බීජ, ශාක සහ ශාක කොටස් අපනයනය මගින් ලද ආදායම - 2013 සාමාන්‍ය සේවාව

| මාසය | නිකුත් කල බලපත්‍ර සංඛ්‍යාව | ආදායම (රු) | 12% අගය එකතු කිරීමේ බද්ද (රු) | 10% මුද්දර ගාස්තු (රු) | එකතුව (රු) |
|---|---|---|---|---|---|
| ජනවාරි | 96 | 55,200.00 | 6,624.00 | 3,817.50 | 65,641.50 |
| පෙබරවාරි | 94 | 54,050.00 | 6,486.00 | 3,702.50 | 64,238.50 |
| මාර්තු | 108 | 62,100.00 | 7,452.00 | 4,507.50 | 74,059.50 |
| අප්‍රේල් | 107 | 61,525.00 | 7,383.00 | 4,450.00 | 73,358.00 |
| මැයි | 92 | 52,900.00 | 6,348.00 | 3,587.50 | 62,835.50 |
| ජුනි | 98 | 56,350.00 | 6,762.00 | 4,105.00 | 67,217.00 |
| ජුලි | 116 | 66,700.00 | 8,004.00 | 4,795.00 | 79,499.00 |
| අගෝස්තු | 79 | 45,425.00 | 5,451.00 | 2,610.00 | 53,486.00 |
| සැප්තැම්බර් | 71 | 40,825.00 | 4,899.00 | 3,012.50 | 48,736.50 |
| ඔක්තෝබර් | 84 | 48,300.00 | 5,796.00 | 3,645.00 | 57,741.00 |
| නොවැම්බර් | 73 | 41,975.00 | 5,037.00 | 3,070.00 | 50,082.00 |
| දෙසැම්බර් | 91 | 52,325.00 | 6,279.00 | 4,300.00 | 62,904.00 |
| **එකතුව** | **1,109** | **637,675.00** | **76,521.00** | **45,602.50** | **759,798.50** |

ඇමුණුම X

## ඉරූ දැව, ගෘහ භාණ්ඩ, අත්කම්, සෙල්ලම් බඩු සහ අගය එකතු කල දැව අපනයනය මගින් ලද ආදායම - 2013 එක් දින සේවය

| මාසය | නිකුත්කල බලපත්‍ර සංඛ්‍යාව | ආදායම (රු) | 12% අගය එකතු කිරීමේ බද්ද (රු) | 10% මුද්දර ගාස්තු (රු) | එකතුව (රු) |
|---|---|---|---|---|---|
| ජනවාරි | 111 | 151,800.00 | 18,216.00 | 12,350.00 | 182,366.00 |
| පෙබරවාරි | 132 | 170,200.00 | 20,424.00 | 14,535.00 | 205,159.00 |
| මාර්තු | 123 | 147,200.00 | 17,664.00 | 14,720.00 | 179,584.00 |
| අප්‍රේල් | 128 | 161,000.00 | 19,320.00 | 16,100.00 | 196,420.00 |
| මැයි | 124 | 157,550.00 | 18,906.00 | 15,755.00 | 192,211.00 |
| ජූනි | 113 | 149,500.00 | 17,940.00 | 14,950.00 | 182,390.00 |
| ජූලි | 142 | 175,950.00 | 21,114.00 | 17,595.00 | 214,659.00 |
| අගෝස්තු | 134 | 179,400.00 | 21,528.00 | 17,905.00 | 218,833.00 |
| සැප්තැම්බර් | 120 | 149,500.00 | 17,940.00 | 14,950.00 | 182,390.00 |
| ඔක්තෝබර් | 113 | 140,300.00 | 16,836.00 | 14,030.00 | 171,166.00 |
| නොවැම්බර් | 132 | 159,850.00 | 19,182.00 | 15,835.00 | 194,867.00 |
| දෙසැම්බර් | 126 | 144,900.00 | 17,388.00 | 14,225.00 | 176,513.00 |
| **එකතුව** | **1,498** | **1,887,150.00** | **226,458.00** | **182,950.00** | **2,296,558.00** |

**ඉරූ දැව, ගෘහ භාණ්ඩ, අත්කම්, සෙල්ලම් බඩු සහ අගය එකතු කල දැව අපනයනය මගින් ලද ආදායම - 2013 සාමාන්‍ය සේවාව**

| මාසය | නිකුත්කල බලපත්‍ර සංඛ්‍යාව | ආදායම (රු) | 12% අගය එකතු කිරීමේ බද්ද (රු) | 10% මුද්දර ගාස්තු (රු) | එකතුව (රු) |
|---|---:|---:|---:|---:|---:|
| ජනවාරි | 97 | 59,225.00 | 7,107.00 | 5,922.50 | 72,254.50 |
| පෙබරවාරි | 89 | 54,625.00 | 6,555.00 | 5,462.50 | 66,642.50 |
| මාර්තු | 132 | 81,650.00 | 9,798.00 | 8,130.00 | 99,578.00 |
| අප්‍රේල් | 51 | 31,050.00 | 3,726.00 | 3,105.00 | 37,881.00 |
| මැයි | 111 | 67,275.00 | 8,073.00 | 6,727.50 | 82,075.50 |
| ජුනි | 86 | 47,725.00 | 5,727.00 | 4,772.50 | 58,224.50 |
| ජුලි | 77 | 43,125.00 | 5,175.00 | 4,312.50 | 52,612.50 |
| අගෝස්තු | 92 | 55,775.00 | 6,693.00 | 5,577.50 | 68,045.50 |
| සැප්තැම්බර් | 90 | 57,500.00 | 6,900.00 | 5,255.00 | 69,655.00 |
| ඔක්තෝබර් | 83 | 52,325.00 | 6,279.00 | 5,232.50 | 63,836.50 |
| නොවැම්බර් | 70 | 43,125.00 | 5,175.00 | 4,127.50 | 52,427.50 |
| දෙසැම්බර් | 44 | 29,325.00 | 3,519.00 | 2,932.50 | 35,776.50 |
| **එකතුව** | **1,022** | **622,725.00** | **74,727.00** | **61,557.50** | **759,009.50** |